සැඟවුණු බොදු මග යළි පුබුදන

# හෙළ බොදු පියුම

ශ්‍රී බු. ව. 2556 ක් වූ නිකිණි මස (ව්‍යවහාරික වර්ෂ 2012 අගෝස්තු)

දහවන කලාපය
දෙවන සංස්කරණය
2020 වප් මස



## මිනිස් ඇසට නොපෙනී බිත්තරය තුළ සැඟව ගිය ජීවය

රු. 25/-

සැඟව ගිය බොදු මග යළි රැගෙන සැම පුන් පොහෝ දිනකම එළිදකින දහම් සංග්‍රහය



# පිරිය බව සිඳා පිරිසිඳ දැකීම

මැසි මදුරුවන් පලවා හැර හෙළුව වසා
සිසිලස උණුසුමද සමනය කරන ලෙසා
නිසි ලෙස සකස් කළ ඇඳුමට වැඩිය මසා
රිසි සේ නොමැති කය හැඩ වැඩ කෙරුම දොසා

ටොපියට වඩා ටොපි කොළයට රැවටීම
හිටියට වැඩිය තරුණව ඇඟ සැරසීම
හැටියට තමන් තරමට වැඩි හැඩ වීම
පිටියට වන් මහල්ලෙකු මෙනි පැරදීම

සිව් සැට මායම්ද ලොව ඇති නෙක බහුරූ
සව් සත මුලා කර වන හැඩ වැඩ නුහුරූ
පව් විඳවන කයකි නිති තුන් දොස ඇහුරූ
ගෙව් කය තබා ගත්තේ රිසි ලෙස කවුරූ

සුන්නත් වෙලා යන කයකට සිය ගානේ
ඇන්දත් වටින සළු පිළි හරයක නෑනේ
හින්දත් මුදල් පෙන්වන්නට පුහු මානේ
දුන්නත් වටී බලු කපුටන් හට දානේ


කුස ගින්නට නැතත් එක බත් ඇටයක් වත්
එස වෙන්නට බලයි හැඩයෙන් අඟලක් වත්
දොස එන්නට කලින් බුදු බණ පදයක් වත්
අසමින් සිට මළත් එයි මතු නිවනක් වත්

ගල් මුල් මිසක මල් නොඑවන ලොවෙහි මනූ
වල් වැඩවලට ඇත දහසක් පියලි තැනූ
කල් පවතිනා කිසිවක් ලොව නොමැත දිනූ
බොල් වැඩ බොල්ම වෙයි දැන ගෙන අතැර ලනූ

මේ සිත අනත භව සිට රැවටුව බෝම
මාවත හඳුන ගති හිම් බුදු වුන දාම
ලෝ සත හොඳයි පිරියයි කියවන දේම
සාදත දුකයි වෙහෙසයි රිසි නැති සේම

හරිය කියන දේ ලෝ සත නිවන නොවේ
බැරිය ලෝ සැපෙන් ජය ගනු සැණෙක ගෙවේ
පිරිය බව සිඳා පිරිසිඳ දැකුම ලොවේ
අරිය මග වැඩේ ගිනි සදහටම නිවේ

පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන



# බුදු පියාණන් වහන්සේ දේශනා කළ නිරුක්ති ක්‍රමවේදයට මොකද වුණේ?

මේ කාලයේ නිරුක්ති ගැන කතා කරන කොට, ත්‍රිවේද පරප්‍රාප්ත බ්‍රාහ්මණ වේද ආභාෂයෙන් කලින් කල නිර්මාණය කරල හෙළි කරල දීල තියෙන පාළි සංස්කෘත ලිඛිත භාෂා ක්‍රමවේදවලට ඇතුලත් පද බෙදීමේ ව්‍යාකරණ රීති මාලාව, බුද්ධ භාසිත නිරුක්ති ක්‍රමවේදය විදිහට හුවා දක්වන්න, පාළි සංස්කෘත භාෂා උගත් ඇතැම් පින්වත් යතිවරයන් වහන්සේලා ප්‍රයත්න දරන ආකාරය විවිධ රූපවාහිනී පුවත්පත් මාධ්‍ය විමසන කොට හොඳින් පෙනී යන කාරණයක්. නමුත් ඒ ලෞකික වූ පෘථජ්ජන වූ භාෂා විශාරදයින් නිරුක්ති කියන නම සම්බන්ධ කරගෙන හුවා දක්වන පද බෙදීමේ භාෂා ව්‍යාකරණ ක්‍රමවේදය, බුදු පියාණන් වහන්සේ දේශනා කළ නිරුක්ති ක්‍රමවේදයේ අහලකටවත් ළං කරන්න බැරි ඔවුන්ටම ආවේණික ක්‍රමවේදයක්. ඒ වගේම බුදු පියාණන් වහන්සේ දේශනා කළ නිරුක්ති ක්‍රමවේදය හෑල්ලුවට ලක් කරමින්, ඒවාට උමතු ප්‍රාකෘත කියන මතයක් ගොඩනගන්න කාලයක පටන් ප්‍රයත්න දරන ආකාරයත් රහසක් නෙවෙයි.

මේ ලෞකික වේද ධාරීන්ගේ නිරුක්ති අතර භාවිතයට අරගෙන තිබුන, අනාදියේ පටන් පැවත එන, ඔවුන්ගේ නිර්මාණයකුත් නොවන, නමුත් ඔවුනුත් භාවිතා කළ නිරුක්ති ක්‍රම තුනක් විතරක් බුදු පියාණන් වහන්සේ අනුමත කරල තියෙනවා (සංයුක්ත නිකාය 3 - 122 පිටුව - නිරුක්තිපථ සූත්‍රය). ඒ අනුව අතීත, වර්තමාන, අනාගත කියන තුන් කාලය හඟවන නිරුක්තිය අනුමත කරල තියෙනවා. ඒ කියන්නෙ, **අතීතයේ සිදුවීමක් නම් "විය" කියලත්, වර්තමානයේ සිදුවීමක් නම් "වෙයි" කියලත්, මතු අනාගතයේ සිදුවන්නක් නම් "වන්නේය" කියලත් ප්‍රකාශ කළ යුතුයි.**

ලිඛිත භාෂා නිරුක්ති හෙවත් ව්‍යාකරණ ක්‍රමවේදය අනුව උක්තය නැති වාක්‍යයක අර්ථ සම්පූර්ණ වෙන්නෙ නෑ. නමුත් බුද්ධ ශ්‍රාවක පැවිදි උත්තමයන් අද වෙන තුරු පැවිදි සාසනයට ඇතුලත් වෙන්නෙත්, ඒ සම්මතය පවත්වාගෙන එන්නෙත්, උක්තයක් නොකියවෙන "බුද්ධං සරණං ගච්ඡාමි - ධම්මං සරණං ගච්ඡාමි - සංඝං සරණං ගච්ඡාමි" කියන මේ වාක්‍ය තුනෙන් සහ එබඳුම උක්තයක් නොකියවෙන දස සික්ෂා සමාදානයකින්. **මුළු ත්‍රිපිටකයම විමර්ශනය කළත්, නවීන භාෂා විශාරදයින් අද පෙන්වන වර්ගයේ ක්‍රමයකින් දේශනා කළ නිරුක්තියක් පෙන්වන්න සාක්ෂියක් නෑ. නමුත් ව්‍යවහාර ශබ්දය සමග අර්ථ පෙන්වන ඤාණ ගෝචර නිරුක්ති ක්‍රමවේදය පෙන්වන්න ඒ සඳහාම මුල් කළ සූත්‍රයක් ත්‍රිපිටක ධර්මය තුළ තියෙනවා.** ඒ තමයි දීඝ නිකායේ 3 වන කාණ්ඩයේ 157 පිටුවේ එන අග්ගඤ්ඤ සූත්‍රය. මේ සූත්‍රයෙන් බුද්ධ භාසිත නිරුක්ති හැදිල තියෙන හැටි මනාව විග්‍රහ වෙනවා. **අදහස් දෙකක් එකතුවෙන විදිහට අකුරු බැඳිල පද හැදෙන බවට නිදසුන් මේ සූත්‍රයේ සඳහන් වෙනවා.** ඒවායින් කිහිපයක් මේ විදිහට කෙටියෙන් දක්වන්න පුළුවන්.

"මහාජන සම්මතෝති බෝ වාසෙට්ඨා මහා සම්මතෝ මහා සම්මතෝ ත්වේව පඨමං අක්ඛරං උපනිබ්බත්තං..." වාසෙට්ඨයනි, **මහ ජනයා විසින් සම්මත හෙයින් ඔහුට මහා සම්මත යැයි පළමු නම් වහර ඇති විය.**

"ඛෙත්තානං අධිපතීති බෝ වාසෙට්ඨා ඛත්තියෝ..." වාසෙට්ඨයනි, **කෙතට (යම් කිසි ප්‍රදේශයකට) අධිපති හෙයින් ක්ෂත්‍රිය යැයි දෙවන නම් වහර ඇති විය.**

"ධම්මේන පරේ රඤ්ජේතීති බෝ වාසෙට්ඨා රාජා..." වාසෙට්ඨයිනි, **දැහැමින් ජනයා රඳවානුයි (සුවපත් කෙරේනුයි, පිනවානුයි) කරන හෙයින් රජ යන තෙවන නම් වහර ඇති විය.** (රඤ්ජේතීති යන්නට සිංහල අරුත ලෙස දී ඇති රඳවානුයි යන්න, රංජනය කෙරේනුයි කියා යෙදී නම් අර්ථය වඩාත් පැහැදිලි බව පෙනේ).

"පාපකේ අකුසලේ ධම්මේ බාහෙන්තීති බෝ වාසෙට්ඨා බ්‍රාහ්මණා..." වාසෙට්ඨයිනි, ළාමක වූ අකුසල ධර්මයන් බැහැර ලන්නේ යැයි යන හෙයින් බ්‍රාහ්මණ යන පළමු නම් වහර ඇති විය.

මේ විදිහටම, **ධ්‍යාන කරන නිසා ධ්‍යායී හෙවත් ධ්‍යායකයෝ යන දෙවන නම් වහර ඇති වුන බවත්, දැන් මොවුහු ධ්‍යාන නොකරන නිසා අධ්‍යායී හෙවත් අධ්‍යායකයෝ යන තෙවන නම් වහර ඇති වුන බවත්, මෛථුන ධර්ම ගෙන සේවනය කරමින් ඒ ඒ අවස්ථාවේ කර්මාන්ත කළ නිසා වෛශ්‍යයෝ යන නම් වහර ඇති වුන බවත්, ක්ෂුද්‍ර වූ චර්යා ඇති නිසා ක්ෂුද්‍රයෝ යන නම් වහර ඇති වුන බවත්, ක්ෂත්‍රිය - බ්‍රාහ්මණ - වෛශ්‍ය - ක්ෂුද්‍ර යන සිව් පිරිස තම තමන්ගෙ ධර්මවලට හෙවත් සක ධර්මවලට ගර්හමාන කරමින් පහකර දැමීම නිසා "සමණ" යන නම් වහරත් ගිහි ගෙයි අත්හැරල පැවිදි වුන අයට හැඳුන බවත් පැහැදිලිව සඳහන් කරල තියෙනවා.**

දස අකුසලය හෙවත් කෙලෙස් භජනය කිරීම පහකර දමන නිසා පබ්බජිත වෙන හැටිත් මේ විදිහට තේරුම් ගන්න පුළුවන්.

මෙබඳු නම් පුරාණයේ අග්‍ර ගණ්‍ය අක්ෂර බැඳීමෙන් නිපදවුන බවත්, සත්වයින්ට හේතු සහිතවම සමානත්වයෙන්ම, අධර්මයෙන් නෙවෙයි ධර්මානුකූලවම ඒ නම් යෙදිල තියෙන බවත්, මෙලොවත් පරලොවත් ධර්මයම ප්‍රධාන වෙන ආකාරයත් අග්ගඤ්ඤ සූත්‍රයේ මනාව පෙන්වා තියෙනවා.

ධ්‍යාන කරපු අය නුවණින් **අවබෝධයෙන් ලත් දැනීම, ධ්‍යාන නොකරපු අධ්‍යායී අයට ලබා දුන්න නිසා, එහෙම නැත්නම් අපනයනය කරපු නිසා "අධ්‍යාපනය" කියන වචනය හැදිල තියෙන හැටි මේ අනුව පෙනී යනවා. ඒ නිසා අධ්‍යාපනය ලබපු කෙනාට තියෙන්නෙ අනුන්ගෙන් අහගෙන ඉගෙන ගත්ත දේට සීමා වුන මානසිකත්වයක්. ඉගෙනීම අභිබවා ගිහින් අවබෝධයට පත්වෙන්නෙ ධ්‍යායී හෙවත් ධ්‍යාන කරපු කෙනා.** තමන්ගෙ ශ්‍රාවකයන්ට ප්‍රථම ධ්‍යානයටවත් පත්වෙන්න දහම් දෙසන්න බැරි අය ධර්ම දේශනා කරන්න යෑමෙන් අපවාද ලබන්න සුදුස්සන් වෙන බව දීඝ නිකාය (1) 549 පිටුවේ පටන් එන <u>ලෝහිච්ච සූත්‍රයේ</u> පෙන්වල තියෙනවා. **එබඳු චෝදනා ලබන්න සුදුසු සාස්තෘවරු තුන් දෙනෙක් ඉන්න බවත් ඒ සූත්‍රයේ** පෙන්වල තියෙනවා.

ඒ තමයි, ශ්‍රමණාර්ථයක්, ශ්‍රමණ ඵලයක් (ධ්‍යාන සහ මාර්ග ඵල පිළිබඳව) නැති කෙනෙක්, මෙය තොපට වැඩ පිණිස වේ, මෙය තොපට සුව පිණිස වේ කියල දහම් දෙසන කොට, පිරිස අහන්න රිසි නොවී, තමන්වත් අවබෝධයක් ලබන්නෙ නැතිව අන්‍යයන්ට මොන යහපතක් කරන්නද කියල ඉවතට යන කොට, ඒ අයට දේශනා කරන්න උත්සාහ කිරීම නිසා පිරිසගෙන් චෝදනා ලබන්න සිද්ධ වෙනවා. ඒ චෝදනාව ඇත්තයි, සත්‍යයි, දැහැමියි, නිවැරදියි. ඉවතට යන ශ්‍රාවක පිරිස ඒ සාස්තෘට චෝදනා කරන්නෙ මෙහෙමයි. ඉවත්ව යන්නියක් ළඟට යනවද, නොකැමැත්තෙන් පිටුපා ඉන්න තැනැත්තිය වැළඳ ගන්නවද, එබඳු ලෝභී ඉච්ඡාවෙන් මැඩුනු (ආසාව නමැති මඩට ගෝචර වූ) සාස්තෘවරයෙක් කියල ඒ දේශකයා මේ විදිහට පළමු නින්දා ලැබිය යුත්තා වෙනවා.

දෙවැනි නින්දා ලැබිය යුතු සාස්තෘ ගැන දැක්වෙන්නෙ මෙහෙමයි. ඉහත ආකාරයටම ශ්‍රමණ ඵලයක් ලැබුවෙ නැති භික්ෂුවක් (දේශකයෙක්) දහම් දෙසන්න යන කොට, පිරිස කැමැත්තෙන් අහනවා, කන් යොමු කරනවා. නමුත් තමන්ගෙ කෙත (කුඹුර) අත්හැරල අනුන්ගෙ කෙතක වල් පැල උදුරල සුද්ධ කරන්න යන කෙනෙක් වගේ, ලෝභ ධර්මයෙන් යුක්ත කෙනෙක් කියල, එබඳු සාස්තෘ කෙනෙක් අනෙක් කෙනෙකුට කවර වැඩක් කරන්නද කියල නින්දා ලබන්න සුදුසුයි.

තුන්වැන්නා තමයි, ශ්‍රමණාර්ථයක් (ආර්ය ධ්‍යානයක්, මග ඵලයක්) ලබපු කෙනෙක්, මෙය තොපට වැඩ පිණිසයි හිත පිණිසයි කියල දහම් දෙසනවද, පිරිස අහන්න කැමති නැත්නම්, අනුසාසනාවෙන් බැහැරව පවතිනවනම්, එබඳු අයට දෙසීමත් ළාමක ලෝභ ධර්මයක්. ඒ සාස්තෘගේ ක්‍රියාව පරණ බැඳීමක් බිඳ හැරල අලුත් බැඳීමක් ඇති කරගන්න කෙනෙක් වගේ (පෙර තිබුණ ගිහි බැඳීම් බිඳ හැරල මහණ වෙලා නැවතත් එවැනි බැඳීමක් ඇති කරගන්නවා වගේ) කියල අපවාද ලබන්න සුදුස්සෙක් වෙනවා.

එතකොට දේසනාවට සුදුසු **සාස්තෘවරු විදිහට පෙන්වල තියෙන්නෙ, ශ්‍රාවකයාට ප්‍රථම ධ්‍යානයේ පටන් චතුර්ථ ධ්‍යානයට වගේම, ආශ්‍රව ක්‍ෂය කරල අරිහත්වයට පත්වෙන කල් ප්‍රතිඵල ලබාදෙන්න දහම් දෙසන්න පුළුවන් සාස්තෘවරු.**

මෙච්චර පැහැදිලි ඤාණ ගෝචර ධර්මයක් තියෙද්දිත්, දහම් ඉගෙන ගත්තට, "අපි තවම පෘථජ්ජනයි" කියල කිසිම ලජ්ජාවක් බයක් නැතිව කියනවනම්, ඔරංඔටං දකින කල් ඔරංඔටං කියල ආමන්ත්‍රණය කළාට (ඔච්චමකින් කතා කළාට) කිසිම ගාණක් නැතිව "ඇයි" කියල පිලිතුරු දුන්න පාසල් ශිෂ්‍යයා වගෙයි, පෘථජ්ජනයාගේ ස්වභාවය පෙන්වපු බුදු වදන දකින කල් ශ්‍රමණ වෙසකුත් දරා ගෙන "අපි තවම පෘථජ්ජනයි" කිය කියා ඉඳීම කොච්චර නින්දිතද, සංවේග කටයුතුද කියල හිතනව නම්, සද්ධර්මය අතුරුදන් නොවීමටත් ධර්මාභිවෘද්ධියටත් හේතුවෙන කාරණයක් වෙනවා.

මේ පෙන්නුවේ උපමාවක්. පාසැල් ළමයෙකුට තවත් ළමයෙක් ඔරංඔටං කියල ආමන්ත්‍රණය කළාලු. කිසි වෙනසක් නැතිව ඒ ළමයත් "ඇයි" කියල ඇහුවලු. දවසක් සත්තු වත්ත බලන්න ගිය වෙලාවක මේ ළමයි කූඩුවක ඉන්න ඔරංඔටං දැක්කලු. ඒත් එක්කම, ඔරංඔටං කියනකොට අර "ඇයි" කියපු ළමයා දුවගෙන ගිහින් එහෙම ආමන්ත්‍රණය කරපු ළමයට ගහගෙන ගහගෙන ගියාලු. කාරණය හොයල බලපු ඒ පන්තිභාර ගුරුවරයට ඒ ළමයා කියල තියෙන්නෙ, ඉස්කෝලෙදි මූ මට ඔරංඔටං කිව්වා, අද තමයි මම ඔරංඔටං දැක්කෙ කියල. "පෘථජ්ජන අපි" කියල කියන උගතුන්, පෘථජ්ජනයා කියන්නෙ කවුද කියල දැනගත්ත දවසටත් මෙහෙම දෙයක් වෙන්න පුළුවන්.

නිරුක්ති පිළිබඳව බුද්ධ දේශනාව පෙන්වන අග්ගඤ්ඤ සූත්‍රයේ ඉහත ආකාරයට මහා සම්මත, රජ, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ක්‍ෂුද්‍ර... ආදී නම් හැදුණ හැටි පෙන්වල තියෙනවා. මේ විදිහට මේ කරුණු පෙන්වන්නෙ, භාෂා ව්‍යාකරණ... ආදී සාස්ත්‍ර පහත් කරල සලකන්න නෙවෙයි. කවුරුහරි ලිඛිත භාෂා සාස්ත්‍රය ක්‍රමානුකූලව ව්‍යාකරණ රටා ආදිය සම්මත කරගෙන පවත්වා ගෙන ඒම නිසා ත්‍රිපිටක ධර්ම ග්‍රන්ථවලින් උතුම් ධර්මාවබෝධයකටත්, දහම් අධ්‍යාපනයකටත් මග සැලසිලා තියෙනවා. ඒ නිසා අවුරුදු 2500 කටත් වැඩි කාලයක් තිබුණ බුදු දහම පිළිබඳව හරවත් දේ දැන ගන්න ක්‍රමවේදයක් සකස් වෙලා තිබීම බොදුනු හැමගෙම වාසනාවට කාරණයක්. ඒ ඉගෙනීම දරාගෙන ග්‍රන්ථ පවත්වාගෙන ඒමත් මිල කරන්න බැරි සේවයක්, අප්‍රමාණ පිනක්. නමුත් මේ පෙන්වල දෙන්නෙ, බුද්ධ **නිරුක්ති කියන්නෙ භාෂා ව්‍යාකරණ නිරුක්ති නොවන බව.**

**ඒ ඒ ජනපදවල මිනිස්සු කතා කරන්නෙ, නීත්‍යානුකූල ලිඛිත භාෂා හෝ ව්‍යාකරණ සම්ප්‍රදායකට අනුව හෝ නොවන බව අවිවාදයෙන් පිලිගත යුතු කාරණයක්.** මජ්ජිම නිකාය (3) 491 පිටුවේ එන <u>අරණ විභංග සූත්‍රයේ</u>, ජනපද නිරුක්තිවලට උදාහරණ පෙන්වමින්, බඳුන හඳුන්වන්න ඒ ඒ ජනපදවල පාතී, පත්ත, විත්ථ, සරාව, ධාරෝප, පොණ, පිසීලව... ආදී විවිධ නම් භාවිතා කරන බවත්, **ඒවායේ වචන දැඩිව ග්‍රහණය කරගෙන, මේකම සත්‍යයි, අනික්වා අසත්‍යයි කියල තර්ක වාද කරන්නෙ නැතිව, ජනපද ව්‍යවහාරය අනුව අදහස් ප්‍රකාශ කරල ධර්ම දේශනා කරන්න කියලත්** පැහැදිලිව පෙන්වල තියෙනවා.

මේ නිසා දහම් දේශනා කරන කොට අදහසට මුල් තැන දීම ඉතා වටින බව හැ‍ඟෙනවා. **ඒ ඒ ජනපද නිරුක්ති අනුව යමෙක් තමන්ගෙ අදහස හඟවන්න කතා කරන භාෂාවෙන් පොත්පත් ලියුවත්, ඒවා විද්වත් සාස්ත්‍රීය පොත්පත් එක්ක සංසන්දනය කරන්න හෝ විවේචනය කරන්න හෝ යන්නෙ නැතිව, වෙනස විතරක් වටහාගෙන කටයුතු කරන ක්‍රමවේදයක් තිබුණ නම් (අරණ විභංග සූත්‍රයට අනුකූලව), භේද භින්න වීමක් සිද්ධ නොවී සාමයෙන් සමගියෙන් නියම අදහස් දරන්න පුළුවන්.** එහෙම නොකළොත්, බුදු පියාණන් වහන්සේ පෙන්වා දුන්න නිරුක්ති ක්‍රමයත්, භාෂා රීති ක්‍රමය අනුව උමතු ප්‍රාකෘත කියල කියන්න සිද්ධ වෙයි. මහා සම්මත, රජ, බ්‍රාහ්මණ, ක්‍ෂත්‍රිය, සමණ... මේ ආදී පදවලට භාෂා නිරුක්ති අනුව පද බෙදල පෙන්වන්න අභියෝග

කරල කිව්වත්, මේ වචන හැදිච්ච අදහස කොහොම කියන්නද?

පෙර හෙළ අටුවා ලියල තිබුණෙ ජනපද නිරුක්ති ක්‍රමවේදයට අනුව. ඒ නිසාම අද ඒවා විද්වත් ව්‍යාකරණ, භාෂා රීතිවලට ගළපල අර්ථ ගන්න උත්සාහ කරන්න ගිහින්, අක්ෂර පද වගේම වාක්‍යත් ගළපල නවීකරණය කරන්න යාම නිසා දහම් අදහස් ඔප් නංවල තිබුණ අර්ථයන් විපරීත වෙන්නත් බැරිකමක් නෑ. ඒ වගේම ඒ හේතුවෙන් හෙළ අටුවා පත් ඉරුවක්වත් අද දකින්න නැති විදිහට විනාස වෙලා හෝ සැඟවිලා ගියා හෝ වෙන්න පුළුවන්.

පටිච්ච කියන වචනය සිංහලට තෝරන සමහර විද්වතුන් ඒකට අර්ථ දෙන්නෙ ප්‍රතීත්‍ය කියල. සිංහල අදහස වැහිල ගිය නිසා ප්‍රතීත්‍ය කියන සංස්කෘත වචනයක් දීල පොට බේරගත්තට ඒකෙන් සිද්ධ වුනේ අදහස තවත් දුරස් වීම විතරයි. යටපත් වෙලා ගිය පද නිරුක්ති ක්‍රමය නැවත මතු කරල මේ කාරණය තෝරල දෙන්න ගියාම, විකෘති කරල පෙන්වපු පද පෙරලියකින් අපහාසයට ලක්කරල, "පටි කියන්නෙ ඉනේ බඳින පටි (Belt), ඉච්ඡ කියන්නෙ කැමැත්ත, සම කියන්නෙ හම..." ආදී මැත කාලීන පොතක ලියල නැති වචනත් පෙන්වල ඇතැම් පුවත්පත්වල ලිපිත් පළ කරල තිබුණා. නමුත් කරුණු කාරණා විමසන්නෙ නැතිව, කවුරුහරි කියපු දෙයක් විශ්වාස කරල සකස් කරල පළ කරන මේ වගේ ලිපිවලින් අවසානයේ අපහාසය එල්ල වෙන්නෙ ලොව්තුරා බුදු පියාණන් වහන්සේට බව තේරුම් ගන්න බැරි වීම ඉතා බරපතලයි. "පටිච්ච සමුප්පාදය" කියන වචනයේ සිංහල තේරුම අහනකොට "ප්‍රතීත්‍ය සමුප්පාදය" කියල සංස්කෘත වචනයක් කියන ආකාරයත් පෙනී යනවා. නමුත් "පිළි සමුපා" කියන වචනය තමයි මේකෙ නියම සිංහල වචනය.

බුදු දහම වටහා ගැනීමේ මූල ක්‍රමවේදය උපමා උපමේය ගළපල දහම් අර්ථ වටහා ගන්න ක්‍රමයක් වුණත් අද ඒ ක්‍රමය වැහිල ගිහින්. මජ්ජිම නිකාය (2) 298 පිටුවේ එන මාගන්දි සූත්‍රයේ "ආරෝග්‍යා පරමා ලාභා" කියල ගාථාවක් තියෙනවා. භාෂා රීතිය අනුව මේකෙ අදහස "ලාභයෝ ආරෝග්‍යය පරම කොට ඇත" කියන එකයි. ත්‍රිවේද පරප්‍රාප්ත මාගන්ධිය බමුණා භාෂා රීතිය අනුව මේක තෝරල, තමන්ගෙ කය සාක්ෂි කරල පෙන්වමින් තමන් නිරෝගී බවත්, ඒක ලාභයක් බව කොතෙක් දුරට සත්‍යද කියල සතුටින් ප්‍රකාශ කරපු ආකාරයත් ඒ සූත්‍රයේ සඳහන් වෙනවා. නමුත් ඒකෙ නියම අදහස අනුව, බමුණගෙ කතාව අන්ධයෙක්ගෙ වගේම මුලා වෙච්ච කෙනෙක්ගෙ කතාවකින් පිරිසිදු දෙයක් විග්‍රහ කරන්න යාමක් වගේ කියල පෙන්වල තියෙනවා.

ඒ කියන්නෙ, අන්ධ පුද්ගලයෙකුට ඔහුගෙ හිතවතෙක් විදිහට පෙනී ඉන්න කෙනෙක්, කළු ගොමස්කඩ කිළිටි ඇඳුමක් දීල, මේක පිරිසිදු ලස්සන අළුත් ඇඳුමක් කියල ඇඳගන්න සැලැස්සුවොත්, ඒ කීම විශ්වාස කරල, මුලා බවින් යුක්ත ඒ අන්ධ පුද්ගලයට ඇත්ත පේන්නෙ නැති නිසා, මේ ඇඳුම හරි පිරිසිදුයි ලස්සනයි කියල පිරිමදිනවා වගේ කාරණයක් කියල උපමා පෙන්වල තියෙනවා. වෛද්‍යවරු බෙහෙත් කරල ඒ අන්ධ පුද්ගලයගෙ ඇස් පේන්න සැලැස්සුවොත්, එතකොට තමයි ඔහුට තමන් රැවටිලා ඉන්න ආකාරය පෙනී යන්නෙ. මේක අළුත් පිරිසිදු ඇඳුමක් නෙවෙයි, කළු ගොමස්කඩ කිළිටි රෙද්දක් කියල දකිනකොට, හිතවත් කියල ඇඳුම දුන්න කෙනාත් තමන්ව රවටපු වංචනිකයෙක් බව දැකල, ඇඳුමත් ඔහු කෙරෙහි තිබිච්ච බැඳීමත් දුරු වෙනවා. එතකොට තමයි ඔහුට නියම පිරිසිදුකම, සුදු පාට පේන්නෙ. ඒ වගේ තමයි, ඇහැට පෙනෙන පිරිසිදු දෙයක් විග්‍රහ කරන්න පුළුවන් වෙන්නෙ ඇස් පෙනීම තිබුනොත් විතරයි කියල පෙන්වල, ඒ ගාථා පාඨයේ නියම අදහස විදිහට පෙන්වල තියෙන්නෙ, මේ කයේ නිරෝගිකමක් ගැන නෙවෙයි, කය රෝගයක් විදිහට දැකල නිවන ආරෝග්‍යය විදිහට දැකීම කියලත් පෙන්වල තියෙනවා.

**වචන තුළ ගැබ්වුණ දහම් අදහස් වටහා ගැනීම භාෂා රීති අනුව කරන්න බැරි දෙයක් බව** මේ කාරණයෙන් පෙනී යනවා. ඒ සඳහා දහම් අවබෝධය කියන විශේෂ නුවණක් තිබිය යුතුයි. **කාමය කියන්නෙ මඩක්, උලක් කියල කිව්වොත්, ඒක ඔප්පු කරන්නෙ මොන භාෂා රීතියෙන්ද?** නමුත් කාමය හඳුන්වා දෙන බුදු පියාණන් වහන්සේ, **මඩ යනු කාමයට නමකි, උල යනු කාමයට නමකි, භය යනු කාමයට නමකි, දුක යනු කාමයට නමකි** කියල දේශනා කරල තියෙනවා. නමුත් ඒවා විස්තර කරන්න මේ වගේ එක ලිපියකින් බෑ. ඒ තරම්ම පුළුල් පරාසයකට ඒ විග්‍රහයන් විහිදෙනවා.

මේ නිසා "පටි" කියන්නෙ ඉනේ බඳින පටි (Belt) කියල විහිලු නොකර, ඉච්ඡත්වයෙන් (කැමැත්තෙන්) බැඳුනම, සමුප්පාදය (ඊට සමාන උපත) හෙවත් ලෝකය පහල වෙන ආකාරය පටිච්ච සමුප්පාද චක්‍රානුසාරයෙන් සිද්ධවෙන හැටි දැක්ක නම්, දුක සහ දුක්ඛ සමුදය දකින නුවණ පහළ වෙන හැටි තේරුම් ගන්න පුළුවන්. ඉච්ඡාවෙන් බැඳීමෙන් හෙවත් පටි ඉච්ඡ වීමෙන් ලෝකය ගොඩනැගෙන හැටිත්, ඒ බැඳීමේ ස්වභාවය බුද්ධ දේශනාවේ පෙන්වල තියෙන හැටිත් මේ පෙළ දහමේ ගාථාවලින් මනාව ඔප්පු වෙනවා.

සංයුක්ත නිකාය (1) 76 පිටුව - ඉච්ඡා සූත්‍රය

ඉච්ඡාය බජ්ජති ලෝකෝ
ඉච්ඡා විනයාය මුච්චති
ඉච්ඡාය විප්පහාණේන
සබ්බං ඡින්දති බන්ධනන්ති

තේරුම - ලොව ඉච්ඡායෙන් බැඳේ. ඉච්ඡාව දුරලීමෙන් සිඳේ. ඉච්ඡාව ප්‍රහාණය කිරීමෙන් සියලු බැඳීම් සිඳේ.

සංයුක්ත නිකාය (1) 82 පිටුව - පාථෙය්‍ය සූත්‍රය

ඉච්ඡා බද්ධා පුථු සත්තා
පාසේන සකුණී යථාති

තේරුම - මළ පුඩුවෙන් බැඳුණු ලිහිණියක මෙන් බොහෝ සත්වයෝ ඉච්ඡාවෙන් බැඳුණෝය.

ඛුද්දක නිකාය - සූත්‍ර නිපාතය - 276 පිටුව - කලහ විවාද සූත්‍රය - 876 ගාථාව

නාමඤ්ච රූපඤ්ච පටිච්ච ඵස්සෝ
ඉච්ඡා නිදානානි පරිග්ගහානි
ඉච්ඡාය සන්ත්‍යා න මමත්ත මත්ථි
රූපේ විභූතේ න ඵුසන්ති ඵස්සා

තේරුම - සම්ප්‍රයුක්ත නාමය (ඒ සමග යෙදෙන්නා වූ නාමය) හා වස්ත්වාලම්භන රූපය (වස්තු රූපය) නිසා ස්පර්ශයෝ උපදනාහ. තෘෂ්ණා දෘෂ්ඨී පරිග්‍රහයෝ (අල්ලා ගැනීම) ඉච්ඡාව නිධාන කොට ඇත්තාහ. ඉච්ඡාව නැතිවත්ම මමත්වය නැත. රූපය ඉක්ම යත්ම ස්පර්ශයෝ නොපහස්නාහ (පහස නෑ).

ඉහත බුද්ධ දේශනාවලින් පෙන්නුවේ ඉච්ඡා පටිවල ස්වභාවය. මේවා ඉනේ බඳින පටි නෙවෙයි.

නිරුක්ති පටිසම්භිදාව කියන්නෙ ඤාණයක්. භාෂා විශාරද පින්වතුන්ගෙ ව්‍යාකරණ පද ප්‍රභේද විධිවලට නිරුක්ති කියන වචනය භාවිතා කළත්, ඒක භාෂාවට අයිති සකස් කරගත්ත පදයක් මිසක් බුද්ධ දේශිත නිරුක්ති අර්ථය නෙවෙයි. ධර්මයේ මේ කාරණය සඳහන් වෙන්නෙ "අත්ථ ධම්ම නිරුත්තාභිලාපේ ඤාණං නිරුක්ති පටිසම්භිදා" කියල. ඒ අර්ථයෙත් ධර්මයෙත් වූ ස්වභාව නිරුක්ති වචනයේ ප්‍රභේදගත

ඤාණය නිරුක්ති පටිසම්භිදාවයි කියන එකයි ඉහත පාඨයේ අර්ථය. උදාහරණ :- ස්වභාවික නිරුක්ති වචනය - මහා සම්මත. ප්‍රභේදගත ඤාණය හෙවත් මේ වචනය හැදිල තියෙන අර්ථයන් බිඳල පෙන්වා දීම - මහ ජනයා විසින් සම්මත කරන හෙයින් මහා සම්මත නම් වේ. **මේ නිරුක්ති දකින්නෙ වචනවල ශබ්ද බෙදල බලන ස්වභාවික ක්‍රමවේදයකින් මිසක් භාෂා විශාරදයින් විසින් සම්මත කරල හදා ගත්ත පද රටා අනුව නොවන** බව විභංගප්පකරණයේ සහ පටිසම්භිදා මග්ගප්පකරණයේ සංඥාපන බැලීමෙන් තේරුම් ගන්න පුළුවන්.

මේ අනුව තමන්ගෙ හිතු මනාපෙට පද බෙදමින් නිරුක්ති දෙන්න බැරි බවත්, ඒක නොගැළපෙන බවත් තේරුම් ගන්න ඕන. ජනතාව රංජනය කරන නිසා "රජ" කියන වචනය හැදෙන බුද්ධ නිරුක්තියට, ජනතාව රවටන නිසා රජ කියල කියන්න බැරි බවත් මේ විදිහට තේරුම් ගන්න ඕන. අවිජ්ජා ප්‍රත්‍යයෙන් නැගෙන පටිච්ච සමුප්පාදයේ අපුණ්‍යාභි සංඛාර මුල් කරගෙන නැගෙන සතර අපාගත සත්ව සහ ද්‍රව්‍ය නාම පද අධර්ම මුල් කර ගෙනත්, මිච්ඡා දිට්ඨි, මිච්ඡා සංකප්ප... ආදී වශයෙන් නැගෙන දේ අනර්ථ මුල් කරගෙනත් හැදෙන නිසා "බළලා" කියන තිරිසන් සතා හැදෙන පදය නිර්මාණය වෙන හැටි ඊට අනුකූලව, අසාධාරණ විදිහට අයුතු විදිහට බලය අළලා කරන වැඩවලින් ලබන හේතු ඵලයක් විදිහට දකින්න ඕන.

"අවිජ්ජා පච්චයා පුණ්‍යාභි සංඛාරා" කියල නැගෙන පටිච්ච සමුප්පාදයෙන් සහ ලෞකික වූ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප... ආදී මාර්ගයෙන් ලෞකික වූ අර්ථ, ධර්ම සහිතව සුගති නාම පද සහ ද්‍රව්‍ය නාම පද යෙදෙන ආකාරයත් දැන ගන්න ඕන. අර්ථයෙන් ධර්මයෙන් බලය පතුරවන වගේම, ඒ බලය අළලා නිවැරදිව කටයුතු කරන පින්වතුන් ඒ අනුව මහ බලවතුන් වන රාජ රාජ මහාමාත්‍යාදී බලධාරීන් විදිහටත්, බලවතුන් විදිහටත් ලෝකයේ හඳුන්වන බලධරයන් වෙලා සුගතිවල උපදිනව මිසක් බළලුන් නොවන බවත්, අත්ථ ධම්ම නිරුත්තාභිලාප ඤාණයෙන් දැනගෙන ශබ්ද නිරුක්ති බෙදල දැක්විය යුතුයි.

මේ අනුව "කිඹුලා" කියන වචනය හැදෙන නිරුක්තිය, කියන්න බැරි කුණුහරුපයක් නෙවෙයි, අනර්ථයත් අධර්මයත් කියන දෙකෙන් ගොඩ නැගුණ දෙයක් බව නුවණින් දැකල ශබ්ද බෙදල විග්‍රහ කළ යුතු නිරුක්තියක්.

කි+අඹු+උලා

කිලිටි+අඹුවන්ට+ඌ ආලය

කිලිටි අඹුවො කියන්නෙ වෙසඟනන්. ඔවුන්ට ආලය කිරීමට වූ ළයටයි උල හෙවත් උලා කිව්වෙ. මේක කාම මිථ්‍යාචාරයට අයිති කටයුත්තක්. "අවිජ්ජා පච්චයා සංඛාරා" කියන අධර්ම ජාති ගොඩනැගෙන ක්‍රමයට අනුව ගොඩනැගෙන මිච්ඡා දිට්ඨි, මිච්ඡා සංකප්ප... ආදී අට මගට අයිති වැඩපිළිවෙලක්. ඒකෙන් අනර්ථයමයි සිද්ධ වෙන්නෙ.

මේ හෙළ අටුවා ක්‍රමවේදයෙන් කිඹුල් ජාතිය ගොඩනැගෙන හැටි ප්‍රත්‍යක්ෂයෙන් නිරුක්ති ඤාණයෙන් දැකපු පැරණි නැණවත් බොදුනුවන්, නරියෙක් කිඹුලෙකුට මගුල් ජෝඩු කරන්න ගිහින් ඌව රවට්ටල එගොඩ ගොඩේ තිබුන කුණක් කාල දාපු කතාවක් ආදර්ශමත් කතාවක් විදිහට ගොඩනගල තියෙන ආකාරයත් සිහි කිරීම ඉතා යහපත්.

ඒ වගේම මජ්ඣිම නිකාය (2) 84 පිටුවේ එන කුක්කුරවතිය සූත්‍රයේ මේ විදිහට දක්වල තියෙනවා. "සේනිය (මිත්‍යා සිල් ව්‍රත ආරක්ෂා කරපු කෙනෙක්) නම් නුවටු බලු තවුස්, බලු සිල් (බලු සංඛාර), බලු සිත් (බලු විඤ්ඤාණ), බලු වෙස් (බලු නාම රූප), නිරතුරු කොට (නිරන්තරයෙන්) වඩා කාබුන් (කය බිඳී) මරණින් මතු සුනඛයන්ගේ සහවාසයට පැමිණේ. එහෙත් මේ දෙවියෙක් වන මගක් යයි යම් දෘෂ්ඨියක් වී නම් එය ඔහුගේ මිත්‍යා දෘෂ්ඨියයි. මිසදිටු ඇත්තාට නිරය හෝ තිරිසන් යෝනිය හෝ වේ යැයි කියමි."

මේ තමයි බුද්ධ දේශනාව. මේකෙන් පෙන්වන්නෙ බල්ලෙක් උපදින පටිච්ච සමුප්පාදයට නිදසුනක්. මේකෙන් හරකෙක් හෝ වෙනත් සතෙක් හෝ උපදින්නෙ නැති බව පැහැදිලියි. ගවයෙක් උපදින ආකාරය දක්වල තියෙන්නෙ මෙහෙමයි.

"මෙළොව කිසිවෙක් ගෝ ව්‍රතය අනූන කොට නිරතුරු කොට වඩයි නම් (ගවයෙක් වන අවිද්‍යාව), ගෝ සීලය (ගව සංඛාර), ගෝ චිත්තය (ගව විඤ්ඤාණය), ගෝ ආකල්ප (ගව නාමරූප) අනූන කොට නිරතුරු කොට වඩයි නම්, මරණින් මතු ගෙරින්ගේ සහවාසයට පැමිණේ."

මේ සඳහන් කළේ සූත්‍ර කාණ්ඩයක කැටි කළ අදහසක්. මේකෙන් කියවෙන්නෙ ගවයෙක් බවට පත් වෙන පටිච්ච සමුප්පාද ක්‍රමය. මේ ක්‍රමයෙන් දෙවියෙක් වෙන්න පුළුවන් කියන්නෙ මිත්‍යා දෘෂ්ඨියක් බවත්, මිත්‍යා දෘෂ්ඨිකයාට නිරය හෝ තිරිසන් යෝනිය හෝ උරුම බවත් මේ සූත්‍රයෙන් පෙන්වල තියෙනවා. මේ අනුව මේ ක්‍රමයෙන් ගවයෙක් මිසක් බල්ලෙක් හෝ වෙනත් සතෙක් හෝ උපදින්නෙ නෑ. මේ කාරණා වටහා ගන්නෙ නැතිව, ගව විඤ්ඤාණය, බලු විඤ්ඤාණය කියන වචනවල නිරුක්තිය දකින්නෙ නැතිව විවේචනය කරන්න යෑමත් සුදුසු නැති බව තේරුම් ගත යුතුයි. සැමට බුදු මග නුවණ ලැබේවා...!

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*පූජ්‍යපාද වහරක අභයරතනාලංකාර තෙරුන් වහන්සේ විසින් යළි මතු කළ සැඟවුනු දහම් කරුණු ඇසුරෙන් සකස් කළේ:*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# විශේෂයෙන් සැළකිය යුතුයි

හෙළ බොදු පියුම දහම් සඟරාවේ සමහර කලාපවල "අනිච්ච" සහ "අනත්ත" යන වචනවලට "අනිච්ඡ" සහ "අනත්ථ" කියා පෙන්වා ඇත්තේ, එකී වචන සිංහලට නැගීමේදී ඇති වූ සංස්කෘත ආභාෂය නිසා, අනිත්‍ය හෙවත් ස්ථිර නැත කියාත්, අනාත්ම හෙවත් ආත්මයක් නැත කියාත් කර ඇති අදහස් විකෘතිය පෙන්වා දීමටයි. එසේ වුවත් බුදු පියාණන් වහන්සේ අනුමත නොකළ, එසේම භාවිතා කළහොත් දුකුලා ඇවතක් වේ යැයි පනවා වදාළ, ලෝකායත සාස්ත්‍රවාදීන්ගේ කෘත්‍රිම භාෂා නිරුක්ති ඉදිරිපත් කරමින් කරන කලබලකාරීත්වය හේතුවෙන්, දහම් පත් කියවන පාඨකයින්ට එය බාධාවක් නොවනු පිණිස, ඒ ඒ තැනට ගැළපෙන ලෙස අනිච්ච, අනත්ත ලෙස යොදා ඇත.

අනිච්ච කීවත්, අනිච්ඡ කීවත් එහි නියම අර්ථය "ස්ථිර නැත" යන්නට සීමා කර නැති බවත්, අනත්ත කීවත්, අනත්ථ කීවත් එහි අර්ථයත් "ආත්මයක් නැත" යන්නට සීමා කර නැති බවත් දැනගෙන, දහම් විස්තර කරන විට නැගෙන නියම අර්ථය වටහාගෙන දහම් අවබෝධය ලබාගැනීමට උත්සාහ දැරිය යුතුයි.



# මේ කියන තරම් නිවන් දකින්න අමාරුද?

ලෝකයාට මේ වෙනකොට නිවන් දොරටු විවර කරගන්න තියෙන බාධා මොනවද කියලයි මේ ලිපියෙන් විමසල බලන්නෙ. ලෝකයේ මෙච්චර සැප සම්පත් පෙනි පෙනී තියෙද්දිත් නිවන් දකින්නෙ මොකටද කියල මේ වගේ දෘෂ්ඨියක් සමහර අයට තියෙනවා. අපිට ඊයෙ කියල දවසක් තිබුණා. ඊයෙ අපි මේ වගේ ආස්වාද වින්දා. දැන් අපි සිහි කරන, ඊයෙ දවසෙ හිටපු අපි, අද දවසෙ මෙතැන ඉන්නවා. සිහි කරල බැලුවම ඊයෙ දැකපු අපේ රූපවලට පණක් තියෙනවද? ඒ සිහි කරන රූපවල චිත්‍රපටියක දකින රූපවලට වඩා වෙනසක් තියෙනවද? මේ ගැන මොහොතක් කල්පනා කරල බලන්න. ඒ ක්‍රියා කරපු ආකාරයට වඩා වෙනස් චලනයක් දකින්න බෑ. "ඊයෙ මේ වැඩේ කරපු හැටි හරි නෑ. මීට වඩා හොඳට කරන්න ඕන..... " මෙහෙම කියල ඊයෙ කරපු දේ අද වෙනස් කරන්න පුළුවන්ද? "මම" කියල යමෙක් හිටියනම්, ඒ මේ දැන් ඉන්න "මම" නම්, මට ඕන හැටියට ඒ දේ වෙනස් කරන්න බැරි ඇයි? අද වෙනසක් කළොත්, ඒ වෙනස අලුතින් කරපු දෙයක් මිසක් ඊයෙ කරපු දේ වෙනස් කළා නෙවෙයි. ඊයෙ ඇඳල තිබුණ ඇඳුමෙ පාට ඒ පාටම මිසක් වෙන පාටක් වෙන්නෙ නෑ. මේ පිළිබඳව හොඳට හිතල බලන්න.

එහෙනම් ඊයෙ "මම හිටියා" කියල පණ ඇති රූපයක් විදිහට දැකපු "මම" අද ආපහු බලන කොට පණ නැති රූපයක්. මොහොතක් මොහොතක් පාසා කාලයට දිය වෙවී යන, ගෙවි ගෙවී යන, වැනසි වැනසී යන රූපයකට "මම පණ ඇති කෙනෙක්" කියල වැරදි දෘෂ්ඨියක ඉන්නව නේද? **උපන්දා පටන්ම මේ රූපය ගෙවි ගෙවී, වැනසි වැනසී යනව මිසක් තමන් කැමති ආකාරයට එක මොහොතක්වත් පවත්ව ගන්න පුළුවන් වුනාද කියල හිතල බලන්න.**

ඉතින් මේ පෙනි පෙනී තියෙන සැප කියල අපි මැනගෙන ඉන්න සියලු සම්පත් රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ කියන සියල්ල මොහොතින් මොහොත ගෙවි ගෙවී වැනසිලා යනව නේද? **මේ "මම" කියල හඳුන්ව ගන්න රූපයත්, බාහිර ලෝකයේ සම්පත් කියල, ආස්වාද ජනකයි කියල හිතාගෙන ඉන්න රූප, විඳීම්, හඳුනා ගැනීම්, ක්‍රියා... ආදී සියල්ලමත් මොහොතින් මොහොත ගෙවි ගෙවී වැනසිලා යනවා. තමන් කැමති විදිහට මොහොතකටවත් නතර කරගන්න බෑ. එහෙම ගෙවිල වැනසිලා යන, තමන් කැමති විදිහට පවත්වන්න බැරි සැප සම්පත් වටිනවද? ලෝකයේ** මොන තරම් සැප සම්පත් පෙනි පෙනී තිබුණත් ඒවා ගෙවිල වැනසිලා යන ධර්මතාවයෙන් යුක්තයි. **ඒ ධර්මතාවය අපිට වෙනස් කරන්න පුළුවන්කමක් නැති නිසා අපි අනේක වාරයක් දුක් වෙච්ච හැටි සිහි කරල බලන්න.** සැප නමැති මායා ස්වභාව මාත්‍රය ගොඩනගා ගන්න, පවත්වා ගන්න, තරඟ කරන්න පෙළුණ වාර අප්‍රමාණ බව සිහි කරල බලන්න.

■ මේ අවස්ථාව මොහොතින් මොහොත ගෙවි ගෙවී ගොස් විනාසයට පත් වන්නේමය.

■ සියලු අවස්ථාවෝ මොහොතින් මොහොත ගෙවි ගෙවී ගොස් විනාසයට පත්වන්නෝමය.

■ සියලු අවස්ථාවෝ මොහොතින් මොහොත ගෙවි ගෙවී ගොස් විනාසයට පත්වීම ධර්ම ස්වභාවය කොට ඇත්තාහුය.

■ පෙනි පෙනී ඇති සියලු සැප සම්පත් යැයි වෙන්කර ගන්නා ලද ධර්මයෝද ගෙවි ගෙවී ගොස් විනාසයට පත් වීම ධර්ම ස්වභාවය කොට ඇත්තාහුය.

නිවන පමා කරගන්න තවත් කාරණයක් තියෙනවා. රැකියාවක් නොකළොත් ජීවත් වෙන්නෙ කොහොමද? දරු මල්ලන් රැකෙන්නෙ කොහොමද? මේවාට කාලය ගත කරද්දි නිවනක් ගැන හිතන්න වෙලාවක් නෑ. රැකියාව කියන්නෙත්, අඹුදරුවන්, දෙමව්පියන් කියන්නෙත් ඉහතින් සඳහන් කරපු, මොහොතින් මොහොත ගෙවි ගෙවී ගොස් විනාසයට පත් වෙන ධර්මතාවයෙන් යුත් තවත් රූප කොටසක්මයි. දූ දරුවො වැඩිහිටියන් බවට පත් වෙනකොට ඔබ වයස්ගත වෙනවා. එතකොට අහන ධර්මය හිතේ රැඳෙන්නෙ නෑ. රඳව ගත්ත ධර්මය ක්‍රියාත්මක කරන්න කය වාරු නෑ. කායික වශයෙන් තියෙන දුර්වලතාවය නිසා මානසිකත්වය රඳව ගන්න බැරි වෙනවා. එතකොට කියන්න වෙනවා, "මේ ලෙඩ කයත් එක්ක නිවන් දකින්න බෑ, රස්සාවක් නෑ, මේ සොච්චම් විශ්‍රාම වැටුපෙන් ජීවත් වෙන්නත් අමාරුකොට මොන පින් දහම්ද, ඒවටත් මුදල් හදල් නැතුව බෑ...." ආදී වශයෙන්.

මෙතැනදි විනාසය කියන්නෙ නිකම්ම ගෙවිල නැති වෙලා යන දේ කියල හිතුවොත් අර්ථය විදිහට වැටහෙන්නෙ කොටසක් විතරයි. වින + ආසය = විනාසය. මේ "වින" කියන වචනයෙන් හඳුන්වන දේ විමසල බැලිය යුතුයි. අපි අණවින, කොඩිවින කියන වචන වගේම වින කරනවා කියල අදහස් කරන්නෙ මහා අවැඩක්, මහා දුක් ගින්නක් ඇති කරන අර්ථයක්. අවිද්‍යා තෘෂ්ණා සහගතව පංචකාම සුඛාස්වාද පසුපස යනකොට, ඒවා ඉටු කරගන්න දස අකුසලය කරා ඇදිල යන්නෙ නිරායාසයෙන්මයි. මේ විදිහට සිද්ධ කරගන්න දස අකුසල්වල විපාක ගෙවන්න වසර කෝටි ගණන් දුක් විඳගෙන සතර අපාගත වෙන්නත් සිද්ධ වෙනවා. ඒ අනුව දස අකුසල් තරම් තවත් විනයක් ලෝකයේම නැති බව තේරුම් ගන්න ඕන. ඡන්දරාගයෙන් බැඳුන ආස්වාද මොහොතක් ගෙවිල යන්නෙ මේ වින ආශ්‍රයට පත් කරවමින්. නිකම්ම ගෙවිල නැති වෙනවට වඩා විනාසය භයානක වෙන හැටි මේ විදිහට දකින්න ඕන.

දැන් ඉතින් ප්‍රමාදයි. "පමාදෝ මච්චුනෝ පදං....." ප්‍රමාදී වූවෝ මළවුන් වැනිය. රහත් වෙන්න හේතු වාසනා තිබුණ, සම්පත් තිබුණ මහධන සිටුතුමාට, ප්‍රමාද වීම නිසා ජීවිතය අවසාන භාගයේ දිළිඳු වෙලා හිඟමනින් ජීවත් වෙන්න සිද්ධ වුණ බව බුදු පියාණන් වහන්සේ දේශනා කරල තියෙනවා. සියලු බුදුවරයන් වහන්සේලා, ඊට පෙර වැඩ හිටපු

අතීත බුදුවරයන් වහන්සේලා කටයුතු කරපු ආකාරය සිහි කරල බලනවා. මීට පෙර රැකියාවල් කරපු අය, අඹුදරුවන් පෝෂණය කරපු අය නිවන් දැකල නැත්ද කියල ධර්මය ඇසුරින් හොයල බලමු.

ඛුජ්ජුත්තරා කියන්නෙ සාමාවතී බිසව ඇතුලු පන්සියයක් අන්තඃපුර බිසෝවරුන්ට මල් සපයපු සේවිකාව. ඒක ඇගේ රාජකාරියක්. නමුත් ඇය බුදුන් වහන්සේගෙන් බණ අහල සෝවාන් වෙලා ඒ ධර්මය බිසෝවරුන්ටත් කියල දීල ඒ අයත් සෝවාන් ඵලයේ පිහිටෙව්වා. සෝවාන් වුණා කියන්නෙ නිවන් දැක්කා කියන එක. නිවන් මාර්ගය පූර්ණ වීමෙනුයි අරිහත් වෙන්නෙ. ඒ කියන්නෙ දහම් දැකල අනුගමනය කරල සියලු කෙලෙස් බිඳ හැරල කෙළවර වුනාමයි අරිහත්වය කියන්නෙ.

සුනීත කියන්නෙ වසුරු කඳන් ගෙනිච්ච, පහත් කියල සම්මත කුලයක උපන්න දුගී කම්කරුවෙක්. අම්බපාලි කියන්නෙ ගණිකා වෘත්තියේ යෙදුන රූමත් ස්ත්‍රියක්. ඒ අයත් ධර්මය ශ්‍රවණය කරල මග ඵල ලැබුවා. සුද්දෝධන රජතුමා රාජ්‍යයක් පාලනය කරපු රජ කෙනෙක්. රජ කෙනෙකුට තරම් රාජකාරි කටයුතු අපේ රැකියාවක තියෙනවද? නමුත් එතුමා අනාගාමී වෙලා ඉඳල පසුව රහත් වුන බවත් ධර්මයේ සඳහන් වෙනවා.

බිම්බිසාර රජතුමත් සෝවාන් වෙච්ච කෙනෙක්. සන්තති ඇමති කියන්නෙ යුද්ධයක් දිනපු සෙන්පතියෙක්. රාජාභරණ සහිත රජ ඇඳුම පිටින්ම හස්තියෙක් පිට ඇවිත්, හස්ති යානයෙන් බැහැල බුදුන් වහන්සේ මුණගැහිල බණ අහල අරිහත්වයට පත්වුණා. චිත්ත කියන ගෘහපතියා අඹුදරුවන්, සේවක කාරකාදීන් පාලනය කරගෙන හිටියත් නියම කාලයේ ධර්මය ශ්‍රවණය කරල අනාගාමී වුණා. මේ වගේ තවත් උදාහරණ පෙළ දහමෙන් පෙන්වන්න පුළුවන්. මග ඵල ලබන්න අවශ්‍ය වෙන්නෙ සුදුසු කාලයේ ශ්‍රී සද්ධර්මය ශ්‍රවණය කරල යෝනිසෝ මනසිකාරයෙන් යුක්තව සිහි කිරීම. ශ්‍රී සද්ධර්මය දේශනා කරන කෙනා කල්‍යාණ මිත්‍රයෙක් වීමත් අත්‍යවශ්‍ය කාරණයක්. සෝවාන් ඵලයට පත් වෙන්න ඒ ධර්ම දේශනා කරන මොහොත ප්‍රධාන උපනිශ්‍රයක් වෙනවා.

මේ තරම් අපි බැඳිල ඉන්න දෙමව්පියො, දූ දරුවො කියන්නෙ කාටද? ඒ අය එක්ක එබඳු සබඳකම් ගොඩනැගුනෙ කවදද? මොකක් නිසාද? කවද වෙනකල් මේ බැඳීම් පවතියිද? විමසල බලමු. මේ සසර ගමනෙ එක් අත්බැවක් වුණ මේ මිනිසත් භව උපමාවකින් කියනවනම්, දුර ගමනක් යන මගීන් සඳහා තියෙන අම්බලමක් වගෙයි. සතර දිගින් යන එන පිරිස් රාත්‍රිය ගත කරන්න අම්බලමට ගොඩ වදිනවා. හිඟන්නන්, ගොවියන්, චන්ද්‍රනාකරුවන්, පණ්ඩිතයන් වගේම මංකොල්ලකරුවන්, තක්කඩියන්, බේබද්දන් අම්බලමෙ නවතිනවා. රාත්‍රිය ගතවෙලා හිරු උදාවෙන කල් ඒ ඒ අය කතාබහ කරනවා. ආගිය තැන්, යන එන තැන්, කරන කියන දේවලුත් කතා කරනවා. ඇත්ත කියන අය වගේම බොරු කියන අයත් ඇති. ඒ කවුරුත් හිරු උදා වුණාට පස්සෙ තම තමන්ගෙ සිතැඟි පරිදි විසිරිලා යනවා. ඒ එක්කෙනෙක්වත් අනෙක් අයගෙ උපදෙස් බලාගෙන ඒ අනුව තම තමන්ගෙ බලාපොරොත්තු කටයුතු වෙනස් කරන්නෙ නෑ. ඒ අම්බලමෙදි ප්‍රඥාවන්තයෙකුට ආර්ය උතුමෙක් කලාතුරකින් මුණගැහුනොත් ඔහු විතරක් විසාල යහපතක් කරගන්නවා. අනික් අය අයාලෙ යනවා.

**අනන්ත සසර ගමනෙදි එක් එක් අත්බැව්වල මුණගැහිල උදව් උපකාර ලබාගත්ත අය, උදව් උපකාර දුන්න අය, නපුරු දුෂ්ඨකම් කරපු අය, තමන් කරපු නපුරු දුෂ්ඨකම්වලට ලක් වෙච්ච අය... මේ ආදී පිරිස් තමයි සසර අම්බලමේ දූ දරුවන්, දෙමව්පියන්, ස්වාමි භාර්යාවන් වෙලා ධර්මතාවය විසින් ඒ ඒ කර්මවල විපාක විඳින්න හොඳ හෝ නරක අය විදිහට මුණගැහිල ඉන්නෙ.**

“තණ්හා ආසා ඔලොගු කරේ ලා.....” යන මේ සසර ගමනේ කම්මස්ස කෝම්හි, කම්ම දායාදෝ.... ආදී වශයෙන් කර්මය උරුම කරගෙන, කර්මය දායාද කරගෙන, කර්මය උප්පත්ති කරගෙන, කර්මය නෑයා කරගෙන, කර්මය පිළිසරණ කරගෙන, තණ්හාවෙන් ආසාවෙන් එකිනෙකා පිළිබඳව ගොඩනගා ගත්ත සංඛාරවල විපාක ගෙවන්න, විපාක විඳින්න අපි මුණගැහිල ඉන්නවා. එදා වගේම අදත් ණය වෙනවා, ණයට ගන්නවා, ණය ගෙවනවා, ණයට දෙනවා. මේ ණය වීම ලෝක සම්මත ණය වීමට වඩා වෙනස්. ණය දීම, ණය ගැනීම ආදියත් ලෝක සම්මත කතාවට වඩා හාත්පසින් වෙනස්. උදාහරණයක් විදිහට ගත්තොත්, උපාසක උපාසිකාවො භික්ෂූන් වහන්සේලාට ණයට දානෙ දෙන්නෙ නෑ. උන්වහන්සේලා ණයට ඉල්ලන්නෙත් නෑ. **නමුත් සිල් ගුණ සලකල දෙන දානය ප්‍රත්‍යවේක්ෂාවෙන් තොරව පරිභෝග කරන භික්ෂුව ඉණ පරිභෝගයට අහුවෙනවා. ඒ කියන්නෙ ණයට භුක්ති වින්ද වෙනවා. ඒ ණය ගෙවන්න අලි, හරක්... ආදී සත්තු වෙලා උපදින්නත් සිද්ධ වෙන බව ධර්මයේ සඳහන් වෙනවා.** එහෙම ඉපදිලා දායක ගෙවල්වලට ණය ගෙවන්නත් වෙනවා.

ඒ නිසා යමෙක් කරන සියලු අයුතු අසාධාරණකම් ලෝකයටම ණය වීමට අයිති වෙනවා. ණය බලාපොරොත්තු නොවුනත්, අයුතු අසාධාරණකම්වලට ගොදුරු වෙච්ච පිරිසට සිද්ධ වුණ අයුතු අසාධාරණකම්වලට වන්දි/ ණය ගෙවන්න සිද්ධ වෙනවා. ලෝකයේ සම්මත විදිහට ණය වෙලා ණය නොගෙවීම, ණයට දීල බලාපොරොත්තුවෙන් ඉඳීම... ආදිය බලවත් බන්ධන වෙනවා. **ණයට අරගෙන වංචාවෙන් රැවටීම, වංචාවෙන් නොදී ඉඳීම වගේ දේවල් නිසා අවුරුදු කෝටි ගණනක් වුනත් සතර අපා මහ දුක් විඳින්න හේතු වෙන්න පුළුවන්.** ණයට දීල නැවත නොදුන්න නිසා දාහයෙන් පෙලී පෙලී බලාපොරොත්තුව ඉඳීම නිසා, සසර ගමන දිගු කරගෙන රෞද්‍ර කොටි, වළස් වගේ ජාතිවල ඉපදෙමින්, ලෝක ධර්මතා පරිදි ණය වෙච්ච අය ගොදුරු සතුන් බවට පත්වෙලා ඉපදෙමින් කොටි, වළස්... ආදීන්ට ගොදුරු වෙමින් අවුරුදු කෝටි ගණන් ගෙවිය යුතු කරුමක්කාරයන් බවටත් පත් වෙනවා.

**යුතුකම් ඉටු කිරීම වගේම වැඩි යහපතක් කරල දීම නිසා, බලාපොරොත්තු නොවුනත්, සසරෙදි ලෞකික සුව ලබන්න සහ අයුතු අසාධාරණකම්වලට ගොදුරු නොවී රැකවරණ ලබන්නත් හේතු වෙනවා. යුතුකම් ඉටු නොකළ පිරිසට ඒ හේතුවෙන් අනුන්ගෙ අයුතු අසාධාරණකම්වලට ගොදුරු වෙන්නත්, අභූත චෝදනා ආදියට ලක් වෙන්නත් හේතු වෙනවා.** ලෝක ධර්මතාවය විසින් මේ විදිහට අපිව මුණගස්වල තියෙනවා. මේ පිරිස් කවුරුන් හෝ වේවා, තමාත් පවුලේ සියලු දෙනාත් ආවෙ කොහේ ඉඳන්ද කියල දන්නෙ නෑ. කොච්චර කල් එක්වෙලා ඉඳීවිද කියන්න දන්නෙත් නෑ. කවදා වෙන් වෙලා යයිද, කොතැනට වෙන් වෙලා යයිද කියන්න දන්නෙත් නෑ. කරන ලද පාප කර්මයක් හෝ පුණ්‍ය කර්මයක් හෝ හේතුවෙන් ඒකෙ විපාක ඵලය විදිහට මුණගැහිල අම්බලමෙ රැය පහන් කරනව වගේ, මේ ජීවත් වෙන කෙටි කාලය තුළ ඒ අය වෙනුවෙන් කළ යුතු යුතුකමක් වගකීමක් තියෙනව නම් ඒක මගහැර නොයා යුතුයි. ඒවා ඉටු කළ යුතුයි. හැබැයි ඒ, රාගයෙන් හෝ ද්වේශයෙන් හෝ මුලා සහගතව හෝ නෙවෙයි. ඥාන සම්ප්‍රයුක්තව හේතුව - ඵලය දැනගෙන නොඇලී නොබැඳී ඉටු කළ යුතුයි. මගේ කියල බැඳිල කටයුතු කිරීමෙන් මේ අනාත සසරේ තවත් බොහෝ දුර යන්න සිද්ධ වෙනවා. තමන් කැමති විදිහට භුක්ති විඳින්න පුළුවන් තිරසාර සැපක් නැති මේ මායා සසරේ තවත් දුක් විඳිය යුතුද කියල

# මේ කියන තරම් නිවන් දකින්න අමාරුද?

මෙනෙහි කරල බලන්න. රැකියාව හෝ දූ දරු දෙමව්පිය... ආදීන් හෝ නිවනට ඇති කටු අකුල් විදිහට නොසලකන්න. අති දුර්ලභ බුද්ධෝත්පාද කාලයක සද්ධර්මය ශ්‍රවණය කරන්න, වටහා ගන්න නුවණක් තියෙන උතුම් මනුස්ස අත්භවය, ගෙවිල වැනසිලා යන පංචකාම ගුණ උපධීන් (මන වඩන රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ) කෙරෙහි යොදන්නෙ නැතිව අප්‍රමාදී වෙන්න අධිෂ්ඨාන කරගන්න.

"ඒ කාලෙ මග ඵල ලබපු අය හිටියට දැන් එහෙම අය ගැන දැන ගන්නවත් නෑ. අහන්නවත් ලැබෙන්නෙ නෑ". මේ තමයි නිවන වහගෙන තියෙන තවත් මතයක්. කල්‍යාණ මිත්‍ර සම්පත්තිය ලබන්න තියෙන මග වැහිල තියෙන හැටි. මේ කාරණය ගැන කරුණු පැහැදිලි කරන්න සිද්ධ වෙන්නෙ සූත්‍ර දේශනා පෙන්වා දෙමින්. අද බණ දහම් දේශනා කරන ගිහි පැවිදි පින්වතුන් බොහෝ දෙනෙක්ගෙන් අහන්න ලැබෙන්නෙ මේ වගේ කියමන්. "මාර්ග ඵල ලැබුව කියල ඇත්තටම ඵල ලබපු අය නම් ඒ ගැන කියන්නෙ නෑ. එහෙම කියනව නම් කියන්නෙ ලාභ කීර්ති ප්‍රසංසා බලාපොරොත්තු වෙන අය"

මේ කියමන් කොතෙක් දුරට පිළිගන්න පුළුවන්ද කියල විමසල බලමු. බුදු පියාණන් වහන්සේ <u>මහා පරිනිබ්බාණ සූත්‍රයෙදි</u> දේශනා කරපු සතර මහා පදේශ අනුව විමසා බැලීම අප විසින් කළ යුතු දෙයක්. එහෙම කිරීම කිසිවෙක් කෙරෙහි අගෞරව කිරීමක් නොවන බවත් උන්වහන්සේ දේශනා කරල තියෙනවා. තුන් කල් දැකපු බුදු පියාණන් වහන්සේ ශ්‍රාවකයින්ගෙ යහපත පිණිසයි සතර මහා පදේශයන් දේශනා කළේ.

1912 දි දර්ශන විශාරද මහාචාර්ය අග්ගමහා පණ්ඩිත පොල්වත්තේ බුද්ධදත්ත හාමුදුරුවො රචනා කරපු ධර්ම ග්‍රන්ථයක මෙහෙම සඳහන් වෙනවා. "තවද මාර්ගඵල ලාභීහු ඉතා බලවත් කරුණක් නොමැතිව තමන්ගෙ අධිගමය අනුන්ට ප්‍රකාශ නොකරත්..." එහෙනම් කොහොමටවත් ප්‍රකාශ නොකරනවා නෙවෙයි. ඉතා බලවත් කරුණක් නැතිව ප්‍රකාශ කරන්නෙ නෑ. මේ අවස්ථාව සඳහන් කරල තියෙන්නෙ, ධර්මාශෝක රජතුමා කරවපු විහාර ආරාමයක් පූජා කරන අවස්ථාවෙ පිරිනමන ලද දානයට මජ්ජන්තික කියන රහතන් වහන්සේ, පරණ වෙච්ච දුර්වර්ණ වෙච්ච සිවුරු පෙරවගෙන වැඩපු නිසා, වයස් ගතවෙලා පැවිදි වෙච්ච කෙනෙක් කියල හිතාගෙන සේවක පිරිස උන්වහන්සේ පෙරමුණේ වැඩසිටීම නොරිස්සූ අවස්ථාව මුල් කරගෙන. ඒ වෙලාවෙදි එතැනින් ඉවත් වෙච්ච උන්වහන්සේ, රජතුමා පළමු පිණ්ඩපාතය පිළිගන්වන කොට පොළව විවර කරගෙන රජතුමා ඉදිරියේ මතුවෙලා පිණ්ඩපාතය පිළිඅරගෙන රජතුමාට යහපත සලසපු බවත් සඳහන් වෙනවා. මේ විදිහට **අන්‍යයන්ගේ යහපත පිණිස තමන් ළඟ තියෙන උත්තරීතර ගුණ ධර්ම ප්‍රකාශ කිරීම විශේෂ හේතු මත සිද්ධ වෙන්න පුළුවන්.**

ඒ වගේම දීඝ නිකාය (2) 431 පිටුවේ එන <u>සක්කපඤ්හ සූත්‍රයේ</u>, බුදු පියාණන් වහන්සේ සක් දෙවිඳුන්ගෙන් සතුටු වෙන්න හේතු විමසුවම, කරුණු 6 ක් දන්න නිසා තමන් මහත් සතුට ප්‍රකාශ කරපු බව කියල තියෙනවා. "අහං බෝ පණ භන්තේ භගවතෝ සාවකෝ සෝතාපන්නෝ අවිනිපාත ධම්මෝ නියතෝ සම්බෝධි පරායනෝ ති....." මම භාග්‍යවතුන් වහන්සේගේ සාසනයේ සෝතාපන්න වූ නියත සම්බෝධිය ඇති ශ්‍රාවකයෙක් වෙමි කියල ප්‍රකාශ කරන කොට අපි හිතල බලන්න ඕන, මේ ලෝකයේ අපි විඳින සැප, සක් දෙවිඳු විඳින සැප සම්පත් එක්ක සම කරන්න පුළුවන්ද, එබඳු සැප සම්පත්වලින් ආඪ්‍ය වූ සක් දෙවිඳු බුදු පියාණන් වහන්සේගෙන් මොන ලාභ කීර්ති ප්‍රසංසා බලාපොරොත්තුවෙන්ද මග ඵල ප්‍රකාශ කළේ කියල. එහෙනම් මගඵල ප්‍රකාශ කරන්නෙ ලාභ කීර්ති ප්‍රසංසා උදෙසාමයි කියන ප්‍රකාශය පෙළ දහමට ගැළපෙනවද කියන කාරණයත් විමසල බලන්න.

මේ කාලයේ නිවන් දකින්න බෑ කියන මතය නිසා මන්දෝත්සාහි වෙලා, නමුත් ධර්ම මාර්ගයේ මහත් උනන්දුවෙන් හැසිරෙන්න කැමති පිරිසක් අදත් ඉන්න බව හොයල බැලුවොත් දැනගන්න පුළුවන්. ඒ අයගෙ යහපත පිණිස යම් කිසි අධිගමයක් ලබපු කෙනෙක් ඒ ගැන ප්‍රකාශ කරනවනම්, ඒ ප්‍රකාශ කිරීම බලවත් විශේෂ හේතුවක් නෙවෙයිද? ඒක ලෝකයාගේ යහපත පිණිස ප්‍රකාශ කිරීමක් නෙවෙයිද? අධිගමය ප්‍රකාශ කළත් නොකළත් පුණ්‍යවන්තයාට ලැබීම ධර්මතාවයක්, පිදුම් ලැබීම ධර්මතාවයක්. "අජානීය වූ ධ්‍යායිකය, ඔබගේ ධ්‍යානය පෙනේ, ධ්‍යාන අරමුණ නොපෙනේ, අපි ඔබට දුර සිට නමස්කාර කරමු" කියල දෙවියොත් දුර ඉඳන් නමස්කාර කරන බව ධර්මයේ පෙන්වල තියෙනවා. **නැති මග ඵල තියෙනවයි කියල ප්‍රකාශ කරන කෙනාට ඒක බොහෝ කාලයක් පෙන්වගෙන ඉන්න පුළුවන්කමක් නෑ. ධර්මතාවය විසින්ම හෙළිදරව් කෙරෙනවා.** එතකොට මොන ලාභ කීර්ති ප්‍රසංසා ලැබීමක්ද? නින්දා අපහාස නම් ලැබෙන්න පුළුවන්.

මේ නිසා ඒ කාලෙ විතරක් නෙවෙයි, මේ කාලෙත් කොහේ හරි ඉන්නවනම් මුණගැහේවා කියල, තමන්ගෙ ධර්ම ප්‍රතිපදාව සහ කටයුතු ශ්‍රද්ධාවෙන් භක්තියෙන් ගෞරවයෙන් කරන කෙනාට එබඳු උතුමන් මුණගැසීම ධර්මතාවයක්. මනස පූර්වාංගමව ගොඩනැගුණ ලෝකයෙන් නික්මෙන්නත් මනස පූර්වාංගම වෙනවා.

"උට්ඨානමතෝ සතිමතෝ සුචිකම්මස්ස නිසම්ම කාරිනෝ සඤ්ඤද තස්සච ධම්ම ජීවිනෝ - අප්පමත්තස්ස යසෝභි වඩ්ඪති."

මනා සිහියෙන් ඉඳගෙන උත්සාහයෙන් විරියෙන් යහපත් කර්මාන්තවල යෙදෙමින්, කුසල් දහම්වල හැසිරෙමින් දැහැමි ජීවිතයක් ගත කරන අයගෙ යසස වැඩෙනවා කියන්නෙ මේ ගාථාවෙ මතුපිටින් පෙනෙන සරල අදහස. නමුත් බුදු **පියාණන් වහන්සේ දේශනා කරපු සතර පද ගාථාවක් වුණත් නිවන් දකින මගක්.** අබුද්ධෝත්පාද කාලවලදිත් බ්‍රහ්මචාරී ජීවිත ගතකරපු උතුමන් සුචරිතයේ අගය දේශනා කළා. බුදුවරයන් වහන්සේ නමක් ලෝකයට පහළ වෙලා දේශනා කරන්නෙ ඊට වඩා ගැඹුරු දහමක්.

අප්‍රමාදීව උත්සාහයෙන්, මනා සිහියෙන් යෙදිය යුතු යහපත් කර්මාන්තය තමයි අරි අටඟි මාර්ගයේ දැක්වෙන ආර්ය වූ, ලෝකෝත්තර වූ, නිවනට හේතුවන්නා වූ සම්මා කම්මන්තය. ඒ කියන්නෙ, අසාර ලෝකයේ ප්‍රාණඝාත, හොරමැර වංචා, සුරාසූදු දුරාචාර කරල ලබාගන්න වටිනා හරවත් කිසිම දෙයක් නැති බව අවබෝධයෙන් යුතුව දැනගෙන එවායින් වෙන් වෙලා වීතරාගී, වීතදෝසී, වීතමෝහී නිවනට මුල් වන්නා වූ කටයුතුවල යෙදීම තමයි සම්මා කම්මන්තය කියන්නෙ. ඒ විදිහට කටයුතු කිරීමෙන් වර්ධනය වෙන්නෙ යසස කියන උතුම් නිවන. සුචරිත යහපත් ජීවිතයෙන් වැඩෙන්නා වූ, ලෞකික සැප සම්පත් කියන යසස කියන්නෙ මරණයෙන් අත්හැරල යන දෙයක්. නිවන කියන යසස උතුම් අරිහත්වයට පත්වෙන කල් සෝවාන් තැන් පටන් මරණයෙන් නොපිරිහෙන දෙයක්.

ඒ නිසා ඔබට ලෝකය අසාර බව වැටහෙනවනම්, අප්‍රමාදීව නිවන අධිෂ්ඨාන කරගෙන ධර්මයේ හැසිරෙනවනම්, ඒ උතුම් යසස ඔබටත් හිමිකර ගන්න මාර්ගය විවෘත වෙලා තියෙන බව පෙනී යන්න ඕන.

*පූජ්‍යපාද වහරක අභයරතනාලංකාර තෙරුන් වහන්සේ විසින් යළි මතු කළ සැඟවුනු දහම් කරුණු ඇසුරෙන් සකස් කළේ:*

**ඩබ්. ඒ. තිළිණවතී**
**(විශ්‍රාමික මහජන බැංකු නිලධාරිනී)**
**පිළියන්දල - 0714686242**

# සැප පෙන්වා දුක් ගිනි දෙන ලෝකය



**පසුගිය කලාපයෙන්...**

එදා සක්විති රජවරුත්
අද තණකොළ උලා කති...

දැන් අපිට වහ වහා දැන ගන්න උවමනා වෙන්නෙ, මහා දුක් ගිනි දෙන සතර අපායෙන් සදහටම නිදහස් වෙන්න තියෙන එකම මග මොන විදිහට අනුගමනය කළ යුතුද කියල. මොකද මේ අති දුර්ලභව මනුස්ස අත්භවයක් ලැබිච්ච වෙලාවෙ සියල්ල කැප කරල හරි, මහා දුක් සහිත සතර අපාය ඉක්මවා නොගියොත් සිද්ධ වෙන දේ දන්න නිසා. දැන් ඔබට වැටහෙනව ඇති, මේ සංසාර ගමනෙදි අනිවාර්යෙන් වැටෙන්න සිද්ධවෙන මහා දුක් සහිත අගාධයෙන් ගැළවෙන්න වහ වහා යමක් කළ යුතු බව. මහා කරුණාවකින් කල්‍යාණ මිත්‍රයෙක් මේ සතර අපා දුකින් මිදෙන මග කියල දෙන වෙලාවෙ, අනෙක් සියලු වැඩ දෙවෙනි කරල තමන්ගෙ ජීවිතය ඒ වෙනුවෙන් කැප කළාට කිසිම පාඩුවක් නොවෙන බව තමන්ට හොඳට වැටහෙනව කියල යමෙකුට සිහියට එනවනම් ඒ ඇති. මොකද අනාගතයේ විඳින්න සිද්ධවෙන මහා දුකෙන් අත්මිදෙන්න ලැබෙන මේ වගේ අති දුර්ලභ අවස්ථාවක් කල්ප කාලාන්තරයකට නොලැබෙන්න පුළුවන් නිසා.

ඒ නිසා බුදු පියාණන් වහන්සේගේ දේශනා අනුව, පසුගිය කලාපයෙන් විස්තර කළ ඒ භික්ෂූන් වහන්සේලා පන්සියයක් දෙනා හෝ මේ සාසනයේ සෝවාන් ඵලයට පත් වුනා කියල කියන තවත් දහස් ගණනක් දෙනා, ඒ විදිහට සෝවාන් ඵලයට පත් වුනේ කොහොමද කියල හොයල බැලීමෙන් මේ සරල සුගම එකම මග හොයා ගන්න පුළුවන්.

මේ ලෝකය මායාකාරයෙක්ගෙ ඇස් බැන්දුමක් වගේ කියල මේ පන්සියයක් දෙනාම දැකල තියෙනවා. ඒත් සෝවාන් මග ඉක්මවා ගිය අය හැර අනෙක් හැම දෙනාම මේ මායාවෙන් වැහිල ඉන්න නිසා, ඒ අය දකින්නෙ මේ ලෝකයේ තියෙන දේවල් මහා වටිනා දේවල් විදිහට. ඒවා අල්ලල බලන්නත් පුළුවන්. පරිහරණය කරන්නත් පුළුවන්. වැඩි හරියක් දේවල් පරිහරණයට බොහොම ප්‍රිය ජනකයි. ඒ වගේම නැවත නැවත විඳින්න ආස හිතෙන ආස්වාදයක්මයි ඒවායින් ලැබෙන්නෙ. කොයි අත බැලුවත් ආස්වාදයේ කිසිම අඩුවක් නෑ. ඒ නිසා ඒවා තමන් සතු කරගෙන ගබඩා කරගැනීම තමයි දුකක් නොවිඳ සැප ලබන්න තියෙන හොඳම ක්‍රමය. මේ තමයි පෘතජ්ජන ලෝකයා දකින හැටි. ඒ නිසා ලෝක සත්වයෝ ආස්වාද බලාපොරොත්තුවෙන් තමන්ට ප්‍රිය ජනක වස්තු වැඩි වැඩියෙන් රැස්කිරීම තමයි කරන්නෙ. මේ වැඩපිළිවෙල නොනවත්වා කරගෙන යාම තමයි සංසාර ගමන කියන්නෙ. ඒ විදිහට වැඩි වැඩියෙන් ඒ ප්‍රිය ජනක වස්තු රැස්කරගෙන, ඒවා කැමති විදිහට පරිහරණය කරන්න ලැබීම තමයි ලෝක සත්වයා සැප විඳිනවා කියල කියන්නෙ. මේ අදහස දහසක් ආකාරයෙන් විග්‍රහ කරල පෙන්වන සූත්‍ර දේශනා තිබුණත් දැනට කෙටියෙන් මේ ගැන විමසල බලමු.

මේ ලෝකයේ හටගත්ත වැඩිමනත් දේවල් සැපම ලබා දෙන බව අපිට අත්දැකීමෙන්ම ඇස් පනාපිටම පේන්න තියෙද්දි, මේ පන්සියයක් දෙනා කොහොමද ඒවා අසාර බවට තීරණය කළේ? ඒ විතරක්ද, ඒවා හටගන්න ලෝකයත් අසාරයි කියන නිගමනයකට ඇවිත්. මේ පෘතජ්ජන ලෝකයාට කොහොමටවත් වැටහෙන්නෙ නැති, මෙන්න මේ සැප සහ දුක පිළිබඳව මේ තුන් ලෝකයේ උගත් කියල කියන, මහා පඬිවරු කියල කියන කාටවත් කියන්න තියා හිතන්නවත් බැරි පුදුමාකාර විග්‍රහයක් බුදු පියාණන් වහන්සේ දේශනා කරල තියෙනවා. ඒ විග්‍රහයෙදි ඒකෙ මූල සිද්ධාන්තය වන අනිච්ච, දුක්ඛ, අනත්ත කියන වචන තුනකින් සහ බැඳි අකුරු අටකින් සමන්විත තිලකුණු දේශනා කරල තියෙනවා. මේ තිලකුණු යමෙක් වටහා ගත්තොත්, ඒ පුද්ගලයා ලෝකය අසාර තැනක් බව දැක්ක කෙනෙක් වෙනව කියලයි උන්වහන්සේ දේශනා කළේ. ඒ කියන්නෙ නිවනම සාර තැනක් බව දැකල, ආපසු නොහැරෙන සෝවාන් ආර්ය ශ්‍රාවකයෙක් බවට පත්වෙනවා. එහෙනම් මෙන්න මේ මූල සිද්ධාන්තය තුලින් ලෝකය පිරිසිඳ (ප්‍රිය භාවය සිඳ) වටහා ගත්ත පන්සියයක් භික්ෂූන් වහන්සේලා තමයි ආනන්ද හාමුදුරුවො එක්ක ඒ වෙලාවෙ මහ මග වඩිමින් හිටියෙ. මේ මූල සිද්ධාන්තය වටහා ගන්න නම්, ඒ වචන තුන අපිට තේරෙන විදිහට නිර්වචනය කරගන්නම වෙනවා. කිච්ච ගමන්ම තේරෙන අය විශේෂයෙන් අද කාලයේ නම් බොහොම අඩුයි. ඒ නිසා පළමුවෙන්ම මේ ආර්ය ධර්මය තුලින් ලෝකය පිරිසිඳ දැක ගන්න කියලයි බුදුන් වහන්සේ දේශනා කළේ.

බලන්න මේ ලෝක සත්වයා වටිනවයි කියල, මහා ප්‍රිය මනාපෙන් සැපයි සැපයි කියල ළං කරගෙන තියෙන දේවල්, මොහොතක සැප වින්දනයක් දීල දුකක්ම ළං කරල දෙන හැටි. තමන් නොසිතූ මොහොතක සොර සතුරෙක් උදුර ගත්තොත්, මොන යම් හේතුවක් නිසා හෝ නැති වුනොත්, ගං වතුරකට ගහගෙන ගිහින් වැනසුනොත් විතරක් නෙවෙයි, කාලයාගේ

ඇවෑමෙන් පරණ වෙලා ජරා ජීර්ණ වෙලා වැහැරිලා විපරිණාමයට පත් වෙලා, නොදැනුවත්වම තමන් අතින් ගිලිහිලා ගියොත් මොකද වෙන්නෙ? මෙච්චර සතුටෙන් ජීවිතය පරදුවට තියල සැපයි කියල හිතාගෙන ගොඩ ගහගත්ත මායා සැප ගොඩවල් අපි නොදන්න මොහොතක මේ වගේ ගෙවිල වැනසිලා ඇත් වෙලා යනවා. එතකොට ඇතිවෙන්නෙ සතුටක්ද, නැත්නම් විඳින්න අකමැතිම දුකක්ද කියල හිතල බලන්න. **මේ ගැන දුර දිග හිතන්න වෙන්නෙ, මේ විදිහෙ ප්‍රිය මනාප දේවල් වැනසීමෙන් ඇතිවෙන දුක් කන්දරාව මේ ජීවිතේට විතරක් සීමා වෙන්නෙ නැති නිසා.** මතු මතුත් උපදින වාරයක් පාසා මේ වගේ එකතු කිරීම්, වියෝ වීම්, වැනසීම් සිද්ධ වෙලා දුකට පත්වීමේ අවසානයක් දකින්න ලැබෙයිද කියලත් විමසිල්ලෙන් බලන්න.

මෙන්න මේ නිසාමයි බුදු පියාණන් වහන්සේ මේ ලෝකයත්, ලෝකයේ හටගත්ත සියල්ලත් අනිච්චයි, දුක්ඛයි, අනත්තයි කියල දේශනා කළේ. නමුත් මෙතැනදි විශේෂයෙන් අවබෝධ කර ගත යුතු වැදගත් දෙයක් තියෙනවා. මේ ලෝකයේ හටගත්ත මොන තරම් වටිනා දෙයක් අපිට ලැබුනත්, අපි ළඟ තිබුනත්, අපි දුක් මහන්සියෙන් හරි හම්බ කළත්, මානසික දුකට පත්වෙන්න සිද්ධ වෙන්නෙ, ඒවා එක්ක දැඩි ආසාවකින්, තණ්හාවකින් බැඳුනොත් විතරයි. ඒ කියන්නෙ ඒවා එක්ක ඡන්ද රාගයෙන් බැඳුනොත් විතරයි.

ඒ කියන්නෙ අපි හරිහම්බ කරන මුදල් හදල්, වතු පිටි, හරක බාන, යාන වාහන, බිරින්දෑවරු, දරු මුණුපුරෝ විතරක් නෙවෙයි, මහා වටිනාකමක් දීල එකතු කරගත්ත මෙකී නොකී සියලු දේවල් එක්ක ඡන්දරාගයෙන් බැඳිල අත්පත් කරගන්න කොට අපිට සැප දෙනව වගේ සිරියාවට පෙන්වනවා. නමුත් මේවා එක්ක ඡන්දරාගයෙන් බැඳිල හිටියොත් අවසාන වෙන්නෙ දුකක්ම දීල. අපි මේවා ආසාවෙන් ළං කරගන්නෙ සැප ලබා ගන්න මිසක් දුක් විඳින්න නෙවෙයි. ඒ නිසා සැප විදිහට තිබුන දේ දිගටම සැප දෙන්න ඕන. නමුත් ඒක එහෙම වෙන්නෙ නෑ. ඒවා අපි කැමති විදිහට පවත්ව ගන්න බැරි වෙලා දුකක්ම දීගෙන වැනසිලා යනවා. මේ තමයි ලෝක ස්වභාවය. මේ ලෝකයත් ලෝකයේ හටගත්ත සියල්ලත් අනිච්චයි. නමුත් ඒ එකක්වත් අපිට කැමති විදිහට පවත්වගෙන යන්න බැරි බව පේන්නෙ නැත්තෙ, අවිද්‍යාවෙන් මනස අන්ධ කරල තියෙන නිසා. ඒ නිසා තමයි කොහොම හරි පවත්වගෙන යන්න හිතාගෙන, සැප දෙන ප්‍රිය මනාප දේ වැඩි වැඩියෙන් ළඟට ගන්න උත්සාහ කරන්නෙ. නමුත් ඒවා ඒවාට උරුම ආකාරයෙන් විපරිණාමයට (කැමැත්තට පටහැනි පරිණාමය) පත්වෙලා ගෙවිල යන කොට, ඊට වැඩි දුක් ගොඩක් දීගෙනයි අවසන් වෙන්නෙ. මේ තමයි ලෝක ස්වභාවය. නමුත් මේ මොනවා විපරිණාමයට පත්වෙලා වැනසිලා ගියත්, ඒවා ඇස් ඉදිරිපිටම වැනසිලා යන බව පෙනුනත්, ඒවා තමන්ට අදාල නැති වෙනත් කෙනෙක්ගෙ නම් අපිට කිසිම දුකක් ඇති වෙන්නෙ නෑ. ඒ වගේම තමන්ගෙ වුනත් ඒවා එක්ක ඡන්දරාගයෙන් බැඳිල හිටියෙ නැත්නම්, ඒත් ඒ වස්තු විනාස වුනා කියල කිසිම දුකක් ඇති වෙන්න හේතුවක් නෑ.

ඒ කියන්නෙ, විඤ්ඤාණය නමැති විජ්ජාකාරයා මහා දුක් ගොඩවල් මායාවකින් වහල අපිට පෙන්වන්නෙ හරිම ප්‍රිය මනාප සැප ගොඩවල් විදිහට. මෙහෙම සසර පුරා රැවටිච්ච අපි, අනන්ත සංසාර දුකකට වැටෙන, ඒ සැප කියල පෙන්වපු දුක් ගොඩවල්ම නැවත නැවතත් පතන්නෙ අවිද්‍යාව නිසා කියලයි බුදු පියාණන් වහන්සේ දේශනා කළේ. ඔබ හොඳින් හිතල බලන්න, මෙච්චර කාලයක් සැප කියල ළං කරගත්ත දේවල් ප්‍රිය මනාප සැප විදිහට නේද මුලින්ම ආවෙ. නැතිව දුක් කරදර විදිහට ආවනම් ඒවායින් වහාම ඉවත් වෙනව මිසක් බොහොම ප්‍රිය මනාපෙන් ගිහින් බදාගන්නෙ නැහැනෙ. ඒ සැප දේවල්ම එහෙම ප්‍රිය මනාපෙන් ඇවිත් බලාපොරොත්තු නැති මොහොතක ජල, ගිනි, සුළං නිසා හෝ කාලයාගේ ඇවෑමෙන් හෝ විපරිණාමයට පත්වෙලා නොදන්වාම තමන්ට අහිමි වෙලා යනවා. ඒ අහිමි වීම් සිද්ධවෙන වාරයක් පාසා දුකට පත්වෙන්න සිද්ධ වෙන්නෙ ඇයි? ලෝකයේ හටගත්ත මේ මහා දුක් ගොඩවල් සැප දෙන වටිනා දේවල් විදිහට පේන්න මායාවකින් වහල හංගල තමයි ඉදිරියට දාන්නෙ. ඉතින් පුහුදුන් ලෝකයා මේ සැප විදිහට පෙනෙන මායා ගොඩවල්වලට ආසාවෙන් නොදැනුවත්වම බැඳෙනවා. මේ විදිහට දුක වහල සැප විදිහට පෙන්වන විජ්ජාකාරයගෙ මායාවට අහුවෙන්නෙත් අවිද්‍යාව නිසා.

අනිච්ච, දුක්ඛ, අනත්ත කියන ලෝක ස්වභාවය පේන්නෙ නැති තරමට අවිද්‍යාවෙන් අන්ධ වෙච්ච නිසාම, දුක හංගපු මේ මායා සැප ගොඩවල් තමන් සන්තක කරගන්න ඕන කියන තණ්හාවෙන් ලෝකයා පෙළෙන්න පටන් ගන්නවා. ඒ නිසා තණ්හාවෙන් අන්ධ වෙලා අර දුක හංගල, සැප වැඩි වැඩියෙන් රැස් කරගන්න තමයි පෙළඹෙන්නෙ. නමුත් තමන් නොදැනුවත්වම ඊට සමාන සැඟවිච්ච දුකකුත් ලැබෙන නිසා, සංසාරය පුරාම මේ දුක විඳින්න සිද්ධවීම නවත්වන්න බෑ. ඒ කියන්නෙ, තමන් කැමැත්තෙන් පතපු සැප, දුක දීගෙන නොදන්වාම ගෙවිල යනවා. කොහොමටවත් එනවට අකමැති දුක අනන්ත දුක් දීගෙන නොදන්වාම ළඟා වෙනවා. **කැමති සැප යනවා, අකමැති දුක එනවා. මේ තමයි ලෝක ධර්මතාවය.**

මේ අදහස මූලිකව වටහා ගන්න පුංචි උදාහරණයක් ගන්න පුළුවන්. තරුණයෙක් තරුණියක් සමග විවාහ වෙන්නෙ බොහොම සතුටෙන් හිනා වෙලා මිසක් අඬල වැලපිලා නෙවෙයි. ඒ විදිහට විවාහ වෙන්නෙ තමන්ට මහා වටිනා වස්තුවක් ලබා ගෙන සැප විඳින්න. කිසිම විදිහකින් දුකක් කරදරයක් වෙනවට කිසිම කැමැත්තක් නෑ. ඒත් අනේ මාසයක් ගියේ නෑ, ජීවිතය පුරා සැප විඳින්න ගෙනිච්ච තරුණියගෙ/ තරුණයගෙ ඇඟ පුරාම කුෂ්ඨයක් මතුවෙලා කහන්න ගන්නවා. දැන් ඒ සැප වස්තුව ඒ දෙන්නටම මහා දුකක් දෙනවා. ඒ පතපු සැප යනවට අකමැති වුනත්, මහා දුකක් දීගෙන නොදන්වාම ගිහින්. දුක එනවට කොච්චර අකමැති වුනත් ගෙනාපු සැප අස්සෙ තිබිල දුක ඇවිත්. ඒත් තමන් එදා හිනා වෙලා සැප ගොඩක් කියල වැළඳගෙන තියෙන්නෙ දුක් ගොඩක් බව නොදන්නකම තමයි අවිද්‍යාව කියන්නෙ.

කෙනෙක් කියාවි, ඉතින් තරුණයට/ තරුණියට කුෂ්ඨයක් හැදුනට ඒක ඔච්චර ලොකු දෙයක්, දුකක් වෙන්නෙ කොහොමද, බේත්වලින් හොඳ කරගන්න පුළුවන්නෙ කියල. එහෙම හිතුවත් ඒක හොඳ කරගන්නත් වෙහෙස මහන්සියක් කාලයක් මුදලක් වැය කරන්න වෙනවා. එතෙක් කල් දුකක්ම විඳින්න වෙනවා. එහෙම ඉඳල ඒකෙනුත් ගොඩ ඇවිත් දරුවෙක් ලැබෙන්න ගන්නවා. ගෙනාපු බිරිඳට දැන් මොකද වෙලා තියෙන්නෙ? තුන් වේල උයල රසට කන්න දෙයි කියල හිතල ගෙනාපු සැප දෙන වස්තුව දැන් තනියම මොකවත් කරගන්න බැරි තත්වයට පත්වෙලා. මහත්තය මාස ගණනක්ම උයනවා, පිහිනවා, නෝනට කවනවා. මහත්තය දෙන්නගෙම රෙදි හෝදනවා. සැප ගොඩ අස්සෙ තිබිල මහා දුක් කන්දරාවක් දෙන්නටම ඇවිත්. මේ වගේ මහා දුක් කන්දරාවක් ප්‍රිය

මනාප සැපක් විදිහට වැළඳ ගැනීමේ ප්‍රතිඵලය වෙච්ච ඊළඟ බලාපොරොත්තුව මහා වටිනා සම්පත් ගොඩක් කියල එකතු කරල දරුවෙක් විදිහට දෙන්නට හම්බ වෙනවා. දැන් දෙන්නා බලාපොරොත්තු වෙච්ච අනාගත සැප කිසිම අඩුවක් නැතිව දිගටම දෙන්න එපැයි. මාසයක් ගියා, දෙකක් ගියා, දරුව බලා ගත්ත අතේ. අනේ දෙන්නම පැතුව අනාගතේ සැප දෙන වස්තුවේ ඇස් දෙකම පේන්නෙ නෑ. එදා ඉඳන් දරුව දකින දකින වාරයක් පාසා පපුව පත්තු වෙන්නෙ සැප දෙන්නද? එහෙම නැත්නම් දරුවගෙ කන් ඇහෙන්නෙ නෑ. අනේ අපිට කන් ඇහෙන්නෙ නැති දරුවෙක් නේද ලැබිල තියෙන්නෙ! අපිට ගොලු දරුවෙක් හම්බ වෙලා තියෙන්නෙ! මෙහෙම කියල දුක් විඳවන්න, ජීවිත කාලෙම දුක් දෙන්න අර සැප වස්තුවම මූලික වෙලා.

මේ විදිහට අවුරුද්දක් දෙකක් ගෙවිල ගියා. දෙන්නට දරුවොත් ලැබිල. අර සියලු දුක් ගොඩවල් සැප විදිහට හිතාගෙන ගෙවල දැම්මෙ අනාගතේ ගැන හිතල. දැන් ඉතින් “දුක සැප නිති පෙරලේ - රිය සක ලෙස ලෝකේ” කියල හිත හදා ගන්නවා. ජීවිතේ එහෙම නේන්නම්! ටිකක් දුක් විඳින්නෙ නැතිව කොහොමද සැප විඳින්නෙ! මේ දුක් විඳින්නෙ අපේ සරුසාර අනාගතේ වෙනුවෙන් කියල තමන්ගෙ හිත තමන්ම රවට ගන්නවා. හිතල බලන්න, මේ විඳින්නෙ කොච්චර දුකක් වුනත්, තමන් දුකක් විඳින බව නොදැන රයක් දහවලක් නැතිව මහා කලබලේකින් එහෙ දුවනවා මෙහෙ දුවනවා, වෙහෙසෙනවා. ඒ මොනවටද? තව තවත් සැප වැඩි කරගන්න. හවස ආරංචි වෙනවා වැඩියෙන් සැප ගන්න ලක්ෂ ගාණක් දීල ගෙනාපු අලුත්ම වාහනේ හැප්පිලා මහත්තය එතැනම මළා කියල. දැන් ඉතින් මේ අත්භවය පුරාවටම ඒකෙ දුක විඳින්න වෙනවා.

නමුත් මේ සියලු සැප සම්පත්, මුදල් හදල්, ගේ දොර, වතු පිටි තමන් සන්තකව තියෙද්දි, ඒවා ගැන ඡන්දරාගයකින් බැඳෙන්නෙ නැතිව, තමන්ට පුළුවන් හැම වෙලාවෙම ලෝක සත්වයාට උදව් උපකාර කරන්න, පිනක් දහමක් කරගන්න මේ ධනය මට මහා පිටිවහලක් වුනා කියල හිතල, යමෙක් මේවා පරිහරණය කළොත්, ඒවා මොන ආකාරයෙන් විපරිණාමයට පත් වුනත්, විපරීත වෙලා ගෙවිල වැනසිලා ගියත්, අනේ වැනසුනා කියල අර කලින් වගේ මහා දුකක් දාහයක් හටගන්න හේතුවක් නෑ. මොකද මේවා තියෙන නිසා පරිහරණය කරනව මිසක්, රැක ගැනීමේ ආසාවෙන්, තණ්හාවෙන් රකිනවා හෝ පරිහරණය කරනවා හෝ නෙවෙයි.

දැන් මේ කියන්නෙ ධෛර්යවන්ත මනුස්සයෙක් විදිහට දැහැමිව හරිහම්බ කරගෙන දියුණු වෙන්න එපා, විවාහ වෙන්න එපා, දරුවො හදන්න එපා කියල නෙවෙයි. එහෙම දියුණු වෙලා සක්විති රජ වුනත් වරදක් නෑ. යහපත් දරුවො සියයක් සමාජයට දුන්නත් වරදක් නෑ, හොඳයි. නමුත් පළමුව මෙන්න මේ සැප තුල සැඟවිච්ච දුකක් තියෙන බව දැන ගන්න. මේ විදිහට දුක්ඛ ආර්ය සත්‍යය අවබෝධ කරගෙන (ඒත් එක්කම ඉතිරි සත්‍ය තුනත් අවබෝධ වෙනවා) ඉස්සෙල්ලම සතර අපායෙන් නිදහස් වෙන්න කටයුතු කරගන්න.

**බලන්න මේ ජීවිතය මොන තරම් අවිනිශ්චිතද? බත් පිඩක් මුවට අරගෙන ගිලින පමාවකින්, හුස්මක් ඉහළ ඇදල පහළ හෙළන පමාවකින් මැරිල වැටෙන්න පුළුවන්.** ඉතින් කොහොමද ඔබට සැප විඳින්න වෙලාවක් තියෙනව කියල විස්වාස කරන්නෙ? මේ කතාවට කෙනෙක් කියන්න පුළුවන්, මොන උප්පරවැට්ටියක් දාල හරි, ගාණක් හොයාගෙන, ඉන්න පුළුවන් ටික දවසහරි කාල බීල විනෝදෙන් ඉන්නෙ නැතිව වෙන මොනව කරන්නද කියල.

මේ තමයි පෘතජ්ජන ලෝකයා හිතන විදිහ. හෙට මැරුනත් හිතට සැපයි අද ජොලි කරලා. මේ ලෝකය කවුරු කිව්වත් නිච්චයි (කැමති සේ පවතිනවා/ නිසියි), සුඛයි, අත්තයි (සාරයි) කියල මිසක් අනිච්චයි (කැමති සේ නෑඈ/ අනිසියි), දුක්ඛයි, අනත්තයි (අසාරයි) කියල හිතන්න ඒ අය කැමති නෑ. මේ සිතිවිල්ලෙන් තමයි අද රජවරු ඉන්නෙත්. එදා සක්විති රජ වෙලත් ලෝකය ගැන නොදැන මෙහෙම කටයුතු කරගෙන හිටපු නිසා තමයි අද වලිගය වන වනා තණකොළ බුදින්න සිද්ධ වෙලා තියෙන්නෙ. අපේ ඇස් ඇරවන්නයි බුදු පියාණන් වහන්සේ මේ ගෙරි රැලක් පෙන්වල සක්විති රජවරුන්ටත් යන කල දසාව ගැන කියල තියෙන්නෙ. අපිටත් යම් දවසක සිද්ධවෙන මේ අනතුරින් ගැළවෙන හැටි තමයි කියල දීල තියෙන්නෙ.

බුදු පියාණන් වහන්සේ පෙන්වපු මේ දුක් ගිනි දෙන අනතුර දැන්වත් දැක්කද? එහෙම දැකපු කෙනෙක් වෙනුවෙනුයි මේ දහම කියන්නෙ. ඒ අනතුර දැකපු කෙනෙකුට, සතර අපා දුකෙන් මිදෙන්නෙ නැතිව කවදාවත් සැනසීමට පත් වෙන්න බෑ කියන අවබෝධය ලැබෙනවා. එහෙනම් **සතර අපායෙන් සදහටම මිදෙන්න ලෝකයේ අසාරත්වය දකින්නම වෙනවා.** ලෝකයේ අසාරත්වය දැක්කොත්, අසාර ලෝකය පරිහරණය නිසා දුක හටගන්න බවත් දකිනවා. ඒ වගේම සැප දෙන ප්‍රිය මනාප වස්තුවල දුක හංගල තියෙනවයි කියන කාරණයත් දකිනවා. **මේ සැප තුල තමයි දුක සැඟවිලා තියෙන්නෙ කියන දැකීම නිසා, දුකට හේතුව ලෝකය ඡන්දරාගයෙන් පරිහරණය කරන්න යාම මිසක් වෙන එකක් නෙවෙයි කියන ඇත්ත දකිනවා.** මේවා පසුපස යන්න පෙළඹෙන්නෙ ලෝකයේ හටගත්ත දේවල් වටිනවයි කියන සිතිවිල්ල නිසාම බව අවබෝධ වෙනවා. මේ අසීමිත වටිනාකම නිසාම තණ්හාව (තැන හාවීම) ඇති වෙනවා. දැන් දුකත්, දුකට හේතුවත් කියන දෙකම ඇති වෙලා තියෙන්නෙ අවිද්‍යාවත් තණ්හාවත් කියන මුලා මානසිකත්වය නිසා බව අනුමානයෙන් හෝ දැකලයි ඉන්නෙ.

මේ අවබෝධය ලැබුනෙ, මේ ලෝකයත් ලෝකයේ හටගත්ත සියල්ලත් අනිච්ඡයි දුක්ඛයි අනත්ථයි කියන බුදු වදන අනුව විමසා බැලීම නිසා. මේ යථාවබෝධය නිසා කෙනෙක් තීරණයක් ගන්නවා. ඒ අසාර දේ අසාර විදිහට දැකල, අනිසි දේ අනිසි විදිහට දැකල, මේ අනිච්ච දුක්ඛ අනත්ත දේවල් ඡන්දරාගයෙන් යුතුව පරිහරණය කිරීමේ දෘෂ්ඨියෙන් ඉවත් වෙලා, නිවන් මග පූර්ණ කරන කල් පැවැත්ම උදෙසා අවශ්‍යතාවයට විතරක් පරිහරණය කරනවා කියන තීරණයට බැස්සෙ, මෙතෙක් පැවති අවිද්‍යාවත් තණ්හාවත් යම් තරමකට හෝ ක්ෂය වෙලා ගිය නිසා. මේ තමයි නිවන් මගේ පළමු පියවරට පත්වීම. ඒ වගේම ලෝකයේ අසාරත්වය දැක්ක නිසා ලෝකයෙන් මිදීම සාරයි කියල දකිනවා. මේ විද්‍යා දැක්ම නිසා තමයි සම්මා දිට්ඨියට පත් වුනේ. මේ ආකාර දැක්මකින් තමයි, නැවත ලෝකයට දෘෂ්ඨි වශයෙන් නොඇලෙන සෝවාන් මාර්ග අනුගාමිකයා සහ ඵල ලාභියා කියන සතර අපායෙන් නිදහස් වුන ආර්ය පුද්ගලයා බිහිවෙන්නෙ.

*පූජ්‍යපාද වහරක අභයරතනාලංකාර තෙරුන් වහන්සේ විසින් යළි මතු කළ සැඟවුනු දහම් කරුණු ඇසුරෙන් සකස් කළේ:*

**වෑබඩ සිරිසේන**




# මස් මාංස අනුභවය සම්බන්ධයෙන් වූ මතභේදාත්මක ගැටළුව නිවැරදි දහම් ඇසින්

2 කොටස

මේ සම්බන්ධයෙන් පෙළ දහමට අනුකූලව විග්‍රහ කළ දීර්ඝ ලිපියක් පසුගිය කලාපයෙන් ඉදිරිපත් කළා. විශේෂයෙන් පවත්ත මස් මාංස සහ අසාධාරණයෙන් ගොඩනගා ගත්ත මස් මාංස අතර වෙනස ඒ ලිපියෙන් පැහැදිලි කළා.

දැන් ඊළඟට තවත් ප්‍රශ්නයක් එන්න පුළුවන්. බුදුන් වහන්සේ දේශනා කරල තියෙනවා සප්ත ප්‍රණීතයෙන් දන් දෙන්න කියල. ඒ කියන සප්ත ප්‍රණීතයට මස් මාංසත් අයිතියි නේද කියන ප්‍රශ්ණය තමයි ඒ. කාරණය ඇත්ත. මස් මාංස කියන්නෙ කොහොමත් ප්‍රණීත දෙයක්. ප්‍රණීත දෙයින් දන් දෙන්න කියලත් දේශනා කරල තියෙනවා. නමුත් මෙතැනදි භික්ෂූණ් වහන්සේලාට කැප වෙන්නෙ, පසුගිය ලිපියෙන් පැහැදිලි කළ ආකාරයට, දානය උදෙසා නොමරන ලද සතුන්ගෙන් ලබාගත්ත ත්‍රිකෝටික පාරිසුද්ධ මාංසය. අන්න ඒ කැප මසින් දන් දීම, එහෙම නැත්නම් ඊටත් වඩා සියලු ආකාරයෙන් පාරිසුද්ධ පවත්ත මාංසයෙන් දන් දීම තමයි මෙතැනදි පෙන්වල තියෙන්නෙ. එහෙම නැතුව කොහොම හරි මස් මාංසයෙන් දන් දෙන්න කියන එක නෙවෙයි මේ කියන්නෙ. දෙනව නම් දෙන්න ඕන පවත්ත මාංසයෙන්, එහෙම නැත්නම් ත්‍රිකෝටික පාරිසුද්ධ මාංසයෙන්.

එතැනදි ඒ මස් මාංස ත්‍රිකෝටික පාරිසුද්ධ මාංසයට අයිති වෙනවද නැත්ද කියන කාරණය විමසා බැලීමේ වගකීම තියෙන්නෙ ඒ දානයට සහභාගි වෙන භික්ෂූණ් වහන්සේලාට. මොකද භික්ෂුන් වහන්සේලාට වළඳන්න කැපයි කියල අනුදැන වදාරල තියෙන්නෙ ත්‍රිකෝටික පාරිසුද්ධ මාංසය. ඒ නිසා ඒ දානය ගැන තමන්ට සැක නම් දායකයන්ගෙන් අහල දැනගන්න ඕන, මේ මස් මාංස ලබා ගත්තෙ කොහොමද කියල. වෙනත් විදිහකින් කියනවනම්, **දන් දෙන දායක පිරිස විසින් දානය උදෙසා සතුන් මැරීම, මැරවීම, මරන්න අනුබල දීම, මැරීම වර්ණනා කිරීම කියන මේ කාරණා හතරෙන් එකකටවත් සම්බන්ධ නොවී ලබාගන්න මස් මාංසය තමයි භික්ෂූන් වහන්සේලාට වළඳන්න කැප. යම් කිසි විදිහකින් ඒ දන් දෙන දායකයො, දානය උදෙසා ඒ කාරණා හතරෙන් එකකට හෝ සම්බන්ධ වෙලා සකස් කරගත්ත මස් මාංසයක් කියල මොන ක්‍රමයකින් හෝ භික්ෂූණ් වහන්සේලාට අහන්න දකින්න ලැබුනනම්, ඒ ගැන අංශුමාත්‍රයක හෝ සැකයක් ඇති වුනා නම් ඒක වළඳන්න කැප නෑ, සුදුසු නෑ.** ඒ නිසා ඒ ගැන හොඳට විමසල බලල තහවුරු කරගෙන, දයානුකම්පාව මුල් කරගෙන එබඳු මස් මාංස වැළඳීමෙන් වැළකීම භික්ෂූණ් වහන්සේලාගේ යුතුකමක්.

ඒ වගේම දායකයොත් දැනගන්න ඕන, දානයට මස් මාංසත් සම්බන්ධ කරනව නම්, ප්‍රාණඝාත අකුසල කර්මයට සම්බන්ධ කාරණා හතරෙන් එකකටවත් සම්බන්ධ නොවී දන් දෙන්න. එතකොට දායකයන්ගෙ පැත්තෙනුත් පාරිසුද්ධයි. ඒ වගේම භික්ෂූණ් වහන්සේලා දයානුකම්පාව මුල් කරගෙන ත්‍රිකෝටික පාරිසුද්ධ නොවන මස් මාංස ප්‍රතික්ෂේප කළාම දන් දෙන දායක පිරිස ප්‍රාණඝාත අකුසල කර්මයට සම්බන්ධ වීම වැළැක්වෙනවා. එතකොට භික්ෂූණ් වහන්සේලා තුන් කෙළවරකින් පිරිසිදුයි, ත්‍රිකෝටික පාරිසුද්ධයි.

සමහර විට ඒ දන් දෙන දායක පිරිස සත්තු මරන අය වෙන්නත් පුළුවන්. හැබැයි ඒ අය දානය උදෙසාම මස් මාංස ලබාගන්න කියල ප්‍රාණඝාත අකුසල කර්මයට මොන ආකාරයකින් හෝ සම්බන්ධ වුණාද කියල විමසල බැලීමෙන් පසුවත්, භික්ෂූණ් වහන්සේලාට මොන විදිහකින් හෝ එහෙම සම්බන්ධයි කියල අහන්න දකින්න ලැබුණෙ නැත්නම්, ඒ ගැන සැකයකුත් නැත්නම්, භික්ෂූණ් වහන්සේගෙ පැත්තෙන් ත්‍රිකෝටික පාරිසුද්ධයි. එතකොට ඒ මස් මාංස කැපයි. සමහරවිට උන්වහන්සේ සැක හැර දැනගන්න දායකයන්ගෙන් ඒ ගැන අහනකොට, ඒ අය දානය උදෙසා මස් මාංස ලබාගන්න ප්‍රාණඝාතයට සම්බන්ධ වෙලා ඉඳල, ඒත් එහෙම නෑ කියල බොරු කිව්වොත්, ඒ දායකයන්ගෙ කීම අවංකවම විස්වාස කරල උන්වහන්සේ ඒ මස් මාංසය වැළඳුවොත් ඒත් උන්වහන්සේගෙ පැත්තෙන් ත්‍රිකෝටික පාරිසුද්ධයි. ඒ කියන්නෙ ඒ මස් මාංසය සුද්ධයි කියන එක නෙවෙයි. ඒ මස් මාංසය අසාධාරණ වුණත්, භික්ෂූණ් වහන්සේ තුන් පැත්තකින් පිරිසිදුයි කියන එකයි. නමුත් ඒ දායකයො ඒකෙන් අවැඩක්, පාප කර්මයක් කරගත්ත වෙනවා. එකක් ප්‍රාණඝාත අකුසල කර්මයට සම්බන්ධ වීම. අනෙක භික්ෂූණ් වහන්සේට බොරු කියල රවටල අකැප දෙයක් වළඳන්න සැලැස්වීම. හැබැයි දන් දීම නිසා ඇතිවෙන පින නැති වෙන්නෙ නෑ. ඒ නිසා මෙතැනදි කල්ල සුක්ඛං කල්ල සුක්ඛ විපාකං කියන පින් පව් මිශ්‍ර කර්මයක් තමයි දායකයන්ට සිද්ධ වෙන්නෙ.

ඒ වගේම දානය උදෙසාම කියල සකස් කරල නැති, වෙළඳසැල්වල විකුණන්න තියෙන මස් මාංසත් ත්‍රිකෝටික පාරිසුද්ධ මාංසයට අයිතියි. මොකද ඒ සතුන්ගෙ ප්‍රාණ ඝාතයට භික්ෂූන් වහන්සේලාට දන් දෙන දායකයො කිසිම ආකාරයකින් (හතර ආකාරයෙන්ම) සම්බන්ධ නෑ. ඒවා දානය උදෙසා කියල සකස් කරපු මස් මාංසත් නෙවෙයි. ඒ බව දැක්කෙත් නැත්නම්, ඇහුවෙත් නැත්නම්, සැකයකුත් නැත්නම් ඒක ත්‍රිකෝටික පාරිසුද්ධයි. **නමුත් වර්තමානයේ ඒ විදිහට විකුණන්න තියෙන මස් මාංස වුනත් පවත්ත මාංස නොවන නිසා, සතුන්ට වද හිංසා කරල මරල අසාධාරණයෙන් ගොඩ**

**නගාගත්ත මස් මාංස නිසා, යම් කිසි භික්ෂූන් වහන්සේ නමක් ඒ කාරණය දැනගෙන දයානුකම්පාව මුල් කරගෙන, තවත් සත්ව ඝාතනයන්ට අනුබල වීමක් හෝ නොවෙන්න, වැඩි යහපත උදෙසා ඒවත් වැළඳීමෙන් වළකිනවනම් ඒක උතුම් ගුණයක්. ඒ වගේම දායකයන්ගෙ පැත්තෙන් ගත්තමත්, දයානුකම්පාව මුල් කරගෙන, කිසිම ආකාරයකින් අසාධාරණ සම්බන්ධයක් නැති පවත්ත මාංසයෙන් දන් දෙන්න පුළුවන්නම් ඒක හැම අතින්ම යහපත්. නමුත් ඒ වගේ පවත්ත** මාංස අද වෙනකොට හොයාගන්න බොහොම දුර්ලභයි. ඒ නිසා **වෙළඳ සැල්වල විකුණන්න තියෙන අසාධාරණ විදිහට ගොඩනගා ගත්ත මස් මාංසවලට, දන් දෙන දායකයන්ගෙ සම්බන්ධයක් නොතිබුනත්, හදිසි අසනීපයකට බෙහෙතක් වශයෙන්, එහෙම නැත්නම් පෝෂණ ඌණතාවයක් ඇතිවෙච්ච අවස්ථාවක් වගේ කරගන්න දෙයක් නැතිකමට, නිවන් මග පූර්ණ කරගන්න කය පවත්වා ගැනීමේ අවශ්‍යතාවයට විතරක්, මේ මස් මාංසයි කියන රස තෘෂ්ණාවෙන් තොරව ප්‍රත්‍යවේක්ෂා කරල ගන්නව හැර, අනික් අවස්ථාවල දයානුකම්පාව මුල් කරගෙන ඒ මස් මාංසවලිනුත් වළකින්න පුළුවන් නම් ඒක උතුම් ගුණයක්. ඒ ගුණය ලෝකයාගේ යහපතටත්, තමන්ගෙ නිවන් මග පූර්ණ කරගන්නත් උපනිශ්‍රයක් වෙනවා.**

හැබැයි පවත්ත මස් මාංස නොවන ත්‍රිකෝටික පාරිසුද්ධ මස් මාංසත් භික්ෂුන්ට කැපයි කියන කාරණය ඔප්පු කරන්න පෙළ දහමේ සාක්ෂි තියෙනවා. (විනය පිටකයේ භේසජ්ජ ඛන්ධකය) උදාහරණ විදිහට කනේ අමාරුවක් හැදුන එක්තරා භික්ෂුණී වහන්සේ නමකට, කකුළුවො මරල ජීවත්වෙන මිනිස්සු ඉන්න ගමක පිණ්ඩපාතෙ වඩින්න කියල බුදුන් වහන්සේ අනුදැන වදාරල තියෙනවා. ඒ අසනීපයට ඖෂධයක් වශයෙන්. උන්වහන්සේ ඒ විදිහට ඒ ගමේ පිණ්ඩපාතෙ වැඩියම ඒ මිනිස්සු කකුළු මස් පූජා කරල, ඒ මස වළඳල උන්වහන්සේගෙ කනේ අමාරුවත් හොඳ වුනා කියනවා. එතකොට ඒ මස පවත්ත නෙවෙයි. මොකද මරල සකස් කරගත්ත මසක්. හැබැයි ත්‍රිකෝටික පාරිසුද්ධයි. මොකද දන් දීම උදෙසා ඒ මිනිස්සු කකුළුවො මැරුවෙ නෑ. තමන්ගෙ ජීවිකාව විදිහටයි කකුළුවො මැරුවෙ. උන්වහන්සේ කලින් දන්වල පිණ්ඩපාතෙ වැඩියෙත් නෑ. පිණ්ඩපාතෙට කකුළු මස් ඕන කියල එහෙම කියල ඉල්ල ගත්තෙත් නෑ. පිණ්ඩපාතෙ වඩිනකොට ලැබුනා. හැබැයි උන් වහන්සේ දන්නවා, මරපු කකුළුවන්ගෙ මසින් තමයි මේ දානෙ දුන්නෙ කියල. නමුත් දානය උදෙසා මැරුවෙ නැති නිසා, ඒ වගේම දානය උදෙසා මැරුව කියල මොනයම් විදිහකින් හෝ දැක්කෙ නැති නිසා, ඇහුවෙ නැති නිසා, ඒ ගැන සැකයකුත් නැති නිසා, ඒක ත්‍රිකෝටික පාරිසුද්ධයි. ඒ නිසා කැපයි.

ඒ වගේම ඒ කාලෙ වැඩ හිටපු එක්තරා භික්ෂූණී වහන්සේ නමකට තිබුණ අමනුස්ස රෝගයක් දුරු කරගන්න අමු මස් වළඳපු කතාවකුත් විනය පිටකයේ භේසජ්ජ ඛන්ධකයේ 529 පිටුවේ සඳහන් වෙනවා. උන්වහන්සේට කවුරු හරි දැනුම් දීල තිබුණා, ලේ තැවරිච්ච අමු මස් වැළඳුවම ඒ අමනුස්ස රෝගය දුරු වෙනව කියල. ඒ නිසා උන්වහන්සේ ඌරො මරන තැනකට පිණ්ඩපාතෙ වැඩියම ඒ අය අමු ඌරු මස් පූජා කළා කියනවා. උන් වහන්සේ ඒක අමුවෙන්ම වැළඳුවම අමනුස්ස රෝගය දුරු වුනා කියලත් සඳහන් වෙනවා. ඊට පස්සෙ මේ කාරණය භික්ෂූණී වහන්සේලාට ආරංචි වෙලා බුදුන් වහන්සේට දැනුම් දුන්නම, අමනුස්ස රෝගවලට අමු මස්, අමු ලේ අනුදැන වදාරම් කියල දේශනා කරල තියෙනවා. එතකොට ඒ එක්තරා බෙහෙතක් වශයෙන්.

ඒ වගේම දෙව්දත් තෙරුන් බුදුන් වහන්සේගෙන් ඉල්ලීම් 5 ක් කළා. එයින් එකක් තමයි, දිවි ඇති තෙක් භික්ෂූණී වහන්සේලා මස් මාංස අනුභවයෙන් වැළකිය යුතුයි කියන ඉල්ලීම. එතකොට පවත්තද, ත්‍රිකෝටික පාරිසුද්ධද කියල කතාවක් නෑ. මොනම මසක්වත් අනුභවයෙන් වැළකිය යුතුයි කියලයි ඉල්ලුවෙ. එතකොට බුදුන් වහන්සේ දේශනා කළේ, කැමති කෙනෙක් ත්‍රිකෝටික පාරිසුද්ධ මාංසය වළඳත්වා, කැමති කෙනෙක් නොවළඳත්වා කියල. එතකොට කැමති කෙනෙකුට අවශ්‍ය නම් ත්‍රිකෝටික පාරිසුද්ධ වුණත්, පවත්ත මාංස නෙවෙයි නම්, දයානුකම්පාව මුල් කරගෙන ඒකත් වැළඳීමෙන් වැලකිලා ගුණයක් වඩන්න පුළුවන්.

පාංශුකූල මාංසය කිව්වත් පවත්ත මාංසය කිව්වත් ඒ දෙකේම අසාධාරණ සම්බන්ධයක් නෑ. **පාංශුකූල මස කියන්නෙ විසිකරල දාපු මස, අහකට දාපු මස, හිමිකාරයෙක් නැති මස. ඒක පස් වෙලා යනවා. මරල විසිකරල දැම්මත් ඒක විසි කළාට පස්සෙ පාංශුකූලයි. ඒ මස එක්කො සතෙක් කාල යනවා, නැත්නම් කුණු වෙලා යනවා. ඒ නිසා ඒ මස තවත් කෙනෙක් ගත්ත කියල තවත් සත්තු මැරෙන්න/ මරන්න හේතු වෙන්නෙ නෑ.** ඒ කියන්නෙ සත්ව ඝාතනයට අනුබල දීමක් හෝ අනුබල වීමක් හෝ වෙන්නෙ නෑ. ඒ විදිහෙ පාංශුකූල මසක් යම් කිසි පුද්ගලයෙක් විසින් ලෙඩකට බේතක් වශයෙන් හෝ අවශ්‍ය වෙලාවට ආහාරයට ගන්න හෝ විකුණ ගන්න හෝ තමන්ගෙ සන්තකයට ගත්තම ඒකත් පවත්ත මාංසයක්. නැවතත් ඒක මට එපා කියල විසි කළොත් පාංශුකූල වෙනවා. හැබැයි ඒ මස, සතාව මරපු කෙනා විසින් විසි කරන්නෙ නැතිව ඔහු විසින්ම මුදල්වලට වික්කොත් හෝ තමන්ගෙ ආහාරය පිණිස ගත්තොත් හෝ ඒක පවත්ත නෙවෙයි. එතකොට ඒක අසාධාරණ මස් මාංසයට වැටෙනවා.

මේ කාරණයටත් උදාහරණයක් පෙළ දහමෙන් පෙන්වන්න පුළුවන්. එක්තරා හොරු කණ්ඩායමක් ඒ අයගෙ අවශ්‍යතාවයකට සතෙක් මරල, ප්‍රධාන හොරා ඒකෙන් මස් කොටසක් අරගෙන, ගහක් යට සමවතින් වැඩ හිටපු උප්පලවණ්නා තෙරණිය ආසන්නයේ තිබිච්ච ගස් දෙබලක එල්ලල, මේ මස, මහණ වේවා , බමුණු වේවා, යමෙක් දකිනම් කැමති කෙනෙක් අරගනිත්වා කියල හඬ නගල කියල යන්න ගියා. උප්පලවණ්ණා මෙහෙණිය ඒ මස අරගෙන මෙහෙණි ආරාමයට ගිහින් උයාගෙන බුදුන් වහන්සේට පූජා කරන්න කියල ඍද්ධි බලයෙන් වේළුවනාරාමයට වැඩියා. එතකොට බුදුන් වහන්සේ පිණ්ඩපාතෙ වැඩල හිටියෙ. ඒ නිසා බුදුන් වහන්සේට පිළිගන්වන්න කියල ආරාමයේ වැඩ හිටපු වෙනත් භික්ෂූණී වහන්සේ නමකට බාර දුන්නා. හැබැයි ඒ මස් ව්‍යංජනය බුදුන් වහන්සේ පිළිගත්තද නැත්ද කියල සඳහන් වෙන්නෙ නෑ. නමුත් රහත් මෙහෙණියක් තමයි අර විදිහට කැමති කෙනෙක් ගන්න කියල එල්ලල ගියපු, හිමිකාරයෙක් නැති මස අරගත්තෙ. (පාරාජිකා පාලි - 522 පිටුව - චීවර පටිග්ගහන සික්ඛාපද නිධාන කතාව)

එතකොට ඒ මස එක පැත්තකින් පාංශුකූලයි. මොකද මරපු සතෙක්ගෙ **මසක් වුණත්, ඒ මරපු අය විසින් කැමති කෙනෙක් ගන්න කියල තමන්ගෙ සන්තකයෙන් ඉවත් කළාට පස්සෙ ඒක පාංශුකූලයි. එතැනින් පස්සෙ ඒකෙ අසාධාරණ සම්බන්ධය ඉවරයි. මොකද ඒක කවුරුහරි ගත්ත කියල තවත් සත්ව ඝාතනයකට අනුබල වීමක් වෙන්නෙ නෑ.** ඒ වගේම ඒ මස අනික් පැත්තෙන් ත්‍රිකෝටික පාරිසුද්ධයි. මොකද දානය උදෙසා මැරුවෙ නෑ. ඒ බව දැක්කෙත් නෑ, ඇහුවෙත් නෑ, සැකයකුත් නෑ. ඉතින් මේ කියන කාරණය

දෘෂ්ටියකට වැටෙන්නෙ නැතිව හේතු ඵල න්‍යාය ධර්මයට අනුව අවස්ථානුකූලව නැණ නුවණින් තේරුම් ගත යුතුයි.

මීලඟ වැදගත් කාරණය තමයි, පවත්ත වුනත්, ත්‍රිකෝටික පාරිසුද්ධ වුනත්, භික්ෂූන් වහන්සේලා විසින් නොවැළඳිය යුතු මස් වර්ග 10 ක් නම් කර තිබීම. ඒවා තමයි මිනී මස්, අලි මස්, අශ්ව මස්, වළස් මස්, කරබානා වළස් මස්, දිවි මස්, සිංහ මස්, ව්‍යාඝ්‍ර මස්, සර්ප මස් සහ බලු මස්. මේ 10 න් පළමුවෙන්ම තහනම් කළේ මිනී මස්. (සුප්පියා බණවර - විනය පිඨකය - මහා වග්ග පාලිය 2 - 6 භේසජ්ජ ඛන්ධකය - 554 පිටුව)

එක්තරා භික්ෂූන් වහන්සේ නමකට ඇති වෙච්ච ශරීරයේ පෝෂණ දුර්වලතාවයකට මස් වළඳන්න කියල වෛද්‍යවරයෙක් නියම කරල තිබුණා. සුප්පියා උපාසිකාව කියන්නෙ නිතරම ඇප උපස්ථානවලට කැප වෙලා හිටපු දායිකාවක් නිසා, ඒ හිමිනම බෙහෙතක් වශයෙන් මස් ව්‍යංජනයක් හදාගෙන එන්න කියල ඇයගෙන් ඉල්ලීමක් කළා. ඒ පොරොන්දුව ඇය බාර අරගෙන හැම තැනම ගිහින් පවත්ත මාංසයක් හෙව්වත් හොයාගන්න බැරි වුණා. මේ නිසා ඇය තමන්ගෙ කළවයෙන් මස් කෑල්ලක් කපල උයාගෙන අහවල් භික්ෂූණ් වහන්සේට දෙන්න කියල දාසියකට බාර දුන්නා. ඇයි සුප්පියා උපාසිකාව ආවෙ නැත්තෙ කියල ඇහුවොත්, අසනීප වෙලා නිදාගන්න බව කියන්න කියලත් කිව්වා. බුදුන් වහන්සේ මේ සිද්ධිය බුදු ඇසින් සම්පූර්ණයෙන්ම දැක්කා. ඊළඟට ඒ දානය මේ භික්ෂූන් වහන්සේ විසින් වැළඳුවාට පස්සෙ බුදුන් වහන්සේ වැඩල උන්වහන්සේව මුණගැහිල ඇහුවා, මහණ අද දානයට මොනවද ගත්තෙ කියල. වෛද්‍යවරයෙක්ගෙ උපදෙස් මත මස් ව්‍යංජනයක් සුප්පියා උපාසිකාව විසින් එවල තිබුණ කියල ඒ හිමියන් උත්තර දුන්නා. මොන මස්ද ගත්තෙ කියල ඇහුවම, ඒක නම් ඇහුවෙ නෑ කිව්වා. මහණ නුඹ අරගෙන තියෙන්නෙ සුප්පියා උපාසිකාව කළවයෙන් කපල දුන්න මිනී මස්, ඇයි මෝඝ පුරුෂය මසක් ගන්න පෙර මොන මස්ද කියල අහන්න තිබුණනේ කියල, මේ කාරණය හේතු කොටගෙන තමයි බුදුන් වහන්සේ මිනී මස් තහනම් කරල ඇවැතක් පැනෙව්වෙ. තමන්ගෙ වර්ගයාගෙ මසුත් වළඳන ම්ලේච්ඡයන් විදිහට බාහිර සමාජයෙන් හංවඩු ගහන නිසයි ඒ වගේ ඇවැතක් පැනෙව්වෙ.

ඊළඟට බලු මස් වගේ මස් වර්ග සැඩොල් කුලයේ උදවිය තමයි ආහාරයට ගත්තෙ. මිනිස්සු බලු මස් කෑම නින්දා කරනවා, පිළිකුල් කරනවා, අවමන් කරනවා. එතකොට භික්ෂූන් වහන්සේලා ඒ මස් වැළඳුවොත් මිනිස්සු කෑ ගහනවා, භවත් ගෞතමයන් වහන්සේගෙ ශ්‍රාවකයො නීච බල්ලන්ගෙ මසුත් අනුභව කරනව කියල. ඒ සිද්ධිය මුල් කරගෙන බලු මස් තහනම් කළා.

ඒ වගේම ගම්වල හිටපු දඩයම් කරන මිනිස්සු ඒ කාලෙ කැලේ ගිහින් සිංහ, කොටි, ව්‍යාඝ්‍ර... ආදී සත්තු දඩයම් කරල මස් ගෙනත් ඒ අයගෙ ආහාරයට සකස් කරල තියාගන්න සිරිතක් තිබුණා. භික්ෂූණ් වහන්සේලා පිණ්ඩපාතෙ වැඩියම උන්වහන්සේලාටත් ඒ මස් මාංසවලින් කොටසක් තමයි පූජ කරන්නෙ. ඉතින් භික්ෂූණ් වහන්සේලාත් මොනවද කියල අහන්නෙ බලන්නෙ නැතිව ලැබුණ දෙයක් වළඳල භාවනා කරන්න නැවත කැලේට වඩිනවා. එතකොට ඒ ඉව සිංහයන්ට, කොටියන්ට, ව්‍යාඝ්‍රයන්ට දැනිල භික්ෂූන් වහන්සේලාගෙ ඇඟට පනින්න පටන් ගත්තා. ඉතින් නිකං ඉන්න සිංහයො, කොටියො, ව්‍යාඝ්‍රයො සැඩපරුෂ වෙලා භික්ෂූන් වහන්සේලාට පහර දීමෙන් සිද්ධ වෙන ආපදාව දැකල ඒ මස් වර්ගත් තහනම් කළා. වළස් මස්, කරබානා වළස් මස් තහනම් කරන්න හේතුවත් ඒකමයි.

සර්ප මසත් මිනිස්සු පිළිකුල් කරනවා, නින්දා කරනවා. භවත් ගෞතමයන් වහන්සේගෙ ශ්‍රාවකයො අභිකුණ්ටිකයො වගේ නීච සර්ප මසුත් වළඳනවයි කියල අපවාද එනකොට ඒ මසත් තහනම් කළා. ඒ වගේම ශ්‍රද්ධා නැති නොපහන් නාගයො ඉන්න බවත්, උන් ඉතා කුඩා කාරණයකින් වුනත් භික්ෂූන් වහන්සේලාට හිරිහැර කරන්න බලාගෙන ඉන්න බවත්, ඒ නිසා සර්ප මසත් නොවළඳනව නම් යහපත් බවත් සුඵස්ස කියන නා රජු විසින් බුදුන් වහන්සේට එක්තරා අවස්ථාවක දන්වා සිටීමත් සර්ප මස් වැළඳීම තහනම් කරන්න හේතුවක් වුනා. (විනය පිටකය - මහා වග්ග පාලිය 2 - 6 භේසජ්ජ ඛන්ධකය - 558 පිටුව)

ඊළඟට එදා හිටපු රජ්ජුරුවන්ගෙ මංගල හස්තියා මළාට පස්සෙ, මංගල හස්තියා හරි වාසනාවන්තයි, ඒක වැළඳුවොත් මස් ටික කුණු වෙලා යන නිසා ඒ වාසනා ශක්තිය අපි ළඟට ගමු කියල දෘෂ්ටියක් හදාගෙන, ඒ ඇතාගෙ මසත් මිනිස්සු උයාගෙන කෑවා. භික්ෂූන් වහන්සේලාට ඒකෙන් දානෙත් දුන්නා. ඒක දැකපු අන්‍ය පරිබ්‍රාජකයො කෑ ගහන්න පටන් ගත්තා, භවත් ගෞතමයන්ගෙ ශ්‍රාවකයො මංගල ගුණයෙන් හදපු සතාගෙ මසුත් කනවයි කියල. ඒක මුල් කරගෙන ඇත් මස් තහනම් කළා. අශ්ව මස් තහනම් කරන්න හේතුවත් ඒකමයි. මංගල ගුණයෙන් රජ මාළිගාවෙ හදපු අශ්වයගෙ මසුත් කනවයි කියල භික්ෂූන් වහන්සේලා අර වගේ අපවාදයකට ලක්වුනා.

එතකොට මේ වගේ මස් වර්ග 10 ක් තහනම් කළේ හේතු ඇතිව. බාහිර සමාජයෙන් එන නින්දා අපහාස වගේම, සතුන්ගෙ පහර දීම් නිසා ඇති වෙන බාහිර හේතුන් මත තහනම් කළා මිසක්, මස් මාංස අනුභව කිරීම පව් නිසා තහනම් කළා නෙවෙයි. මොකද පව් නිසා තහනම් කළා නම් ඔක්කොම මස් වර්ග අනුභව කිරීම තහනම් කරන්න ඕන. නමුත් ඒ දානය වළඳන භික්ෂූණ් වහන්සේලා ප්‍රාණඝාතයට කිසිම ආකාරයකින් සම්බන්ධ නැති නිසා උන්වහන්සේලාට කිසිම පාප සම්බන්ධයක් නෑ. ඒ නිසා මේ විදිහට **සමාජ සම්මතයන්ට විරුද්ධ වීම නිසා ඇතිවෙන භේද භින්න බව දුරු කරන්නයි මස් වර්ග 10 ක් විශේෂයෙන් තහනම් කළේ.** භික්ෂූන් වහන්සේලා විතරක් නෙවෙයි, ගිහියෙක් හෝ වේවා පවත්ත වුනත් මේ මස් වර්ග දහය අවස්ථානුකූලව ආහාරයට ගැනීමෙන් වැළකීම වැදගත් වෙනවා. ඒ අර වගේ බාහිර ප්‍රශ්න එන්න පුළුවන් නිසා.

ඒ වගේම භික්ෂූන් වහන්සේ නමක් මස් මාංස වළඳනව නම්, මස් මාංස කියන ප්‍රිය මනාප අදහස අත්හැරල, ලැබිච්ච ආහාරයකින් ජීවත් වෙන මානසිකත්වය ඇති කරගන්න ඕන. ඒ නිසා භික්ෂූන් වහන්සේ නමකට ඒක ගැටළුවක් වෙන්නෙ නෑ. නමුත් මිනිස්සු භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් සත්තු මරල ඒ මස් මාංසවලින් දන් දුන්නොත් ඒක මිනිස්සුන්ට කොහොමත් අවැඩක්, පාපයක් වෙනව වගේම, ඒ විදිහට දානය උදෙසා මරා සකස් කරගත්ත මස් මාංස කියල මොනයම් විදිහකින් හෝ අහන්න දකින්න ලැබුණොත්, ඒ ගැන සැකයක් ඇති වුනොත්, ත්‍රිකෝටික පාරිසුද්ධ නොවන නිසා ඒවා වැළඳීමෙන් වළකින්න කියලත් භික්ෂූණ් වහන්සේලාට විශේෂයෙන් පෙන්වල තියෙනවා.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*පූජ්‍යපාද වහරක අභයරතනාලංකාර තෙරුන් වහන්සේ විසින් යළි මතු කළ සැඟවුනු දහම් කරුණු ඇසුරෙන් සකස් කළේ:*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# වටිනා දහම් කොටස්...



වහරක අභයරතනාලංකාර තෙරුන් වහන්සේ ගිහි වතක සිටියදීත්, ඉන් පසුවත් පෙළ දහම් පොත්පත් ගැඹුරින් පරිශීලනය කරල, ඒ ඇසුරෙන් තමන්ගෙ නැණ නුවණට ගෝචර වෙන විදිහට අභ්‍යාස පොතක සටහන් කරල තිබුන වටිනා දහම් කොටස් කිහිපයක් පින්වතුන්ගේ යහපත පිණිස මේ ආකාරයට සටහන් කරනවා.

**විභංග ප්‍රකරණයේ විස්තර කර ඇති අවිද්‍යාවේ 23 ආකාරය**

සිව් සස් (චතුරාර්ය සත්‍යය) පිළිබඳව 1. නොදැනීමෙක් 2. නොදැකීමෙක් 3. අනවබෝධයෙක් (අවබෝධයක් නැතිකම) 4. අනනුබෝධයෙක් (අවබෝධය කරා ආසන්න වීමක් නැති බව) 5. අසම්බෝධයෙක් (සම්බෝධියට පත් නොවීම හෙවත් චතුරාර්ය සත්‍යය සමග සම්බන්ධ නොවීම) 6. අප්පටිවේදයෙක් (න්‍යායනුකූලව අවබෝධ නොකළ) 7. මනා සේ නොගැනීමෙක් 8. හාත් පසින් නොබැස ගැනීමෙක් 9. සමව නොබැලීමෙක් (ලොව සත්‍යය යථාර්ථය නොදැක විසමව බැලීම, නියමාකාරයෙන් නොබැලීම) 10. ප්‍රත්‍යවේක්ෂා නොකිරීමෙක් (ඥාණයෙන් විමසීමක් නැතිකම) 11. දුම්මේධ බවෙක් (ගහක ඇති කහට මැලියම් බැඳීම වැනි අපවිත්‍ර ස්වභාවයක්) 12. බාල බවෙක් 13. අසම්‍යක් ඥාණයෙක් (නිවැරදි/ සම්මා ඥාණයක් නැතිකම) 14. මෝහයෙක් 15. ප්‍රමෝහයෙක් (මෝහයේම බලවත් පැත්ත) 16. සම්මෝහයෙක් (මෝහය සමග බැඳීම) 17. අවිද්‍යාවෙක් 18. අවිද්‍යා ඕඝයෙක් (මහා ගංගා වගේ ගලන ස්වභාවයේ අවිද්‍යාව) 19. අවිද්‍යා යෝගයෙක් (අවිද්‍යාව සමග එකතු වීමක්) 20. අවිද්‍යා අනුශයෙක් 21. අවිද්‍යා පරියුට්ඨානයෙක් (අවිද්‍යාවේ නැගී සිටීමක්) 22. අවිද්‍යා පරිඝයෙක් (එයම නැගී එයටම ගැටෙන වෙලී සිටින තත්වයට පත්වීම) 23. මෝහ සංඛ්‍යාත අකුසල මූලයෙක් වේද මේ ඒ විසිතුන් ආකාර අවිද්‍යාවයි.

**44 ක් සහ 77 ක් ලෙස ඥාණ දර්ශන විග්‍රහය**

සංයුක්ත නිකාය (2) - 88 පිටුවේ එන ඥාණවත්ථු සූත්‍රය (ඥාණ 44 හෙවත් සිව්සාලිස් නුවණ හා සම්බන්ධවයි)


අතීතයේ යම් කිසි මහණ බමුණු කෙනෙක් සංඛාර, සංඛාර සමුදය, සංඛාර නිරෝධය, සංඛාර නිරෝධ ප්‍රතිපදාව, අද මම යම් සේ දකින්නේද එසේම දත්තාහුය. මෙසේම අනාගතයේ යම් මහණ බමුණු කෙනෙක් සංඛාර, සංඛාර සමුදය, සංඛාර නිරෝධය, සංඛාර නිරෝධ ප්‍රතිපදාව, අද මම යම් සේ දකින්නේද එසේම දැනගනු ලබන්නාහුය. මෙසේ මේ න්‍යාය ධර්මය අනුව සංඛාර, විඤ්ඤාණ, නාමරූප, සළායතන, ස්පර්ශ, වේදනා, තණ්හා, උපාදාන, භව, ජාති, ජරා මරණ යන අංගයන්ද මෙසේ දැන මේ න්‍යාය ධර්මය අනුව අතීත, අනාගත පනවන්නේද, එසේ දැනුම් ඇති ඔහු පිළිබඳව බුදු පියාණන් වහන්සේ මෙසේ දේශනා කර ඇත. (11 x 4 = 44)

තවත් අයුරකින් කියනව නම්, ජරා මරණ - ඉපැද්ම - භවය - උපාදානය - තණ්හාව - වේදනාව - ස්පර්ශය - සළායතන - නාමරූප - විඤ්ඤාණ - සංඛාර පිළිබඳව ඒවා දැනෙන නුවණ - ඒවා හටගැනීම දක්නා නුවණ - ඒවායේ නැවැත්ම දක්නා නුවණ - නවත්වන මග දක්නා නුවණ යන එකින් එකට 4 කොටස බැගින් 44 යි.

ජාති හටගැනීමෙන් ජරා මරණ හටගැනීම වේ. ජාති නිරෝධ කිරීමෙන් ජරා මරණ නිරෝධ වේ. මේ අරි අටැඟි මගයි. ජරා මරණ නැවැත්වීමේ පිළිවෙතයි. යම් දිනක ආර්ය ශ්‍රාවක තෙමේ මෙසේ ජරා මරණ දනීද, ඒවායේ හටගැනීම - නිරෝධය - නිරෝධ මාර්ගය දනීද මේ සිව්සස් නුවණයි. හෙතෙම දන්නා ලද, දක්නා ලද, කල් නොයවා විපාක දෙන, පැමිණෙන ලද, බැස ගන්නා ලද මාර්ග ඥාණයෙන් අතීතයෙත් අනාගතයෙත් දහම් නියාව පමුණුවයි.

අතීතයෙහි යම් ශ්‍රමණ බමුණු කෙනෙක් මේ අයුරු දත්තාහුද, ඒ සියල්ලෝම මම යම් සේ දත්තාහුද එසේම දත්තාහුය. අනාගතයෙහි යම් ශ්‍රමණ බමුණු කෙනෙක් මෙසේ යම් සේ දන්නාහුද මෙසේම දැන ගන්නාහුය. දැන් යම් ශ්‍රමණ බමුණු කෙනෙක් දන්නාහුද මෙසේම දැන ගන්නාහුය යනුවෙන් යමෙකුට මේ ඥාණය වේද මේ ධර්මානුගමන ඥාණයයි.

මහණෙනි, යම් කලෙක මේ ආර්ය ශ්‍රාවකයාගේ මාර්ග ඥාණයත්, ප්‍රත්‍යවේක්ෂා ඥාණයත් මේ දෙනුවණ පිරිසිදු වූයේ, ඉතා පිරිසිදු වූයේ වේද, මහණෙනි, මේ ආර්ය ශ්‍රාවක තෙමේ දෘෂ්ඨි සම්පන්න යැයිද, දර්ශන සම්පන්න යැයිද, මේ සද්ධර්මයට පැමිණියේ යැයිද, මේ සද්ධර්මය දකී යැයිද, සේක (අරිහතුන් වහන්සේගෙන් මෙහා



# මිනිස් ඇසට නොපෙනී බිත්තරය තුළ සැඟව ගිය ජීවය



අද සමාජයේ බොහෝ දෙනා අතර පවතින තවත් වැරදි මතයක් තමයි ගොවිපොළවල්වල හදන බිත්තරවල (ෆාම් බිත්තරවල) ජීවයක් නෑ, ඒ නිසා ඒවා කෑවොත් පව් සිද්ධ වෙන්නෙ නෑ කියන කාරණය. ඒවායින් පැටව් හැදෙන්නෙ නෑ කියන තර්කය තමයි මෙතැනදි ඔවුන් මතු කරන්නෙ. නමුත් ඒවායින් පැටව් බිහි නොවෙන්න විවිධාකාර හේතු තියෙනවා. ඒ හේතු දැනගන්න කලින් බිත්තරයක් කියන්නෙ මොන ආකාරයේ ස්වභාවයක්ද කියල විමසල බලමු.

බිත්තරයක් කියන්නෙ ජීවියෙක් බිහිකිරීමට අවශ්‍ය කරන රස ධාතුව එකතු වෙලා නිර්මාණය වෙච්ච එක්තරා ගැබක්. එතකොට හේතුවක් නැතිව යම් කිසි ඵලයක් හට ගන්න විදිහක් නෑ. බුදු දහමේ පෙන්වන්නෙ හේතු ඵල. ඒ අනුවයි මේ කාරණය තෝර ගන්න ඕන. බිත්තර කියන්නෙ කිකිළිගෙ ගර්භාෂයේ හටගන්න අමතර දෙයක්. එහෙම නැතිව කිකිළිගෙ ශරීරයෙන් හට ගන්න පිහාටු, නියපොතු වගේ කොටසක් නෙවෙයි. යම් කිසි හේතුවකින් බඩේ ගෙඩියක් හට ගත්ත කිව්වොත් ඒක ශරීරයේ රෝගයක්. නමුත් බිත්තර කියන්නෙ එහෙම දෙයක් නෙවෙයි. ඒක ජීවය හට ගැනීමේ රස ධාතුව ගැබ් කරල කළලයක් ඇතුළත් වෙලා හැදිච්ච දෙයක්. කළලය කිව්වම ඒකෙ මූලිකම අවස්ථාව අද තියෙන අණ්වීක්ෂයකින්වත් හොයන්න බෑ. ඒ තරම්ම අති සූක්ෂම දෙයක්. හරියට ශරීරයක් තුළ තියෙන කුඩාම සෛලයක් වගේ. නමුත් අද කළලයක් කිව්වම හිතාගෙන ඉන්නෙ ඉන්ද්‍රියන් සහිත, කළල බන්ධය සහිත, ආලෝකයක් ඇල්ලුවම පේන්න තියෙන, පටලවලින් වට වෙච්ච මුං ඇටයක් වගේ ඇහැට පේන එකක් කියල. ඒක පේන්නෙ නැත්නම් කළලයක් නෑ කියනවා. ඒකෙන් පැටව් හැදෙන්නෙ නැත්නම් ඒකෙ කළලයක් තිබිල නෑ කියල අදහස්

---

ඉන්න මගඵල ලාභීන් හෙවත් තව දුරටත් හික්මෙන අය) ඥාණයෙන් සමන්වාගත යැයිද, සේක විද්‍යාවෙන් සමන්වාගත යැයිද, ධර්ම සෝතයට පැමිණියේ යැයිද, ආර්ය වූ නිර්වේදික ප්‍රඥා ඇත්තේ යැයිද, අමා දොරට හැපී සිටී යැයිද කියනු ලැබේ. (මෙසේ මේ අවබෝධය ඇත්තා ඒකාන්තයෙන් සෝතාපන්න බවයි දේශනා කර ඇත්තේ.)

මේ ඥාණ 44 තවත් ආකාරයකින් 77 ක් වන ආකාරය 93 පිටුවේ එන දුතිය ඥාණ වත්ථු සූත්‍රයේ පෙන්වා ඇත්තේ මෙසේය.

1. මෙකලද (වර්තමානයේද) ජාති ප්‍රත්‍යයෙන් ජරා මරණ වේ යැයි දක්නා නුවණ.
2. මෙකලද ජාති නිරෝධයෙන් ජරා මරණ නිරෝධ වේ යැයි දක්නා නුවණ.
3. අතීතයෙහිද ජාති ප්‍රත්‍යයෙන් ජරා මරණ වී යැයි දක්නා නුවණ.
4. අතීතයෙහිද ජාති නිරෝධයෙන් ජරා මරණ නිරෝධ වී යැයි දක්නා නුවණ.
5. අනාගතයෙහිද ජාති ප්‍රත්‍යයෙන් ජරා මරණ වේ යැයි දක්නා නුවණ.
6. අනාගතයෙහිද ජාති නිරෝධයෙන් ජරා මරණ නිරෝධ වේ යැයි දක්නා නුවණ.
7. යම් ඒ (යථෝක්ත) ප්‍රත්‍යාකාර ඥාණයක් වන්නේ නම් එයද ක්‍ෂය ස්වභාව ඇත්තේය, වය (වැනසෙන) ස්වභාව ඇත්තේය, විරාග ස්වභාව ඇත්තේය, නිරෝධ ස්වභාව ඇත්තේ යැයි මෙසේ දක්නා නුවණ.

(11 x 7 = 77) මෙසේ එකකට 7 බැගින් 11 ට 77 ක් වේ.

මේ ආකාරයෙන්ම භව ප්‍රත්‍යයෙන් ජාති, උපාදාන ප්‍රත්‍යයෙන් භව, තණ්හා ප්‍රත්‍යයෙන් උපාදාන, වේදනා ප්‍රත්‍යයෙන් තණ්හා, ස්පර්ශ ප්‍රත්‍යයෙන් වේදනා, සළායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශ, නාම රූප ප්‍රත්‍යයෙන් සළායතන, විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාම රූප, සංඛාර ප්‍රත්‍යයෙන් විඤ්ඤාණ, අවිජ්ජා ප්‍රත්‍යයෙන් සංඛාර යන මේවාත් ඉහත කී ආකාර ඥාණ හත අයුරින් දකීද එවිට 77 ක් ඥාණ දර්ශනය වේ. මේ ඉහත 44 ක් ඥාණ දර්ශන තවත් ආකාරයකින් දකින විදිහයි.

**සටහන**

**නීතිඥ චන්දන සිරිවර්ධන**

ගන්නවා. නමුත් මේ කියන විදිහට කළලයක් තියෙනවද නැත්ද කියල තීරණය කරන්න බෑ. **කළ+ආල+අය= කළ ආලයට අයවීම හෙවත් එකතුවීම තමයි කළලය කියන්නෙ.** මූලිකවම යම් කිසි ගතියකට ආලය කිරීමෙන් තමයි ආපෝ, තේජෝ, වායෝ, පඨවි, ආකාස, විඤ්ඤාණ කියන ධාතු හයකින් හැදිච්ච ගන්ධබ්බයා ගැබකට සම්බන්ධ වෙන්නෙ, ඔක්කන්ති වෙන්නෙ. මේ ගන්ධබ්බයා අන්වීක්ෂයකටවත් පේන්නෙ නැති කර්මජ රූපයකින් යුක්තයි. මෙතැනදි වෛද්‍ය විද්‍යාවටත් අහු නොවෙන කොටසක් තියෙන බව තේරුම් ගත යුතුයි. අති ඉන්ද්‍රිය ඥානයට, දිවැසට පෙනෙන දේවල්වලින් කලාවෙන් පංගුවක්වත් විද්‍යාවට හොයා ගන්න මේ වෙන කොටත් බැරි වෙලා තියෙනවා.

බිත්තරයක් බඩ ඇතුළෙ තියෙනකොට ඒ තුළ කළල බීජය වැඩිල තියේ නම් විතරයි පියවි ඇහැට පේන්නෙ. බිත්තරයක් මෝරන කොට ඒ තුළ තියෙන කළලයත් වැඩෙනවා. ඒ වැඩිච්ච එක තමයි යම් කිසි විදුලි ආලෝකයක් අල්ලල පොඩි තිතක් වගේ දකින්න පුළුවන්කමක් තියෙන්නෙ. නමුත් සමහර කළල තියෙනවා ඉතාම සියුම්. හැබැයි ඒවාට වැඩෙන්න අවශ්‍ය කරන එක සාධකයක් හෝ නැත්නම් ඒක වැඩෙන්නෙ නෑ. උදාහරණයක් විදිහට කෙනෙක්ගෙ ශරීරයේ කාබෝහයිඩ්‍රේට්, ප්‍රෝටීන්... ආදී සියල්ලම තියෙන්න පුළුවන්. නමුත් එක අත්‍යවශ්‍ය විටමින් ජාතියක් හෝ අඩු වුණොත් ඒ ශරීරය නොවැඩී තියෙන්න පුළුවන්. මේ වගේ යම් කිසි රස ධාතුවක එක කොටසක් අඩුයි නම්, අනෙක් ඒවා ඔක්කොම තිබුණත් නොවැඩී තියෙන්න පුළුවන්.

**සමහර විට සමහර සත්වයන්ගෙ කර්ම බලවේග මුල් කරගෙන අත්‍යවශ්‍ය කොටසක් අඩු වෙලා කර්ම ශක්තියෙන්ම අඩුපාඩු සහිත ගැබක ඉපදිලා, අන්‍ය පුද්ගලයන්ව රැවටීමට අහුවෙලා, ඒ බිත්තරයේ සතෙක් නෑ කියන නිගමනයකට එන්න පුළුවන්.** එතකොට ලෝකයේ මනුස්සයින්ට තියෙන දෘෂ්ටිය නිසා ඒ බිත්තරවල සත්වයන් (ජීවයක්) නෑ කියන නිගමනයකට එනවා. මේ වගේ යථාර්ථය නොදැන කරගන්න පාප කර්ම නිසා අර වගේ දෘෂ්ටියකට වැටිල, සත්වයන්ගෙ ජීවිතවලට හිංසා කිරීමේ පාප කර්ම මුල් කරගෙන, ඒ පුද්ගලයන්ටම හේතුවට අනුකූල ඵලය විදිහට ඒ පාප කර්මය ඇදිල එන්න පුළුවන්. ඒ වගේ පුද්ගලයෙක් සතර අපා ගතවෙලා සමහර විට ඒ ජාතියේම බිත්තරයක් තුළට ඇවිත් උපදින්න පුළුවන්. ඒත් කරපු පාප කර්මය නිසා කළලය නොවැඩී තිබිල මනුස්ස ආහාරයට ගොදුරු වෙන්නත් පුළුවන්. එහෙම වෙන්නෙ, කර්ම බලවේගයෙන්ම වැඩෙන්න අවශ්‍ය රස ධාතුවක් අඩු වෙලා, මනුස්සයන්ට ඒ ජාතියේ බිත්තරවල ජීවයක් නෑ කියන අදහස දීල, ඒවා මනුස්ස ආහාරයට ගැනීම නිසා. ඒ වගේ බිත්තර රැක්කත් පැටව් හැදෙන්නෙ නැත්තෙ ඒ රස ධාතුව අඩු වෙච්ච නිසා. නමුත් එහෙම වෙච්ච පළියට ඒකෙ ජීවයක් නෑ කියන්න බෑ. මොකද කිකිළි බිත්තරය දාන කොටත් ඒ තුළ ජීවයක් හටගෙන අවසානයි. හේතුව **ගන්ධබ්බයෙක්ගෙ ඔක්කන්ති වීමක් (පැමිණීමක්) නැත්නම් බිත්තරයක් නිපදවෙන්නෙ නෑ.**

**හැබැයි මේ කාරණය මිනිස් ඩිම්බයක් බිත්තරයක් විදිහට සළකල ඒකත් එක්ක සංසන්දනය කරල විසඳ ගන්න බෑ.** මොකද මිනිස් ඩිම්බයක් සම්බන්ධ වෙලා සත්වයෙක්ගෙ උපත හටගැනීම මීට හාත්පසින්ම වෙනස් ක්‍රමවේදයක්. ඒ ක්‍රමය ජලාබුජයි. බිත්තරවලින් ජීවය හටගන්න ක්‍රමය අණ්ඩජයි. මේ නිසා ස්ත්‍රියකගේ මාසිකව සිද්ධ වෙන මාස් සුද්දිය වගේ කිකිළි බිත්තර දාන එක සමාන කරන්න බෑ. බිත්තරයක් නිපදවුණා කියන්නෙ කළලයක් හැදුණ කියන එක. ඒ කළලය මෝරල පැටව් බිහිවෙන්නෙ නැති එක වෙනම කතාවක්. ඒකට හේතුව අර කියපු කර්ම බලවේගයන් නිසා රස ධාතුන්ගේ අඩුවීම. සමහර විට අඩු වෙච්ච රස ධාතුව ගැබ් කරන්න පුළුවන් නම් පැටවෙක් බිහිවෙන්නත් පුළුවන්. හැබැයි ඒකත් කර්ම ශක්තිය අනුවයි තීරණය වෙන්නෙ. ඒකත් හේතු ඵලයි.

ඉතින් නවීන වෛද්‍ය විද්‍යාව කිව්වත් කරුණු සියල්ලෙන්ම පූර්ණ විද්‍යාවක් නෙවෙයි. ඒ නිසා අඩු වෙච්ච රස ධාතුව සමහර විට හොයාගන්න බැරි වෙන්නත් පුළුවන්. ඉදිරි කාලයේදි ඒවා හොයාගන්න පුළුවන් නම් සමහර විට ඒ බිත්තර තුළ ජීවියා වැඩෙන බව හොයාගන්නත් පුළුවන්. වැඩුනත් නැතත් බිත්තරයක් කියන එක හැදෙන්නෙ ගන්ධබ්බයෙක් සම්බන්ධ වෙලාමයි. එතැනින් තමයි වැඩේ පටන් ගන්නෙ. බිත්තරයේ වැඩීම සිද්ධ වෙන්නෙ දෙයාකාරයකින්. “ඒකජංවා ද්විජං වාපි” කිව්වෙ ඒකයි. ජීවියා එක අවස්ථාවකදි සම්පූර්ණ නොවී අවස්ථා දෙකකදි සම්පූර්ණ වෙන්න පුළුවන්. බිත්තරය ඇතුළෙ වැඩෙන්නෙ පළමු ජනිතයා. බිත්තරයෙන් පැටවා බිහිවීම තමයි දෙවැනි ජනිතයා. දළඹුවත් එහෙමයි. දළඹුවා කියන්නෙ පළමු ජනිතයා. කෝෂයක් හදාගෙන එන දෙවැනි ජනිතයා තමයි සමනලයා. බිත්තරය හැදීමෙන් එන ගන්ධබ්බයා තමයි මෙතැනදි දළඹුවාට සමාන වෙන්නෙ. ඒ තමයි පළමුව සිද්ධවෙන ඔක්කන්තිය. සමහර වෙලාවට බිත්තරය දැම්මට පස්සෙ කිකිළියගෙ සම්බන්ධයක් නැතිවත් උෂ්ණත්වය ලැබිල, එහෙම නැත්නම් බාහිරින් උෂ්ණත්වය ලබා දීල පැටව් එළියට එන ක්‍රමයක් තියෙනවා. මේ ක්‍රමය තමයි අද බොහෝ කොටම ගොවිපළවල්වල තියෙන්නෙ. මේ වගේ බිත්තරවලින් පැටව් එළියට එන විවිධ ක්‍රම රටා තියෙනවා. ඒ වගේම උපන් මනුස්සයගෙ ගති ගුණ, ක්‍රියා කලාප වෙනස් වෙනකොට දෙවැනි ජාතියක් හැටියට සලකන ක්‍රමයකුත් තියෙනවා. ඒක මීට අදාල නෑ.

කළලයක් හටගන්නකොටත් විවිධ ක්‍රම රටා තියෙනවා. **කුකුළෙක් හඬලන සද්දෙට කිකිළිය බිත්තර දාන අවස්ථා තියෙනවා.** එතකොට කොහොමද ස්ත්‍රී පුරුෂ සම්බන්ධය සිද්ධ වෙන්නෙ? **“මාතා පිතරෝච සන්නිපාතා” කියන මව් පිය එකතුවීම ශබ්ද ස්පර්ශයෙන් වෙන්නත් පුළුවන්.** ඒක බොහෝ කොටම සතුන් අතර සිද්ධ වෙන සම්බන්ධයක්. තවත් ක්‍රම තියෙනවා. උදාහරණ විදිහට මොණරා පිල් විදහාගෙන නටනකොට ඒ සතාගෙන් පිටවෙන ධාතු ගැහැණු සතා මුඛයෙන් අරගෙනයි ගැබ් ගන්නෙ. ඒක තමයි ගැබ් ගැනීමට අවශ්‍ය කරන ආහාරය. එහෙම නැතිව උන්ගෙ සංවාසය ශාරීරිකව එකතු වීමකින් නෙවෙයි සිද්ධ වෙන්නෙ.

මේ වගේ හඬ අහල ගැබ් ගන්න **ක්‍රමය සතුන් අතර සුලභ වුනත් මිනිස්සු අතර සිද්ධ වෙන්නෙ අති දුර්ලභව. නමුත් ඒක විද්‍යාවට අහුවෙන්නෙ නෑ.** වැඩිය ඕන නෑ, ස්ත්‍රියක් පුරුෂයෙක් වීමත්, පුරුෂයෙක් ස්ත්‍රියක් වීමත් විද්‍යාවෙන් පිළිගත්තෙ මේ ඉතා මෑත කාලයේදි. නමුත් අදින් අවුරුදු දෙදහස් පන්සියයකටත් පෙර බුදුන් වහන්සේ වැඩ හිටපු කාලයෙත් මේ වගේ දේවල් සිද්ධ වෙච්ච බවට සාක්ෂි තියෙනවා. භික්ෂුවක් භික්ෂුණියක් වුන අවස්ථාත්, භික්ෂුණියක් භික්ෂුවක් වුන අවස්ථාත් දේශනාවල සඳහන් වෙනවා. ඒ ආකාරයට ලිංග විපර්යාසයන්ට ලක්වුන භික්ෂු භික්ෂුණීන්ට අදාල විනය නීති පවා බුදුන් වහන්සේ විසින් පනවල තියෙනවා. ඒ වගේම සමහර පණුවො ඉන්නවා, තනි පණුවා තමයි ස්ත්‍රී පුරුෂ දෙන්නගෙම කාර්ය සිද්ධ කරන්නෙ. උගේ ඇගේ ස්ත්‍රී පුරුෂ ලක්ෂණ දෙකම පිහිටල තියෙනවා. මේ ලක්ෂණ දෙකම තියෙන (ද්විලිංගික) කිකිළියොත් ඉන්නවා. හැබැයි ඒ ලක්ෂණය හැඟවිලා තියෙන්නෙ. ඒවා අවස්ථානුකූලව මතුවෙලා එන්න පුළුවන්.

# මිනිස් ඇසට නොපෙනී බිත්තරය තුළ සැඟව ගිය ජීවය

කිකිළියකගෙ බඩේ බිත්තර හැදෙන ක්‍රම රටාවක් තියෙනවා. කොහොමද ඒ බිත්තර බඩේ හැදුනෙ? කිකිළිගෙ නියපොතු, පිහාටු කියන්නෙ උගේ ශරීරයේ තියෙන කොටසක්. ඒවා හටගෙන වැඩෙන්න තවත් කාගෙන්වත් ආධාරයක් අවශ්‍ය නෑ. කිකිළි කන බොන ආහාරයත් සම්බන්ධ කරගෙන, කිකිළි ජනිත වුණ කර්ම ශක්තියෙන්, ඒ හටගත්ත ජාතියට අවශ්‍ය කරන අංගෝපාංග වශයෙන් නියපොතු, පිහාටු... ආදිය හැදෙනවා. කිකිළි පහරන මළපහ පවා උෟට අයිති කොටසක්. වැඩියෙන් කැවොත් පිට කරන මළපහ කොටසත් ලොකු වෙනවා. නමුත් බිත්තරය කියන්නෙ එහෙම එකක් නෙවෙයි. ඒක කිකිළිගෙ අංගෝපාංගයක් නෙවෙයි, පැහැදිලිවම අමතර කොටසක්. බිත්තරයක් නිෂ්පාදනය කරන්න කිකිළි ගන්න ආහාරයෙන් පෝෂණය ඇදගන්න යම් කිසි ශක්තියක් (කර්ම ශක්තිය) ක්‍රියාත්මක වෙනවා. බිත්තරය කියන්නෙ ඒ ශක්තිය තුළින් වැඩෙන එකක් මිසක් කිකිළිට ශක්තියක් නෑ බිත්තරය පෝෂණය කරන්න. දාපු බිත්තරය රකින එක විතරයි උෟට කරන්න පුළුවන්. ඒක කිකිළිගෙ ශරීරයේ ස්වභාවයකුත් නෙවෙයි, බිත්තරය පෝෂණය කරන්න සිද්ධ වෙන මූලික ධර්මතාවයක්. බිත්තරයක් හටගත්ත නම් ඒක හටගන්නකොටම යම් කිසි ක්‍රමවේදයකටයි හටගන්නෙ. ඒක කර්ම ශක්තියේ ප්‍රභවයක්. කර්මය නිසා යම් කිසි සත්වයෙක්ගෙ සම්බන්ධයෙන් සිද්ධ වෙන දෙයක් නිසාම තමයි ඒක ඒ විදිහට හටගන්නෙ. සත්වයෙක් වශයෙන් හටගැනීමට අවශ්‍ය කරන ඕජස කිකිළිගෙ ශරීරයේ තියෙන පෝෂණයෙන් ඒ සත්ව ස්වභාවය, කර්මජ ප්‍රභවය නිසා ඇදල අරගෙන සකස් වෙනවා. එහෙම නැතිව කවුරුවත් දැනගෙන බිත්තරය හදනව නෙවෙයි.

මෑතකදී සිද්ධ කරපු විද්‍යා පර්යේෂණවලිනුත් මේ කාරණය ඔප්පු වෙලා තියෙනවා. **කිකිළියන්ට දෙන ආහාරවල අඩංගු සියලුම කැල්සියම් කෘතිමව ඉවත් කරල, කැල්සියම් නැතිව උන්ට ආහාර සපයලත් උන් දාන බිත්තරවල කැල්සියම් සහිත කටුව හටගෙන තියෙනවා.** හැබැයි අද බිත්තර කටුව හැදෙන්න කියල කිකිළියන්ට සිප්පි කටු වගේ කැල්සියම් අඩංගු ආහාර දෙනවා. නමුත් මේ පර්යේෂණයෙන් ඔප්පු වෙනවා, බාහිරින් කැල්සියම් ලැබුණත් නැතත් කැල්සියම් සහිත බිත්තර කටුව හැදෙන බව. එතකොට **ඒක කෙරෙන්නෙ විද්‍යාවට අහුනොවෙන කර්ම ශක්තියෙන්.**

ඊළඟට මේ ඕවලාකාර **බිත්තරයේ මහත පැත්තෙන් බැලුවොත්, බිත්තර කටුවෙන් ඇතුලෙ එක්තරා සිවියකින් වටවෙලා යම් කිසි වායු ප්‍රමාණයක් ගැබ් වෙච්ච පුංචි ඉඩ ප්‍රමාණයක් දැක ගන්න පුළුවන්.** ඔක්සිජන් වායුව එක්තරා මට්ටමක් එතැන තියෙනවා. බිත්තරයක් කඩන වෙලාවක හිමින් සීරුවේ පරීක්ෂා කරල බැලුව නම් ඒක පේනවා. තම්බපු බිත්තරයක වුනත් ඒ කාරණය දැක බලාගන්න පුළුවන්. මේක ගම් බිත්තරවල විතරක් නෙවෙයි, ජීවයක් නෑ කියල කෑගහන ගොවිපොළ (ෆාම්) බිත්තරවලටත් පොදු දෙයක්. ඊට යටින් තමයි සුදු මදය, කහ මදය කියන ශ්‍රාවයන් වෙන වෙනම පිහිටල තියෙන්නෙ. මේ ටික හැදුනෙ කොහොමද? ඇයි අර විදිහට වායුව පොඩ්ඩක් ඉතිරි වුනේ? බිත්තරය ඇතුලෙ පැටවා හැදිල එනකොට උෟට පොඩ්ඩක් හුස්ම ගන්න දඟලන්න ඕන. හැදිච්ච පැටියා හුස්මක් අරගෙන තමයි එහාට මෙහාට පැනල ඇඟ හොළවන්නෙ. උෟට ඒ වෙලාවෙ හුස්ම ගන්න වාතය තිබුනෙ නැත්නම් බිත්තර කටුවට හිරවෙලා ඒක ඇතුලෙම මැරෙනවා. ඔන්න ඕකට තමයි ඔය වායුව පොඩ්ඩක් වෙන්වෙලා තියෙන්නෙ. හැදිච්ච ගමන්ම උගේ හෘද ස්පන්දනය ක්‍රියාත්මක වෙලා ආස්වාස ප්‍රස්වාස කරන මොහොතක් එනවා. ඒ මොහොත වෙනකොට උෟ පෝෂණය වෙලා වැඩිල ඉවරයි. දැන් කටුවෙන් එළියට එන වෙලාව. හොටෙන් ඇනලයි කටුව බිඳගන්න ඕන. ඒ සඳහා හුස්ම ටිකක් අරගෙන පෝෂණය වෙන්න ඕන. නැත්නම් ඒ ශක්තිය ගන්න බෑ. ඔය වායු පොඩ්ඩෙන් තමයි ඒ මොහොතෙදි හුස්ම අරගෙන හොටෙන් ඇනල කටුව හිල් කරගෙන අවශ්‍ය ප්‍රමාණයට වායුව ඇතුලට ඇදල ගන්නෙ. ඊට පස්සෙ උෟ හෙමින් හෙමින් බිත්තර කටුව බිඳගෙන එළියට එනවා.

දැන් මේ කියපු කාරණා කිකිළි කරන දේවල් නෙවෙයි. මේ විදිහට කිකිළිගෙ බඩේ ඉඳලම ඒ ජාතියේම සත්වයෙක් විදිහට ගොඩනැගෙන්න අවශ්‍ය කරන කොටස් ටික එකතු වෙලා බිත්තරය හැඩයකට හැදෙනවා. අර ශ්‍රාවය සිවියකින් වැහිල, කටුවකින් වැහිල, ඒ විදිහට පූර්ණව සකස් වුනේ කොහොමද? කවුද ඒක කරල දුන්නෙ? ලෝකයේ යමක් යම් ආකාරයකින් සිද්ධ වෙනව නම්, සතෙක් හැදෙන්න අවශ්‍ය කරන දේත් ඒ විදිහටම සිද්ධ වෙනවා. එහෙම හැදිච්ච බිත්තරය තමයි රක්කෙව්වම පැටව් හැදෙන්නෙ. නමුත් සමහර බිත්තර රක්කෙව්වම පැටව් හැදෙන්නෙ නැති එකයි මේ ගැටළුව වෙලා තියෙන්නෙ. හැදෙන්න අවශ්‍ය කරන කොටසක් ඒකෙ අඩු වෙලා තිබුනොත්, තියෙන ටිකෙන් විතරක් හැදෙන්න පුළුවන් ප්‍රමාණය හැදෙනවා, වැඩෙන්න තියෙන කොටසට මදි වුනොත් එතැනින් වැඩීම නවතිනවා. ඔරොත්තු නොදෙන මට්ටමට ආවොත් මැරිල යනවා. එතකොට ඉතුරු ටික හැදෙන්න විදිහක් නෑ.

සත්වයෙකුට යම් මට්ටමකට හැදෙන්න අවශ්‍ය කරන්නා වූ පෝෂණය ලැබෙන කල් ඒ මට්ටමට පෝෂණය වෙලා හැදෙනවා. ඔය පෝෂණය සිද්ධ වෙන අතරතුරදී ඊට අවශ්‍ය කරන ආහාරයේ හිඟයක් ඇති වුනොත් මොකද වෙන්නෙ? ඒ සතා ඒ ප්‍රමාණයට වැඩිල නොමැරී ඉතිරි වෙනවා. ඔරොත්තු නොදෙන මට්ටමට ආවොත් තමයි එතැනින් මැරිල යන්නෙ. මැරුණොත් එතැන් පටන් කුණු වීම ආරම්භ වෙනවා. දවසක් යනකොට කුණු වෙනවා. ඉතින් **ඇතුලෙ ජීවයක් නැතිව බිත්තරයක් හැදුනොත් එහෙම දවසක් යනකොට කුණු වෙන්න ඕන. නමුත් ජීවය තියෙන නිසා තමයි බිත්තරය කුණු නොවී රැකෙන්නෙ.** අදාල කාල සීමාව තුල රක්කෙව්වෙ නැත්නම් ඒකට හිමි ආයුස ඉවර වෙලා බිත්තරය කුණු වීම වෙනම කාරණයක්. ජීවයක් තියෙන තාක් එහෙම ස්වභාවයක් බිත්තරයට තියෙනවා. ඒ නිසා තමයි **බිත්තරයක් අධිසීතකරණයක හෝ වතුර යට හෝ පැය කිහිපයක් තියල, එහෙම නැත්නම් පස් යට දවස් කිහිපයක් තියල නැවත අරගෙන එළියෙ තිව්වොත් දවසක් දෙකක් ඇතුලත කුණු වෙන්නෙ.** මොකද ඒ තුළ පරිසර සාධක වෙනස් වෙලා උෟට හුස්ම ගන්න බැරි නිසා, එහෙම නැත්නම් අධික සීතලට ඔරොත්තු නොදීම නිසා එතැනින් මැරිල යනවා. අද සමාජයේ බිත්තරයක් කුණු වෙලාද නැත්ද කියල බලාගන්න යොදාගන්න ක්‍රමයක් තමයි බිත්තරය ජලය මතුපිට පාවෙනවද ගිලෙනවද කියල බැලීම. ජලය මතුපිට පාවෙනව නම් ඒක නරක් වෙච්ච බිත්තරයක් විදිහට තීරණය කරනවා. එහෙනම් ජලය යට ගිලුනොත් ඒකෙන් අදහස් කරන්නෙ ඒක නරක් වෙලා නෑ කියන එක. මිනිහෙක් හෝ සතෙක් වුනත් මැරුණොත් තමයි ජලය මතුපිටට ඇවිත් මළකුණ පාවෙන්නෙ. පණ තියේ නම් පා වෙන්නෙ නෑ යට යනවා. මේ අනුව බිත්තරය ජලය තුළ ගිලීමෙන් ඒකෙ ජීවයක් තියෙන බව ඔප්පු වෙනවා.

සතෙක්ගෙ වුනත් බිත්තරයක් දානකොට මූලික වශයෙන් ඒක හැදෙන්න අවශ්‍ය කරන කොටසක් තියෙනවා. කුකුළෙක් හඬලන සද්දෙටත් ඒ විදිහට අවශ්‍ය කරන කොටසක්

# මිනිස් ඇසට නොපෙනී බිත්තරය තුළ සැඟව ගිය ජීවය

ලැබිල තමයි බිත්තරයේ කළලය සකස් වෙලා එන්න හේතු වෙන්නෙ. මේ වගේ විවිධ ක්‍රමවේද තියෙනවා. නමුත් අපි හිතාගෙන ඉන්නෙ එක ක්‍රමයයි.

ගැබක් තුළ සතෙක් හටගන්න නම් මව් පිය දෙන්නෙක්ගෙ එකතුවීම, මව ඍතු ඇත්තියක් වීම සහ ගන්ධබ්බයෙක්ගෙ ඔක්කන්ති වීම කියන කාරණා තුනක් සිද්ධ විය යුතුයි කියල ධර්මයේ පෙන්වනවා (මජ්ඣිම නිකාය 1 – 622 පිටුව - මහා තණ්හා සංඛය සූත්‍රය). මෙතැනදි මව ඍතු ඇත්තියක් වීම කියන්නෙ, ජීවයක් හටගන්න අවශ්‍ය පරිසර සාධක ගැබ තුළ සකස් වීම. ඒ සකස් වීම විවිධ සතුන් අතර විවිධාකාරයෙන් සිද්ධ වෙනවා. මේ නිසා ස්ත්‍රීන්ගේ (මනුස්ස) මසකට වරක් ගැබ පිරිසිදු වෙලා සකස් වීමේ ක්‍රියාවලිය වෙනත් සතුන්ට ඒ ආකාරයෙන් අදාල කරගන්න බෑ. ඒක සතාගෙන් සතාට වෙනස් වෙනවා.

ඒ වගේම මනුස්සයො ගත්තොත්, ඉහත කියපු ආකාරයට මව් පිය දෙන්නා එකතු වීමේ කාරණය අදාල නොවෙන අවස්ථාත් තියෙනවා. උදාහරණ විදිහට බුදුන් වහන්සේ වැඩ ඉන්න කාලෙ **පොක්කරසාති කියන බමුණා නෙළුම් මල් කෙමියක අවශ්‍ය කරන්නා වූ ශ්‍රාවයන් එකතු වෙලා සංසේදජ ක්‍රමයට උපන්න කියලත්, අම්බපාලි කියන ගණිකාව මව් පිය සම්බන්ධයකින් තොරව අඹ වනයක ඕපපාතිකව උපන්න කියලත් දහමේ සඳහන් වෙනවා. ඒ වගේම මව් පිය දෙන්නෙක්ගෙ එකතුවීම කියන කාරණයත් හැම විටම කායිකවම සිද්ධ වීම අවශ්‍ය නෑ. ඒ එකතුවීම රූපයෙන්, ශබ්දයෙන්, ගන්ධයෙන්, රසයෙන් හෝ ස්පර්ශයෙන්... ආදී වෙනත් ක්‍රමයකින් සිද්ධ වෙන්නත් පුළුවන්.** සමහර කුකුල් ගොවිපොළවල්වල පුංචි පුංචි කොටුවල වෙන් කරල හිරකරල තියාගෙන ඉන්න කිකිළියන්ට හඬලන සද්දෙ ඇහෙන්න, හඬලන කුකුලෙක් පේන තෙක් මානයක තියල තියෙනවා. ඒ අවස්ථාවෙදි හඬලන සද්දෙ මුල් කරගෙන බිත්තර දැමීමට අවශ්‍ය කරන්නා වූ මූලික හටගැනීම සිද්ධ වෙනවා. මේ එක ක්‍රමයක් විතරයි. (කුඩා ළදරුවන් ඉන්න කිරි මව්වරුන් දරුවා ගෙදර තියල ගමනක් ගියාම, තවත් දරුවෙක් අඬන සද්දෙ ඇහෙනකොට මවගේ තනපුඩුවලින් කිරි වැක්කෙරෙන අවස්ථාත් තියෙනවා. දරුවගෙ හඬට මවගෙ කිරි නිපදවන සෛල, ස්නායු පද්ධති ක්‍රියාත්මක වෙන ආකාරයත් මීට සාධකයක්.)

හැබැයි බිත්තර දාන වයසෙ ඉන්න කිකිළියන්ට මේ වගේ කුකුල් හඬක් ඇහෙන්න නොදී වෙන් කරල තිව්වත් උන් බිත්තර දාන අවස්ථා තියෙනවා. එතකොට ඒ දාන්නෙත් ජීවයක් හටගත්තට පස්සෙ. මොකද එතැනදි **කුකුළෙක්ගෙ සම්බන්ධයක් නැත්නම් තනි කිකිළියකගෙන්ම බිත්තර ගැබ් ගන්න අවශ්‍ය ශ්‍රාවය නිෂ්පාදනය වෙනවා. එතකොට ඒ කිකිළියට ස්ත්‍රී පුරුෂ ගති ලක්ෂණ දෙකම පිහිටනවා. එහෙම එක කිකිළියක් හිටියත් මුළු කිකිළි කොටුවටම සෑහෙනවා. සතුන්ගෙ කර්ම ශක්තියෙන් තමයි ඒක සිද්ධ වෙන්නෙ. හැබැයි ඒක විද්‍යාවට අහුවෙන්නෙ නෑ. ඒ නිසා තමයි ගොවිපොළවල්වල ඇති කරන කිකිළියන් කුකුලන්ගෙ සම්බන්ධයක් නැතිව වෙන් කරල තිව්වම දාන බිත්තරවල ජීවයක් නෑ කියල කියන්න පුරුදු වෙලා ඉන්නෙ.** එහෙම කියල ඒකට නමකුත් දානවා බෞද්ධ බිත්තර කියල. ඉතින් අපි නොදැන හිටියත් මේ වගේ විවිධාකාර ක්‍රමවේදයන්ගෙන් ජීවීන් ගැබ් ගැනීම සිද්ධ වෙනවා. එකම ක්‍රමයකින්ම සිද්ධ වෙනවා නෙවෙයි.

මේ කාරණය උපමාවකින් පැහැදිලි කරන්න පුළුවන්. යම් කිසි කුඹුරක නියරක් බැඳල තියෙනවා. ඒ නියරේ උස් තැනක් තියෙනවා. ඒ උස් තැන පෙන්වල අහනවා, මෙන්න මේ වගේ තැන්වලින් වතුර ගලාගෙන යනව දැකල තියෙනවද කියල. නෑ මෙතැනින් නම් නෙවෙයි, අන්න අර වක්කඩ ළඟ පහත් වෙච්ච තැනින් නම් වතුර ගලාගෙන යනව අපි දැකල තියෙනව කියල උත්තර දෙනවා. මොකද පහත් තැනින් ජලය ගලා යාම තමයි ලෝකයේ සුලභවම පේන්න තියෙන ස්වභාවය. නමුත් යම් කිසි අවස්ථාවකදි ඒ පහත් තැනත් ආවරණය කළා නම්, වහල දැම්ම නම්, දැන් අර උස් තැනින් වතුර ගලාගෙන යන්නෙ නැත්ද? එකතු වෙන වතුරට යන්න තැනක් නැත්නම්, එදා වතුර ගලාගෙන නොගිය උස් තැනිනුත් දැන් වතුර ගලාගෙන යනවා. මේ වගේ යම් සත්වයෙක් හටගැනීමට අවශ්‍ය කරන පිරිසිදු පැහැදිලි පහසු පරිසරයක් තියෙනව නම්, ඒක තියෙන තාක් සංජාතිකයා හෙවත් ගන්ධබ්බයා එතැනට ඔක්කන්ති වෙලා (ඇදිල ඇවිත්) සතෙක් වශයෙන් පහළ වෙනවා. හැබැයි පහළ වෙන්න ඉන්න සත්වයාට ඒ ස්ථානය, පරිසරය වැහිල ගියොත්, ඊළඟට සත්වයා හැදෙන්න තවත් ක්‍රමයක් හටගන්නවා. ඒ ක්‍රමය ඊළඟට ක්‍රියාත්මක වෙලා උප්පත්තිය හටගන්නවා. මේ විදිහට එක උප්පත්ති ක්‍රමයකින් හටගන්න අපහසු තැන වෙනත් ක්‍රමයකින් උප්පත්තියක් හටගන්නවා. මේ එක ක්‍රමවේදයක හැටි. අණ්ඩජ, ජලාබුජ, සංසේජද, ඕපපාතික කියන්නෙ මේ වගේ ක්‍රම හතරක්.



සත්වයා කුරුල්ලෙක් විදිහට හැදිල තියේ නම්, මව් සතාට හැකියාවක් නෑ පොඩි එකෙක් වගේ පෝෂණය කරන්න. ඌට තියෙන්නෙ එක්තරා මට්ටමකට හැදිච්ච සතෙකුට කන්න ටිකක් දීල පෝෂණය කිරීමේ හැකියාව විතරයි. එහෙම සත්ව කොටස් බිත්තර දාල හැදෙන ක්‍රමයට තමයි පෝෂණය වෙන්නෙ. ඊළඟට ඇඟ ලෙව කාල හැදෙන සත්තු ඉන්නවා. ඒ ක්‍රමයෙන් උන්ගෙ ඇඟේ තියෙන කුණු ජරාව ඉවත් කරන්න පුළුවන්. බල්ලො බලල්ලු වගේ සතුන්ට එහෙම කරන්න පුළුවන්. නමුත් හොට තියෙන සතුන්ට එහෙම කරන්න බෑ. අර හැදිච්ච පැටියා ඒ ජාතියේ ළපටි එකෙක් වශයෙන් හැදුනොත්, පෝෂණය කරන්න ඒ සතාගෙ කය ගැළපෙන්නෙ නෑ. එහෙම සතුන්ට පැටව් දානවා වෙනුවට අර විදිහට බිත්තරයක් ඇතුලෙ පෝෂණය වෙලා, ඌට තනියෙන් හොයාගෙන කන්න පුළුවන් මට්ටමට මෝරල කටුව පලාගෙන එළියට එන්න පුළුවන් ජාතියේ ක්‍රමවේදයක් හැදෙනවා. මේ නිසා යම් කිසි සතෙකුට පුංචි කාලයේ ඉඳන් පෝෂණය කරන්න පුළුවන් හැකියාව සහිත කායික ක්‍රමයක් තියෙනව නම්, ඒ මට්ටමේ සතුන්ට ජලාබුජ උප්පත්තිය එනවා. එතකොට බිත්තරවලින් හැදෙන්න අවශ්‍ය නෑ.

නමුත් සතෙක් උපදින කොට ඔය කියන ක්‍රම දෙකටම නැති කොට්ඨාස ඉන්නවා. ඒ අයට පැටවෙක් හදාගන්න බලාපොරොත්තුත් නෑ. එහෙම ක්‍රමයකින් දරුවෙක්, පැටවෙක් හදාගැනීම දුකක් කරදරයක් බව දකිනවා. “මට වැඩක් නෑ මෙහෙම ඉඳල දරුවො

හදාගෙන. වෙන් කරගෙන හිර කරගෙන මගෙ මගෙ කියල ඉන්න ඒවායින් මට වැඩක් නෑ.” මේ ආදී වශයෙන් අදහස් තියෙනකොට ඕපපාතික උප්පත්තිය ඒ අයට හිමි වෙනවා. නැවත වාරයක් දරුවෙක් බඩට ඇවිත් හදාගෙන වඩාගෙන මහන්සි ගන්න ක්‍රමයක් නැති නිසා, හැදිච්ච ශරීරය හෝ අභ්‍යන්තර පරිසරය හෝ කර්ම පරිසරයේ විපාක පරිසරය හැදිල තියෙන්නෙ ඊට අනුකූලව. ඒ නිසා ඒ අයට ඕපපාතික උප්පත්තිය එනවා. මේ තමයි උප්පත්ති වෙන විවිධ ක්‍රම රටාවන්.

යම් කිසි විදිහකින් ලෝකයට බැඳිල රැඳිල ඉන්න පුද්ගලයො ඒ ඒ ගති ලක්ෂණ අනුව, මේ මගෙ පුතා, මගෙ දරුවා... ආදී වශයෙන් ගන්න කොට ඒ අයගෙ ලක්ෂණයක් තියෙනවා. අර කියන්නා වූ කිරි දීල හදල පෝෂණය කරන විදිහට එබඳු වන්නා වූ හැකියාවක් ඇති, ශරීරයක් ඇති ලොකු සතාගෙ ගැබට ඇවිත් පැටවෙක් බිහි වෙනවා. මේ තමයි ලෝක ධර්මතාවයෙන් සත්තු හැදෙන ක්‍රමවේද. **සමහර වෙලාවට හැදෙන සතාට හැදෙන්නෙ නැති වෙන්න, එහෙම නැත්නම් ටිකක් හැදිල මැරෙන්න කර්ම වේගවලින් ක්‍රමවේදයන් යෙදෙනවා.** මොකක් නිසාද? “ඕකෙ සතෙක් නෑ, ඕක කෑවට කමක් නෑ, ඕකෙ සතෙක් නෙවෙයි පෝෂණයක් විතරයි තියෙන්නෙ...” මේ ආදී වශයෙන් තමන්ගෙ හිතු මතයට ලෝකයාට කියල දීපු ක්‍රමයක් තියෙනවා. මෙහෙම කියල ලෝකයා රවට්ටපු උදවිය, ඇත්ත දැක්කෙ නැතිව තමන්ගෙ මතය අරගෙන ඒකෙන් ලෝකයා රැවැට්ටුව නම්, ඒ අය විසින් හැදෙන සත්වයන්ට බොහෝ අවැඩ කළා වෙනවා. මේ වගේ තමන්ගෙ මතයට අනුව තමන් හිතන එකෙන් මත ප්‍රකාශ කරල, මේකෙ සත්‍යය දකින්නෙ නැතිව ඔය ජාතියේ කතා කිව්ව කෙනා ඇත්තක් දැකල කතා කළා නෙවෙයි. ඒක ලෝක සම්මත විද්‍යාවෙන් කරපු පරීක්ෂණවලින් ගත්ත නිගමන මත පිහිටල කියපු කතාවක් වෙන්නත් පුළුවන්. නමුත් අද ලෝක සම්මත විද්‍යාවෙදි අපිට දැනගන්න පුළුවන් වෙන්නෙ එක්තරා මට්ටමකට උපකරණවලටත් අහුවෙන කොටසක් විතරයි. ඒ අනුව ඔහුගේ දෘෂ්ඨිය සත්‍යයක් නොවන නිසා, යම් කිසි ආකාරයකින් ඔහුට තිබිච්ච දෘෂ්ඨිය මිත්‍යා දෘෂ්ඨියක් වෙනවා. ඔහු කොහොමද ඕක නැහැ කියන්නෙ? මොන ක්‍රමයටද නැහැ කියන්නෙ? ඔහු දෙන හේතු මොනවද? ඔහුට නුවණක් තියෙනවද ඕකෙ සතෙක් නෑ කියල දැනගන්න? එහෙම නුවණකුත් නැත්නම්, එහෙනම් ඔහු ඒක ස්ථිර කරල කියන්නෙ ඇයි? බලනකොට අර බිත්තරයේ තියෙන ලොඳය (මදය) කා ගන්න තමන්ට තියෙන ආසාව, එහෙම නැත්නම් ඒක විකුණගෙන බඩ වඩා ගැනීමේ ආසාව තමයි මුල් වෙලා තියෙන්නෙ.

බැරි වෙලාවත් ඔය බිත්තර කබර බිත්තර වගේ සැර වුනා නම්, කැවොත් මැරෙනව නම් එහෙම, අපිට ඔය බිත්තර ප්‍රශ්ණයක් එන්නෙ නෑ. එහෙනම් බිත්තරවල සතෙක් ඉන්නවද නැත්ද කියල හොයන්න යන්නෙත් නෑ. ගොවිපොළ (ෆාම්) බිත්තරවල සත්තු ඉන්නවද නැත්ද කියල හොයන්න යන්නෙත් නෑ. ඔය ඔක්කොම තියෙන්නෙ මොකටද? එක්තරා ආසාවක් තියෙනවා බිත්තර කන්න, නැත්නම් විකුණගෙන කන්න. ඒ ආසාවට අවශ්‍ය කරන ක්‍රමවේද තමයි හොයන්නෙ. ඉතින් මොකද කරන්නෙ, අර වගේ ඥානයක් නැති පුද්ගලයො ආසාවට වහල් වෙලා “ඕව කෑවට කමක් නෑ, කොස් ඇට තැම්බුවා වගේ, ඕකෙ සතෙක් නෑ, සත්තු කියන්නෙ ඔහොම එවුන්ද? උන්ගෙ ඔලුව තියෙන්න ඕන, අත පය තියෙන්න ඕන. සත්තු කියන්න ඇස, කන, දිව, නාසය, ශරීරය ඕක ඇතුලෙ තියෙනවද? බිඳල බලපල්ලකො එහෙම එකක් තියෙනවද කියල. ඔය ශ්‍රාවයක් විතරයි ඕක ඇතුලෙ තියෙන්නෙ. ඕක සතෙක් වෙන්නෙ කොහොමද?...” මේ ආදී වශයෙන් තමන් දන්න දේට අනුව මොනව හරි කියනවා.

**තමන් දකින්නෙ නැති දෙයක්, දන්නෙ නැති දෙයක්, ඒ වගේම තමන් හිතන විදිහෙ අජීවී නොවන දෙයක්, සතෙක් වන දෙයක්, සතෙක් නෙවෙයි කියල කිව්ව නම් ඔහුගෙ දෘෂ්ඨිය මිත්‍යා දෘෂ්ඨියක්. ඔහුගෙ යම් කල්පනාවක් ඒ සඳහා යෙදුනද ඒ මිත්‍යා සංකල්පයක්. ඔහු ඒකෙ සතෙක් නෑ කියල කිව්වද ඒක මිත්‍යා වාචාවක්. ඕක බින්දට කමක් නෑ කියල ක්‍රියාත්මක වුනාද, ඒ මිත්‍යා කම්මන්තයක්. ඔහු ඒකෙන් ජීවත් වුනා නම් මිත්‍යා ආජීවයක්. ඔහු ඒකට ක්‍රියාත්මක වෙලා ඒක එහෙමයි කියල පෙන්වන්න උත්සාහ කළා නම්, එහෙම ජීවත් වෙන්න කටයුතු කරන්න, බිත්තර එකතු කරගන්න, සත්තු හදල එහෙම කරන්න උත්සාහ කළා නම් ඒක මිත්‍යා වායාමයක්. ඔහු හිතා ගෙන ඉන්නව නම් මේක හරියි, සත්‍යයි කියල ඔහුට තියෙන්නෙ මිත්‍යා සතියක්. වැරදි වූ පාපී වන්නා වූ මාර්ගයක් ඔහුට සමය (සමාධිය) වශයෙන් ඇදිල තියෙනවා. ඔහුගේ සමාධිය පාප සමාධියක්. ඔහු මිත්‍යා සමාධියක් ලබල අසත් පුරුෂයෙක් වෙලා ඉන්නවා.** ඔහු ඊට අනුකූල වන්නා වූ උප්පත්තියක් ලබනකොට බැඳිල හිටියෙ මොකටද? අවිද්‍යා, සංඛාර, තණ්හා, උපාදාන, භව කියන අර ආහාරයේ කෑදරකමට අවිද්‍යාවෙන් සංඛාර ගොඩනගල, ඒකෙ තණ්හාවෙන් ඇලිල, උපාදානයෙන් බැඳිල, ඒ භවට පත්වෙලා ඉඳල, භව පච්චයා ජාති කියන කර්ම භවයෙන් ඒක විඳින්න උප්පත්ති භවයේ ජාතියට යනවා. ඊට පස්සෙ ඊට අනුකූල විඤ්ඤාණ, නාමරූප, සළායතන, ස්පර්ශ, වේදනා ලබන්නා වූ තැනට ගිහින් ගොවිපොළවල හදන (ෆාම්) බිත්තරයේ උප්පත්තිය ලබනවා. කවුරුවත් දැක්කෙ නෑ වෙච්ච දේ.

දැන් තමන් දීල තියෙනවා මතයක්, කාපල්ල බෞද්ධ බිත්තර ඕවායේ සත්තු නෑ කියල. ඉතින් ඒක අහපු උදවිය මොකද කරන්නෙ? බිත්තරේ ගත්ත තැම්බුවා, ගන්ධබ්බයා නැවත වාරයක් කිකිළිගෙ බඩේ බිත්තරයකට සම්බන්ධ වෙනවා. නැවතත් ඒ මට්ටමට හැදිල ඇවිත් බිත්තරය දාපු ගමන්ම ගෙනිහින් තම්බනවා. කැරකිලා ගිහින් ගන්ධබ්බයා නැවතත් බිත්තරයකට සම්බන්ධ වෙනවා. එක වචනෙට කර්ම ශක්තිය තව කෝටි වාරයක් ගියත් ඉවර වෙන්නෙ නෑ. නමුත් මිනිස්සු ඒක දකින්නෙ නෑ. එහෙම දෙයක් වෙනවද කියල තේරෙන්නෙත් නෑ. නමුත් ඔය ගොවිපොළ (ෆාම්) බිත්තරයේ උප්පත්තියට ගිහින් කොහොම හරි තම්බල දාන වාරයක් වාරයක් පාසා, කඩල පොඩි කරල දාන වාරයක් පාසා එතැනින් මැරි මැරී ගිහින් අර ගන්ධබ්බයා “ගන්ධබ්භා අවක්ඛන්ති හෝති” කියල කිකිළිගෙ බඩට කොච්චර වාරයක් හරි ඉවරයක් නැතිව ඔක්කන්ති වෙනවා. (දිවැස්, සමාධි පහළ වෙලා තියෙනවනම් මේ කාරණය තමන්ටම දැක බලාගන්න පුළුවන්). දවස් 15 - 20 ක් විතර යද්දි බිත්තරය වැඩෙනවා. වැඩුනම දානවා. දාපු ගමන් මිනිස්සු තම්බගෙන කනවා. ඒකෙන් මැරිල ගිහින් නැවත වාරයක් කිකිළිගෙ බඩට ඔක්කන්ති වෙනවා. නැවතත් බිත්තරය හැදෙනවා, පෝෂණය වෙනවා. පෝෂණය වෙවී කර්ම ශක්තිය කවදද ගෙවෙන්නෙ, කොයි කාලෙද ගෙවිල ඉවර වෙන්නෙ කියල කියන්න බෑ. ගෙවෙන කල් බිත්තර අඩු වෙන්නෙත් නෑ. අඩුවක් නැතිව බිත්තර දානවා. ඒ වගේම අඩුවක් නැතිව ගෙනත් ගෙනත් කනවා. කාවද කන්නෙ? කන්න කියපු එවුනුත් ගිහින් ඒ බිත්තරවලම ඉපදිලා අනුන්ට කන්න ගෝචර වෙනවා.

මෙහෙම යනකොට එන්න එන්නම ඔය කියන බිත්තර ලෝකය වැඩි වෙනවා. බ්‍රහ්ම ලෝකයෙන් මනුස්ස ලෝකයට ඇවිත් ගුණ ධර්ම ක්‍රමයෙන් පිරිහිලා එතැනින් තිරිසන් ලෝකයට යනවා. ඒ විදිහට පහළ ලෝක දක්වාම ගිහින්, කෘමීන්ගෙ ඉඳල ක්ෂුද්‍ර

ජීවීන් දක්වාම පහළට යනවා. ඔහොම ගිහින් මේ ලෝක විනාසය වෙන්නෙ කවදද, එදාට යනකල්ම සත්වයෝ සතර අපායට පල්ලම් බහිනවා. තමන් මිත්‍යා දෘෂ්ටියෙන් කරපු වැඩවලට අනන්ත දුක් විපාක විඳගෙන සතර අපායෙ ඉන්නවා. ඉතින් මොකටද මේ බිත්තර ගැන හොයන්නෙ? මොකටද මේවා කන්නෙ? තිරිසන් ගතවෙන වැඩවලට දඟලන්න අවශ්‍ය නෑ. මෙච්චර කන්න දේවල් තියෙද්දි අනුන්ගෙ බිත්තර කඩාගෙන කන්න ඕන නෑ. සාධාරණව හරි හම්බ කරගත්ත දෙයකින් කාල බීල ජීවත් වෙන්න පුළුවන්.

ඊළඟට බිඳිච්ච බිත්තරවල ජීවයක් තියෙනවද කියන ප්‍රශ්නය සමහරු අහනවා. දැන් අපි මෙහෙම දෙයක් හිතමු. ඔලුව පැලිච්ච සතෙක් ඉන්නවා. ඔලුව පැලිච්ච නිසා ඊළඟට ඒකව මරාගෙන කනවා. දැන් ඒක හරිද? මේ වගේ බිත්තරය බිඳුනම ඒකෙ කොටසක් තුවාල වෙලා තියෙන්නෙ. ඉතින් තුවාල වෙච්ච සතාව මරාගෙන කනව වගේ වැඩක් නේද මෙතැන තියෙන්නෙ? අපි බලාගෙන ඉන්නවා ඌ මැරෙන කල්. හැබැයි මැරිල නම් ඒක කුණු වෙනවා. එතකොට කන්න බෑ. බිත්තරය පොඩ්ඩක් බිඳිල පුපුරල තියෙනවා. දවසක් තිබුනා, ඉඹල බැලුවා ගඳ නෑ. ගඳ නම් ඌ මැරිලා. පැය 24 ක් ඉක්ම යනකොට කුණු වෙලා. ඊට පස්සෙ ඒක කන්න බෑ. ඉතින් දවස් ගණනක් තිබුනත් තුවාල වෙච්ච සතෙක් මැරෙන්නෙ නෑ වගේ, ඔය කට්ට බිඳුන පළියට බිත්තරේ ඉන්න සතා මැරෙන්නෙ නෑ. හැබැයි ඉතින් හැදෙන්නෙත් නෑ. ඌ කර්ම විපාකයක් විඳිනවා. දවස් ගාණක් බිත්තරේ ඇතුලෙ ඉඳල මැරිල යන කාලයක් එනවා. මැරෙනවා කියන්නෙ ගන්ධබ්බයා එතැනින් තවත් තැනකට යන එක. නමුත් අපිට ඒක නිගමනය කරන්න බෑ. "කට්ට පොඩි වුනාට පස්සෙ මේකා අහවල් දවසෙ මැරෙයි, මළාට පස්සෙ කනවා." එහෙම කිය කියා බලාගෙන ඉන්න, එහෙම නිගමනයක් කරන්න අපිට බෑ.

ඉතින් මොකටද බිඳිච්ච බිත්තර ගැන මෙච්චර දඟලන්නෙ? කොහොම හරි කමක් නෑ කටට රහට කන්න ක්‍රමයක් තමයි හොයන්නෙ. "බැදල කෑවම හරි රසයි, තම්බල කෑවම රසයි, අමුවෙන් දාල කෑවම ඇඟට ගුණයි!" මේ ජාතියෙ විවිධාකාර දෘෂ්ටි අරගෙන කොහොම හරි බිත්තරයක් කන්න ක්‍රමයක් තමයි හොයන්නෙ. මොනවා කරගන්නද, කොහාට යන්නද මේ දඟලන්නෙ? කල්පනා කරල බලන්න.

මේ කාරණයෙදි ලංකාවෙ එක්තරා ප්‍රදේශයක සිද්ධ වෙච්ච සිදුවීමක් මේ විදිහට සඳහන් කරන්න පුළුවන්. එක්තරා ගෙදරක සුදු කුකුලෙක් ගෙනත් හැදුවා. හැබැයි ඌ ද්විලිංගික කුකුලෙක්. කුකුල වගේ කරමලේ තිබුනට ඌ කිකිළියක් කියල කවුරුවත් දැනගෙන හිටියෙ නෑ. මේ සතා ගෙදර තනි කරල හද හදා ඉන්න අතරෙ කැලේ ගිහින් තනියෙන් බිත්තර දැම්මා. මෙහෙම කාලයක් බිත්තර දමල, බිත්තර 15 ක් විතර දැම්මට පස්සෙ මේක ගිහින් රකින්න පටන් ගත්තා. නමුත් ගෙදර අය දන්නෙ නෑ. මොකුත් සෝදිසියක් කළෙත් නෑ. ඌ අඬලන සතෙක්. කරමලෙත් තියෙනවා. නමුත් කිකිළි. ටික දවසක් යනකොට බිත්තර ටික රකල පැටව් 12 ක් එක්ක ගෙදර ආවා. එතකොට තමයි ගෙදර උදවිය දැනගත්තෙ, තනි සතාගෙ බිත්තරවලින් පැටව් හැදෙන ක්‍රමවේදයක් තියෙනවයි කියල. මේ තමයි ලෝකයේ තියෙන විපර්යාසයක හැටි.



දැන් මේක සිද්ධ වුනේ කොහොමද? බිත්තරයක් රකිල පැටව් බිහි නොවෙන්න කුකුලෙක්ගෙන් ලැබිය යුතු එක්තරා කොටසක අඩුපාඩුවක් තියෙනවා. බිත්තරය දැම්මත් ඒ අඩුපාඩුව නිසයි රකිල පැටව් හැදෙන්නෙ නැත්තෙ. මෙතැනදි කුකුල් ගඳ (රසායනික සංයුතියක්) කියල දෙයක් තියෙනවා. බිත්තරය පෝෂණය වෙන්න අවශ්‍ය කරන දෙයක් ඒ ගන්ධයෙ තියෙනවා. පෝෂණයට අදාල ඒ කොටස කුකුලෙක්ගෙන් ලැබෙනවා. අනෙක් කොටස කිකිළිගෙ ශරීරයේ පරිවර්තනයෙන් හැදිලයි තියෙන්නෙ. හැබැයි උපදින්න ඉන්න සතුන්ගෙ කර්ම ශක්තියෙන් මේ කුකුල් ගඳ කියන එක ද්විලිංගික කිකිළියකගෙන්ම ලැබෙන්නත් පුළුවන්. ඒක ලැබුන නම්, ඔය හැදෙන්නෙ නෑ කියන බිත්තරත් රකෙන තත්වයට පත්වෙලා පැටව් හැදෙනවා. මොකද ගන්ධබ්බයෙක් බිත්තරය ඇතුලෙ ඉන්න නිසා. එහෙම නැතුව ගොවිපොළ (ෆාම්) බිත්තර කියල අමුතු ජාතියේ බිත්තර නෑ. පුළුවන් උපක්‍රමයකින් ඔය බිත්තර අවශ්‍ය සියලු පෝෂ්‍ය පදාර්ථ සහිතව රක්කෙව්වොත් මේ කතාවෙ අග මුල බලාගන්න පුළුවන්. හැබැයි මොන උපක්‍රම යෙදුවත් ඒ විදිහට අඟපසඟ සහිතව බිත්තරයෙන් පැටව් එළියට එන්නෙත් ඒ ඒ සතුන්ගෙ කර්ම ශක්තිය අනුව.

මේ නිසා එක්තරා පෝෂණයක අඩුවක් මිසක් ඇතුලෙ සතෙක් / ජීවයක් නැතිව බිත්තරයක් හැදෙන ක්‍රමයක් නෑ. කොහොමටවත් ගන්ධබ්බයෙක්ගෙ ඔක්කන්ති වීමක් නැතිව, එහෙම ආරම්භ කරන්නෙ නැතිව, මුං ඇටයක් තරම් ප්‍රමාණයකටවත් ගැබක් ඇතුලෙ කළල බීජයක් හටගන්න බෑ. ගන්ධබ්බයෙක් ගැබට එන්නෙ නැතිව ස්ත්‍රී පුරුෂ සෛල දෙකක් එකතුවෙන ක්‍රියාවලිය සිද්ධ වෙන්නෙ නෑ. මේක මූල ධර්මයක්. මව් පිය දෙන්නෙක් සංවාසයේ යෙදුනත් ශුක්‍රාණු ඩිම්බාණු කියන ඉතාම කුඩා සෛල දෙක එකතු වෙලා ඒකෙන් තමයි මූලික සෛලය හටගන්නෙ. ඒක ඇහැට පේන්නෙ නෑ. කාලයක් ගියාම අන්වීක්ෂයකින් බැලුවමයි පේන්නෙ. එහෙම නැත්නම් දිවැසක් තියෙන්න ඕන. ඒ තරම් කුඩා දෙයක්. මේ සෛල දෙක එකතු වෙන්න නම් ගන්ධබ්බයෙක් ඔක්කන්ති වෙන්නම ඕන. හැබැයි ඒකට පිරිමි සතෙක් ඉන්නම ඕන නෑ. තනි සතාගෙනුත් මේ සෛල දෙක හැදෙන්න පුළුවන්. ඒක සතුන්ට විශේෂයි.

එතකොට මේ කියන ගන්ධබ්බයෝ අප්‍රමාණයි. ඕනෑ තරම් ඉන්නවා. කර්ම ශක්තියෙන් ඊට අවශ්‍ය කරන පසුතලය හැදුනම විසාල ගන්ධබ්බ පිරිස් හුළං හමාගෙන යනව වගේ ඒ පැත්තට

හඹාගෙන යනවා. එහෙම ගිහින් ඒ ගැබට අවශ්‍ය ආවේණික, සුද්ධ හිමිකම් තියෙන ගන්ධබ්බයා හෝ ගන්ධබ්බයින් ඔක්කන්ති වුනාට පස්සෙ අනෙක් එවුන් එහෙමම ඇත් වෙනවා, ගහගෙන යනවා. ඒ තරම් විසාල ප්‍රදේශයක ඉන්නෙ. මනුස්ස ගන්ධබ්බයො බොහොම අඩු වුනත් සත්ව ගන්ධබ්බයො අප්‍රමාණයි. ඒ නිසා පුංචි ඉඩක් තිබුනත් පොකුරු පිටින් රිංගල එකාට මහ ගොඩක් හැදෙනවා. එහෙනම් කිකිළිට පැටව් හැදෙන ගති ලක්ෂණ කොච්චර නම් තියෙනවද? කී වතාවක් නම් බිත්තර දානවද? නමුත් මනුස්සයන්ට එහෙම අවස්ථා නෑ. සංවාසයේ යෙදුන පළියට දරුවො ඉන්නවද? මේ පවුල් සංවිධාන ඇති කරගත්තෙ අවුරුදු 40-50 ක් විතර මෑත කාලයෙදි. ඊට කලින් අම්මල තාත්තලට මොන සංවිධානයක්වත් තිබුනෙ නෑ. ඉස්සර කාලෙ සමහර විට ගෙදර පුරුෂයන් තුන්දෙනයි. එක භාර්යාවයි. නමුත් සත්තු පැටව් දානව වගේ දරුවො ලැබුනෙ නෑ. දරුවො කී දෙනාද ගෙවල්වල හිටියෙ! වැඩි ගණනක් හිටියෙ නෑ. බොහොම ටිකයි. සංවාසයේ යෙදුන පළියට දරුවො හැදුන නම් ගර්භාෂයවත් ඔරොත්තු දෙන්නෙ නෑ. ඉතින් ඇයි මේ මනුස්ස සංවාසයක් යෙදුන පළියට දරුවෙක් බඩට නොඑන්නෙ? සතුන්ට සාපේක්ෂව බලන කොට මනුස්ස ගන්ධබ්බයො බොහොම අඩුයි. මොකද කුසලයක් කරල කුසල් හිතකින් හටගත්ත සත්වයො ලෝකයේ බොහොම අඩුයි. පාප බරිත සතර අපාගත සත්වයෝම වැඩියි. මේ නිසා සංවාසයක යෙදුන පලියට බඩට දරුවෙක් එන්න මනුස්සයන්ට ඉඩ නැතුවට, එසැණින් ගැබ පිරෙනකල් පැටව් බිහිවෙන්න සතුන්ට ඉඩ තියෙනවා. ඒක ගන්ධබ්බයො වැඩි නිසා සිද්ධවෙන දෙයක්. ගන්ධබ්බයෙක් එන්නම ඕන සතෙක් හැදෙන්න.

එතකොට **කෙනෙකුට තිරිසන් ගති පහළ වුනොත් අවුරුදු බොහෝ ගණනක් විපාක ගෙවන්න වෙනවා. ලේසියෙන් ගොඩ එන්න බෑ. "පෙර අඟනක් එක් එළු දෙනක හිස සිඳා... ඇය ඇඟ ලෝම ගණනේ හිස් කැපුම් ලදා..." කියන මේ දහම් කවියෙනුත් ඒ බව සනාථ වෙනවා.** මේ නිසා තිරිසන් සත්ව වර්ග බොහොම වැඩියි. මේ කුකුල් ගති සහ කිකිළි ගති මිනිස්සු අතරත් බොහෝකොටම තියෙනවා. ඒ ගති ලක්ෂණ දරාගෙන කුකුල වගේ රිංගන්න අස්සටම යන අයට "ඕක හෙණ කුකුලා පරිස්සම් වෙයල්ලා"... ආදී වශයෙන් අදත් කියනවා. අද වුනත් ඔය සංඛාරයට කතා කරන්නෙ එහෙමයි. ඔය සංඛාරයේ ගති ලක්ෂණ තමයි කුකුලගෙ තියෙන්නෙ. ඉතින් සංඛාරයෙන් ජාතිය හටගන්නෙ ඔය විදිහට. ඒ ජාතියේ එකාට හිමි ජාතිය ඒකමයි. ඕවාට තමයි පෝෂණය හොයන්නෙ. කුකුල් පෝෂණය කුකුල් වැඩවලටට. ඒවාටම තමයි ඒවා සම්බන්ධ වෙලා තියෙන්නෙ. ඒවා මෙහෙමයි කියල ඔය ක්‍රමවේදවල හැටි දකින්න ඕන. ඒවා කවදාවත් සුගති මාධ්‍ය නෙවෙයි. පංච කාමයෙන් මත්වෙන සියලු මාධ්‍ය තියෙන්නෙ ඔය තිරිසන් කියන කොටසට හෝ ප්‍රේත, අසුර හෝ විනිපාතික අසුර කියන කොටසට. ඒක මිනිස්සු උගුලට අල්ලන ක්‍රමයක් මිසක් කවදාවත් සැනසිල්ලක් දෙන ක්‍රමයක් නෙවෙයි. ඕක කබලිංකාර (කය බලි කරන) ආහාරයක් වෙනවයි කිව්වෙත් ඒකයි.

මේ ඇස, කන, නාසය, දිව, ශරීරය කියන පහ හරියට බිලී කොකු 5 ක් වගෙයි. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ කියන ප්‍රිය මනාප දේවල් ඒ බිලී කොකුවල අමුණන ඇමවල් වගෙයි. ඔය පහ යමකින් ලබා දෙනවද, ඒවා තමයි අර බිලී කොකුවල ගහල තිබුණ වගේ ගිලගන්නෙ. ඕක ගිලගන්න යම් කිසි ඡන්ද රාගයක්, රසයට තිබෙන්නා වූ තණ්හාවක් ඇත්ද, බැඳීමක් ඇත්ද, ඒක තමයි ගිලගත්තම හිරවෙන තැන. ඔය තත්වයට පත්වුනාම කියනවා මාරයා ගිලගත්ත කියල. අපේ මනස, අපේ ගත හිත මාරයාට ගොදුරු වුනා. මෙන්න මේ ගති ලක්ෂණ තියෙන නිසා කය බිලියක් (බලියක්) කරගන්න එපා කියනවා. කය බලි කරන ආහාරයක් ගත්තොත් සිද්ධ වෙන්නෙ, ඔය කියන සතර අපායට මග පෑදෙන එක. කය බලි කරනවා, බිලි කරනවා කියන්නෙ දෙකම එකයි. බිලියක් කරගත්තම ඇම කෑවා වෙනවා. රසයට බලාපොරොත්තුවෙන් ගිලින්න ගියොත් ඇම ගිල්ල වගේ තමයි. ඒකෙන් සිද්ධ වෙන්නෙ රස තණ්හාව මුල් කරගෙන මානසිකත්වය දූෂ්‍ය වෙලා දුගතියට, තිරිසන් ලෝකයට යන්න මග පෑදෙන එක.

මේ නිසා කය බලි කරන කබලිංකාර ආහාරය තණ්හා නිධානයි, තණ්හා සමුදයයි, තණ්හා ප්‍රභවයි, තණ්හා ජාතියි. ඉතින් කබලිංකාර ආහාරය ගත්තම මොකද වෙන්නෙ? අවිද්‍යාව නිසා, "රසය ප්‍රශ්ණයක් නෑ, රසය හොඳයි, මොන ක්‍රමයකින් හරි රසය විඳින්න ඕන, රසය හරි වැදගත්, රසය හරි ආස්වාදයි, ඒක පාවිච්චි කළාට කමක් නෑ" කියල ඡන්දරාගයෙන් බැඳිල නිගමන ගන්නවා. ඒ නිසා ඒ ක්‍රියාවලියට අවශ්‍ය කරන සියලු කාය, වචී, මනෝ සංඛාර ගොඩනගනවා. ඒකෙ ආස්වාදයට ඇලිල බැඳිල ඉඳල තණ්හා උපාදාන ගොඩනගනවා. පුද්ගලයා ඒ රසවත් භාවයේ ඉන්න කෙනෙක් බවට පත්වෙනවා. රසය නිතරම හොයනවා. එහෙනම් ඒ පුද්ගලයා මෙලොවදීම, උපදින්න ඉන්න සත්වයාට අනුග්‍රහයක් හදාගත්ත වෙනවා.

"භූතානං වා සත්තානං ඨිතියා" මේ කබලිංකාර ආහාරයෙන් කරන එක වැඩක්. "සම්භවේසීනං වා අනුග්ගහාය" උපදින්න ඉන්න සත්වයාට අනුග්‍රහය පිණිසත්, ඉපදුන සත්වයාගෙ පැවැත්මටත් කබලිංකාර ආහාරය හේතු වෙනවා. මේක හරි ගැඹුරු තැනක්. තවම තෝරගෙන නෑ. මොකක්ද මේ උපදින්න ඉන්න සත්වයාට අනුග්‍රහය කියල කියන්නෙ? තවම මතු අත්භවට ගියේ නෑ. අන්න ඒ මතු අත්භවය හටගැන්වීමට අවශ්‍ය කරන අනුග්‍රහය කම්ම වට්ට කොටසින් දෙනවා. ඔහු කර්මයක් කරනවා. කර්ම වට්ට, ක්ලේස වට්ට කියන 2 ක් හදාගෙන විපාක වට්ට කියල එකක් හදනවා. (වට්ට කිව්වෙ යම් කිසි වැඩපිළිවෙලක් තුළ තමන් රැඳිල බැඳිල කරන වැඩ කටයුතු.) ඡන්දරාගය නිසා සසර ගමන යන අතරෙ ඒ විපාක වට්ටය අනුව පරිසරය සකස් වුනාම විපාක දෙනවා. එතකොට අර රසය හොඳයි, රසය පාවිච්චි කළාට කමක් නෑ, ඕකෙ සතෙක් නෑ... ආදී දෘෂ්ඨිවලට බැහැල අවිද්‍යාවෙන් යුක්තව හිතන, කියන, කරන වැඩපිළිවෙලක් ගෙනියනකොට අවිද්‍යාව සහිතව හටගන්නා වූ කර්මය සකස් වෙලා කර්ම වට්ට කියන සසර ගමනට හේතුවෙන කොටස ඇති වෙනවා. ඊට පස්සෙ තණ්හා, උපාදාන, භව කියන ක්ලේස වට්ටය ගොඩනගනවා. එහෙනම් ඒ පුද්ගලයා කම්ම වට්ට, ක්ලේස වට්ට කියන දෙකෙන් සසර ගමනට හේතුකාරක වන "සම්භවේසීනං වා අනුග්ගහාය" කියන කාරණය මෙලොවදීම සිද්ධ කරගන්නවා. ඊට පස්සෙ සංඛාර පච්චයා විඤ්ඤාණං කියල පටිසන්ධි විඤ්ඤාණයක් අරගෙන, විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූප පච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්සෝ, ඵස්ස පච්චයා වේදනා කියන තැන දුක් වේදනා විඳින්න හේතු වෙන කාරණා ටික විපාක වට්ට වශයෙන් ලබනවා. එහෙම ලැබුවට පස්සෙ තමන් අනුන්ට යම් කිසි අවැඩක් අසාධාරණයක් කළාද, ඒ කරපු අවැඩ අසාධාරණය වගේම ප්‍රතිවිපාකයකට ගොදුරු වෙච්ච එකෙක් වෙලා තමන්ටත් උපදින්න සිද්ධ වෙනවා.

**එහෙනම් කුකුලෙක් මරාගෙන කන එකේ පවක් නෑ, ඒක හොඳයි කියල ඒ ජාතියේ කතාවක් සමාජගත කළා නම්, මරාගෙන කන කුකුලෙක් වෙලා උපදින්න තමන්ටත් විපාක**

වට්ඨය හැදෙනවා. ඊට අදාල සංඛාර **ගොඩනගල හේතු යෙදුනොත් කුකුල් විඤ්ඤාණයකින් ගිහින් කුකුල් ගැබක කුකුල් නාමරූපයෙන් උපදිනවා. ඊට පස්සෙ සළායතන, ස්පර්ශ හැදිල තැලෙන පොඩිවෙන කැපෙන කෙටෙන ඔක්කොම වේදනා විඳින්න සිද්ධ වෙනවා. කරපු කර්මයේ විපාක ඉවර වෙනකල් ඔය විපාක වට්ඨය ගෙවන්න වෙනවා.** බිත්තර කෑවට කමක් නෑ, හොඳයි කියල ඒ රසයට ගිජු කරල, ඒ මතය සමාජයට දුන්න නම්, ඒකෙන් කර්ම වට්ඨය හදල අවිද්‍යා, සංඛාර, තණ්හා, උපාදාන, භව වෙලා, කර්ම වට්ඨ ක්ලේස වට්ඨ දෙක හදල, භව පච්චයා ජාති කියන උප්පත්ති ජාතියට කාරණා වෙලා පටිසන්ධියක් ඇල්ලුව නම්, පටිසන්ධි විඤ්ඤාණයේ පටන් ගෙන විපාක විඤ්ඤාණය හටගෙන විඤ්ඤාණ, නාමරූප, සළායතන, ස්පර්ශ, වේදනා කියල ඊළඟ භවයට ඕක විඳින්න විපාක වට්ඨයක් හැදෙනවා.

මේ තමයි සසර ගමන හැදෙන හැටි. **ඉතින් මේක මහා භයානක දෙයක්. අපි නොදන්නකමට, ඇත්තක් දැක්කෙ නැති කවුරුහරි කියන තර්ක වාදයකට කොටු වෙලා, මතයකට වහල් වෙලා, උතුමන් දිවැසින්, ඥානයෙන් දැකල කියපු සත්‍යය යථාර්ථය පැත්තකට දාල අපිට ඕන ඒවා කරන්න ගියාම, ඔය කියන්නා වූ අවිද්‍යා වැඩපිළිවෙලට බැහැල අනන්ත දුක් විඳින්න සිද්ධ වෙනවා.** මෙහෙම විපාක වට්ඨයක් එන කර්ම වට්ඨයක් නම් කරන්නෙ, මෙලොවදීම ඊට අනුරූප ක්ලේස වට්ඨය කියන කොටසක් ඇති වෙනවා. ඒකට එකතු වෙනව කියල දැනගත්ත නම්, අපි කවදාවත් ඔය ක්ලේස වට්ඨය ඇතිකරන කම්ම වට්ඨය කරන්නෙ නෑ. මේ කියන ක්ලේස වට්ඨය අපිට දකින්න පුළුවන්. නමුත් සැඟවිච්ච පැත්ත තමයි විපාක වට්ඨය කියල මැරුණට පස්සෙ ගිහින් සිද්ධ වෙන ක්‍රියාදාමය. ඒක දිවැසින්, සමාධියෙන් දකින්න ඕන. මෙන්න මෙහෙම පාප කර්මයක් සිද්ධ කරපු පුද්ගලයා අවිද්‍යාව නිසා ඇත්ත තෝරගන්න බැරිව මුලාවකට ඇත්ත කියල රැවටිලා කරන ලද්දා වූ කාය කර්ම, වචී කර්ම මුල් කරගෙන, ඒකෙන් හටගත්තා වූ ක්ලේස වට්ඨයක් ගොඩනගාගෙන, මෙන්න මේ විදිහට තමන්ගෙ මානසිකත්වය කෙළෙසගෙන, ඒ ගති ලක්ෂණයෙන් උපාදාන වෙලා ඉඳල, උපාදාන පච්චයා භවෝ, භව පච්චයා ජාති කියල පටිසන්ධි විඤ්ඤාණයකින් ඊළඟ භවය අල්ලල, කර්මජ චිත්තජ වශයෙන් නාමරූප, සළායතන කියල සූක්ෂම කය හදාගෙන, ගන්ධය නමැති සූක්ෂම උතුජ ආහාරයෙන් ගොඩනැගුණ නාමරූපයෙන් ගන්ධබ්බය හැදිල, මව් ගැබට ගිහින් මව්ගෙ ගැබෙන් ගත්ත ආහාරයෙන් සැකසුණ සළායතනවලින් මස් ලේ සහිත ඝනීභවන කයක් හදාගෙන ස්පර්ශය ලබල, දුක්ඛ ස්පර්ශයෙන් දුක්ඛ වේදනාවෙන් දැවිල පිච්චිලා කැපිල කෙටිල අනෙක් අයට ගොදුරු වෙනවයි කියන කාරණය දිවැස් තියෙන අය දකිනවා. කර්මයේ විපාක තියෙන තාක් කල් විපාක වශයෙන් විඳින්න සිද්ධ වෙනවා.

මේ කාරණය යථාර්ථයෙන් තේරුම් ගත්ත නම් නැවතත් ඔය ගැන හිතන්න යන්නෙ නෑ. “කවුද කියන්නෙ මේ බිත්තරය ඇතුලෙ සතෙක් නෑ කියල? බිත්තරය නිකං හටගන්නවා කියල කවුද කියල තියෙන්නෙ? මොන දිවැසිවරයද කිව්වෙ? මොන ලොව්තුරා බුදුන් වහන්සේද? මොන පසේ බුදු වරයන් වහන්සේද? මොන රහතන් වහන්සේද? මොන ඍද්ධි බලයක් ඇති දිවැස් ඇති කෙනෙක්ද කිව්වෙ? එහෙම නැත්නම් මොකවත්ම නැති නිකං පරීක්ෂණ කරන භෞතිකවාදීන්ද ඕව කියල තියෙන්නෙ?” යථාර්ථය දන්නව නම් මෙහෙම කියල ඒ වගේ මත ප්‍රතික්ෂේප කරනවා.

ගොවිපොළ (ෆාම්) බිත්තර ඇතුලෙ සතෙක් නෑ කියන මතය නිසි තතු නොදැන නොදැක භෞතිකවාදීන් කියපු කතාවක් මිසක් වෙනත් හරයක් ඔය මතවල නෑ. අධ්‍යාත්මික වූ ඉතාම සුළු දෙයක්වත් හොයාගන්න බලාපොරොත්තුවක් නැති භෞතිකවාදීන් කොහොමද ඇත්ත හොයන්නෙ? ඇහැට පෙනෙන, කනට ඇහෙන, නාසය, දිව, ශරීරය කියන මේවාට දැනෙන ප්‍රමාණයෙන් සහ ලෝක සම්මත විද්‍යාවට අද ගෝචර වෙලා තියෙන මට්ටමින් කොහොමද ඇත්තක් හොයාගන්නෙ? ඔය පංචේන්ද්‍රිය ගෝචර මට්ටමෙන් වාසියට අරගෙන මත හදාගෙන තර්ක වාද හදාගෙන, බුදුන් වහන්සේගෙ අනාවරණ ඥානයට විතරක් ගෝචර වෙන, එහෙම නැත්නම් බුදුන් වහන්සේට සහ දිවැස් තියෙන අභිඥා ලාභීන්ට විතරක් ගෝචර වෙන සමහර යථාර්ථවාදී කරුණු තර්ක වාදයෙන් විසඳන්න යනවා. නමුත් ඒවා බුදුන් වහන්සේගේ අනාවරණ ඥානයට විතරක් සහ සමහර කරුණු බුදුන් වහන්සේ ඇතුළු දිවැස් ලාභී අභිඥා ලාභීන්ට විතරක් ගෝචර වෙන නිසා තර්ක වාදයෙන්වත්, භෞතික පරීක්ෂණවලින්වත් විසඳන්න බෑ. මේ වගේ පටු මුලා තර්කවලින් ලෝකයේ සිද්ධ වෙන අති සියුම් සිද්ධිවල ඇත්ත නැත්ත තෝර ගන්න බෑ. ඉතින් එහෙම කරන්න ගියොත් සිද්ධ වෙන්නෙ ඒ මතයට, තර්කවාදයට මූලික වෙච්ච කෙනාට අප්‍රමාණව දුක් විපාක විඳින්න සිද්ධ වීම. ඒවාට මුක්කු ගහල සම්බන්ධ වෙච්ච අයටත් විපාක විඳින්න සිද්ධ වෙනවා. කරන්න දෙයක් නෑ. එහෙම දිගටම යන ස්වභාවයක් තමයි තියෙන්නෙ.

මේ නිසා අපිට දැනගන්න පුළුවන් වුනත් නැතත්, බිත්තරය කියල යමක් හටගන්න විදිහක් නෑ හේතුවක ඵලයක් වශයෙන් මිසක් වෙනත් විදිහකින්. හේතුවක් නැති ඵලයක් ලෝකයේ හටගන්නෙ නෑ. සතෙක් හටගන්න අවශ්‍ය කරන යම් කිසි ශ්‍රාවයන් එකතු වෙලා, ඊට අවශ්‍ය කරන යම් කිසි මූලික සම්පිණ්ඩනයකින් විශේෂිතව හැදිච්ච ගැබක් තමයි බිත්තරය කියන්නෙ. ඒක වැඩෙන්නෙ නැති වෙන්න වෙනම හේතු තියෙන්න පුළුවන්. ඒකයි රැක්කෙව්ව පලියට වැඩෙන්නෙ නැත්තෙ. ඒකට හිමි ආයු කාලය ගෙවිල ඉවර වුනාම ගන්ධබ්බයා පිටවෙලා ගිහින් එතැනින් ඒක කුණු වෙලා යනවා. නැත්නම් කවුරුහරි තම්බගෙන කනවා. හැබැයි තම්බන කෙනාට ඒකෙ පාපය හිමි වෙනවා. ඒ තත්වයට පත්වෙලා එතැනින් එහාට යහපත් පැත්තට වැඩෙන්නෙ නැත්තෙ, ලෝකයට කරපු අපරාධයට වන්දි ගෙව ගෙවා අනන්ත දුක් විඳගෙන ඉන්න සිද්ධ වෙන නිසා.


**අනෙක ගොවිපොළේ හදන (ෆාම්) බිත්තර කියන්නෙ කිකිළියන් විසාල ප්‍රමාණයක් පුංචි කූඩුවලට කොටු කරල, කුකුලන්ගෙන් වෙන් කරල, උන්ගෙ නිදහස අහිමි කරල, ජීවීන්ට බිහිවෙන්න ඉඩ නොදී, අසාධාරණයෙන් බලහත්කාරයෙන් ලබාගන්න දෙයක් බවත් විශේෂයෙන් තේරුම් ගත යුතුයි.** ජීවයක් තිබුනත් නැතත් දයානුකම්පාව මුල් කරගෙන අසාධාරණයෙන් ගොඩනගපු දෙයක් නිසා ඒවා අනුභවයෙන් වැළකී සිටීම කොහොමත් උතුම් ගුණයක්. මේ නිසා කොහොමටවත් හිතන්න එපා, බිත්තර කියන්නෙ නිකම්ම නිකං අපිට කන්න හැදිච්ච දෙයක් කියල. යථාර්ථයෙන් මේ කාරණය තේරුම් අරගෙන මෙලොව පරලොව අභිවෘද්ධිය සලසා ගන්න.

(ඉතිරි කොටස ලබන කලාපයෙන් )

*පූජ්‍යපාද වහරක අභයරතනාලංකාර තෙරුන් වහන්සේ විසින් යළි මතු කළ සැඟවුනු දහම් කරුණු ඇසුරෙන් සකස් කළේ:*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# පටිභාන කවීත්වයෙන් නැගී ආ සුවිශේෂීය ප්‍රතිකර්ම මගින් ලෙඩ රෝග සුවපත් කළ හැටි



වහරක අභයරතනාලංකාර හිමි

**පසුගිය කලාපයෙන්...**

දුර්ලභ වූ පටිභාන කවීත්වය තුළින් ගෙතුණු පුංචි දහම් කථාවක්...

## අභයරතනාලංකාරය - 10

පටිභාන කවීත්වය ලැබිච්ච මුල් කාලයේ ඒ සමාධි ක්‍රමයෙන් යම් කිසි කෙනෙක් පිළිබඳ මොනවහරි අවශ්‍ය විස්තරයක් ලබාගන්න කොට, ඒ ගැන අධිෂ්ඨාන කරල නවගුණ ගාථාව කියන්න පටන් ගන්නවා. එතකොට නවගුණ ගාථාවෙ කොතැනක හරි ඒ පදයක් හෝ අකුරක් ළඟින් කවි පෙළ නැගෙන්න පටන් ගන්නවා. ඒ අනුව අදාල කටයුත්ත ගැන කවියෙන්ම කියවෙනවා. ඒ පිළිබඳ සියලු කටයුතු කියල ඉවර වුනාම ඒ ක්‍රියාවලිය නවතිනවා. කාරණය රෝගයක් නම්, රෝගය - ඊට හේතුව - රෝග නිවාරණය - ඊට ක්‍රමවේදය කියන මේ කරුණු අන්තර්ගතවීම තමයි මෙතැනදි සියලු කටයුතු කියල අදහස් කළේ.

අපි හිතමු කාගෙහරි ලෙඩක් රෝගයක් ගැන අහන්න හදනව කියල. එතකොට ඒ පුද්ගලයගෙ අසනීපය ගැන කියවේවා කියල අධිෂ්ඨාන කරල, ඉතිපි සෝ භගවා අරහං - සම්මා සම්බුදු ගුණ නැණ බල ගෙන යහපත් මග සිහියට ඒවා - හටගත් ලෙඩ රෝ දකින නුවණ ගෙන මොහුගෙ මෙබඳු රෝ වැටහේවා...

ඔය විදිහට රටාවකට නිරායාසයෙන්ම ඒ සියලු විස්තර කවියෙන්ම ගෙතිල එනවා. සිද්ධ වෙච්ච දේවල්, ගෙවිච්ච දේවල්, කර්ම විපාක, ප්‍රතිකර්ම, බෙත් හේත්... මේ ඔක්කොම විස්තර ගෙතිල එනවා. මට කිසිම ආයාසයක් ගන්න දෙයක් නෑ. මම ඒ ගැන කලින් හිතන්නෙ නෑ. මේ පුද්ගලය මාව මුණගැහිල මොකක්ද අහන්න ආවෙ, මොකක්ද කරගන්න ආවෙ... ඒවා එකක්වත් මම දන්නෙ නෑ. එවෙලෙට යන්ත්‍රය ක්‍රියාත්මක කළා වගේ සියල්ල ගෙතිල එනවා. එහෙම තමයි මුල් කාලෙ පටන් ගත්තෙ. ඊට පස්සෙ නවගුණ ගාථාව නොකියත් විස්තර එන්න පටන් ගත්තා. නමුත් බුදුන් වහන්සේ සිහි කරල ගන්න නිසා ඒ ගාථාව ගන්න එක හුගක් වටිනවා.

ඒ විදිහට බුදු ගුණ සිහි කරල **ගන්නකොට කවුරු මොන ප්‍රශ්නයක් ඇහුවත්, ඔය බුදු ගුණ නවය අතරින් මේ ලෝකයේ ඕනෑම සිද්ධියක් ගැන අග මුල හෙළි වෙනවා.** හැබැයි ඕක මේ වෙනකොට සැඟවිච්ච දෙයක්. **ලෝකයා දන්නෙ නැති දෙයක්. නමුත් මගේ ඇත්දැකීමට ආපු දෙයක්.** බොහොමයක් උදවිය, මේ මේ ගුණය නිසා මෙහෙම කියනව කියල ඔය ගුණ නවය වර්ණනා කරන එක විතරයි කරන්නෙ. ඒ ගුණ තුළින් ඵල ප්‍රයෝජන ගන්න හැටි දන්නෙ නෑ. **නමුත් මේ තුන් ලෝකය තුළම මොනවහරි යමක් ඇහුවොත්, ඒ අරමුණ කරා යන්න පුළුවන් මාත්‍රයක් මේ ගුණ නවය අතර තියෙනවා. අවශ්‍ය කාරණය අධිෂ්ඨාන කරල මේ ගුණ නවය කියාගෙන යද්දි, අදාල ශබ්ද මාත්‍රය එනකොට එතැනින් ඊට අවශ්‍ය කාරණයට පාර කැපෙනවා.** මේ තුන් ලෝකයේ සියලු දේ දන්න ලොව්තුරා බුදුන් වහන්සේගෙ සියලු ගුණ කැටි වෙච්ච ඔය ගුණ නවය තුළින් තමයි ඒ අවශ්‍ය කාරණයට පාර විවර වෙන්නෙ. කවුරු මොනව ඇහුවත් ඔය ගුණ නවය තුළින් ඒ කාරණයට යන්න පාරක් හැදෙනවා. ඒක කොතැනින්ද කියල කියන්න බෑ. ඉතිපි... කියල පටන් අරගෙන භගවාති කියල අවසන් වෙනකොට ඔය අතරට තුන් ලෝකයේ සියලු අරමුණු කරා යන්න පාරක් තියෙනවා. අවශ්‍ය කාරණය හිතල ගාථාව කියාගෙන යනකොට ක්ෂණයකින් මනසත් ඒ පාරෙන් රිංගනවා. එහෙම ගියාට පස්සෙ ඒ පැත්තෙ සියල්ල පේන්න ගන්නවා. එහෙම ක්‍රමවේදයක් තමයි මේ. **මේ ක්‍රමය හුරු වුණාට පස්සෙ කවුරු ගැන මොනව ඇහුවත් ඒ පැත්තට මානසිකත්වය වැඩ කරනවා. එහෙම ගිහින් ඒ පැත්ත විනිවිද දකින්න පුළුවන්.** ඊට පස්සෙ නැවත ගාථාව සිහි කරන්න ඕන නෑ. ඒ මාධ්‍යයෙන් ගිහින්, යම් කිසි කළ යුත්තක් ඇත්ද, ප්‍රතිකර්මයක් ඇත්ද, වෙළාව තියේ නම් ඒ සියල්ල විවර කරල තමයි ආපහු එන්නෙ.

මේ වගේ කටයුතුවලින් මනුස්ස ලෝකයේ විවිධ පුද්ගලයන්ට වගේම නොපෙනෙන ලෝකයේ ගන්ධබ්බ, ප්‍රේත... ආදී විවිධ කොටස්වලටත් සෙත සලසල දුන්න වාර ලක්ෂ ගණනක් කියල කියන්න පුළුවන්. එබඳු අවස්ථාවලින් එකක් දෙකක් පහතින් සඳහන් කරන්නෙ, මේ ක්‍රමවේදය පිළිබඳව කරුණු ඉස්මතු කරල තියන්න.

එක අවස්ථාවක මව්පිය යුවලක් තමන්ගෙ අවුරුදු දහයක විතර කුඩා ගැහැණු දරුවෙක් එක්ක මාව මුණගැහෙන්න ආවා. මේක සිද්ධ වුනේ 1986-87 වගේ කාලයේ. දරුවා ගැන යමක් දැනගන්නයි ඒ පිරිස ආවෙ. ඒ වෙලාවෙ අසනීප සහ නොයෙක් කටයුතු ගැන දැනගන්න විසිපස් දෙනෙක් විතර ඇවිත් හිටියා. ඒ අතර මුලටම වගේ මේ කියන දෙමව්පියන් සහ දරුවගෙ වාරය ආවා. කටයුත්ත ඇරඹුනේ මෙහෙමයි.

ඉතිපි සෝ භගවා අරහං - සම්බුදු ගුණ නැණ බල මතු වේවා - සම්බුදු නැණ සත් බස ගෙන දේවා - සම්බුදු රජිඳුට නැමදුම වේවා - සම්බුදු ගුණ දරු වෙත සෙත දේවා...

ආරම්භය කවියෙන් නැගුනෙ මේ විදිහට. විස්තරය ඉවර වෙනකොට ඉතා හොඳට තේරෙන භාෂාවෙන් කවි හාර පන්සියයක් විතර කියවිලා අවශ්‍ය විස්තරය හෙළිදරව් කරල දුන්නා. ඒ සිද්ධියේ සාරාංශය මෙහෙමයි.

එක්තරා ගමක බුදු බව පතන උපාසක මහත්තයෙක් හිටියා. ඔහු තමයි පන්සලේ ලොකු උපාසක මහත්තයා. මස් මාංස නොකෑමේ ගුණ කියන ඔහු පන්සලේ හාමුදුරුවන්ගෙත් ගජ මිතුරෙක්. මේ උපාසක මහත්තයගෙ දානය දවසට අවට උපාසක උපාසිකාවන් විශේෂයෙන් සම්බන්ධ විය යුතුයි. හාමුදුරුවොත් සැදැහැවත් උපාසක මහත්තය ඇතුලු ඒ පිරිසගෙ දානය බොහොම

වර්ණනා කළා. සුදු රෙද්දකින් ඔතාගත්ත බත් පෙට්ටිය උපාසක මහත්තයගෙ හිස මත. අනෙක් එළවළු ව්‍යංජන, මැල්ලුම්, තම්බපු අල බතල... ආදිය උපාසක උපාසිකා පිරිවරගෙ හිස මත. මේවා අතින් එල්ලගෙන ගියොත් උපාසක මහත්තයගෙන් හොඳට බැණුම් අහන්න වෙනවා. ඒ නිසා සුදු ලේන්සුවක් හිස මත තියල ඒ මත දාන භාජන තියාගන්න ඕන. බුදු බව පතන මේ උපාසක මහත්තයගෙ ගුණ රාවය අවට ගම්වලත් පැතිරිලා තිබුණා.

එක දවසක් දානය ගෙනියනකොට පියවරෙන් පියවර සාදු නාදය දෙන අතර තුරේ උපාසක මහත්තයගෙ පය මුලක හැපිල ඇදගෙන වැටුනා. බත් පෙට්ටිය පල්ලමට පෙරලිලා ගිහින් බත් විසිරිලා ගියේ, බත් යට තිබුන තම්බපු බිත්තර හත අටකුත් එක්ක. කොල්ලන්ගෙත් ගම්මුන්ගෙත් හූ හඬ සහ කොලොප්පම් මැද ඔහු එදාම ගමෙන් පැනල ගියේ නැවත ගමට නොඑන අදහසින්. අවුරුදු 80 කට විතර ආසන්න වුණ මොහු පැනල ගිහින් අනුරාධපුර ප්‍රදේශයේ සුදු වතින් සැරසිලා සිල් ගත්ත කෙනෙක් විදිහටම කල් ගෙව්වා. ඔහු ඉඳගන්න පරිහරණය කළේ, මැදට මහ නෙළුම් මලක් සහ කොන් හතරට නෙළුම් මල් හතරක් සහිත ගල් ඇහැපත්වලින් වියපු රටා පැදුරක්. වකුටු වෙලා නිදන තරමට ඒක දිගයි. වැඩිපුර සෙනග ගැවසෙන තැන්වල කිට්ටු තැනක පැදුර එලාගෙන පිරිස යනකල් ගල් ගෙඩියක් තිව්ව වගේ භාවනාවෙ ඉන්න මොහුට ඒ වටේ ඉන්න පිරිස ගරු නොකර ගියොත්, ඔවුන්ට බැණ බැණා පැදුරත් අකුලගෙන තවත් තැනකට යනවා.

දවසක් එක්තරා කාන්තාවක් බඩගින්නෙ අඬන තමන්ගෙ දරුවට කිරි ටිකක් දෙන්න සෙනග අඩු තැනක් බලනකොට, තමන්ගෙ සීයා වගේ මේ උපාසක මහත්තය භාවනා කරන තැන දැකල එතැනට ගිහින්, සීයෙ පුතා බඩගින්නෙ අඬනවා, කිරි ටිකක් දෙන්න පැදුර පොඩ්ඩකට දිග අරින්න පුළුවන්ද කියල ඇහුවා. දරාගන්න බැරි තරම් කෝපයට පත්වෙච්ච උපාසක මහත්තය නලියමින්, මම කවුරු කියල හිතාගෙනද පැදුරෙ ඉඩ ඉල්ලන්නෙ කියල බැණ බැණා පැදුරත් අකුලගෙන කිහිල්ලට ගන්නවත් එක්කම එතැනම මැරිල වැටුනා. බුදු බව පැතුවත් පිරිමිකමට නොගැළපෙන කටයුතු කරපු මොහු ඒ හේතුවෙන් ස්ත්‍රී අත්බවක් ලබල ඉපදුනා. මොකද ලෝකයෙන් යමක් ගන්න බලාපොරොත්තු වෙනව නම් ඒක තමයි ස්ත්‍රී (ඉතිරි) ගතිය. ලෝකයට යමක් දෙන්න බලාපොරොත්තු වෙනව නම් ඒ තමයි පිරිමි (පිරීම) ගතිය. නමුත් නිවන් අවබෝධයට ස්ත්‍රී පුරුෂ භේදයක් නෑ. කෙනෙක්ගෙ ස්ත්‍රී පුරුෂ භාවය තමන් වඩන සංඛාර අනුව තීරණය වෙනව මිසක් ඒකට පින් පව් සම්බන්ධයක් නෑ. (මේ පිළිබඳ වැඩිදුර විස්තර දැනගැනීමට හෙළ බොදු පියුම 17 කලාපයේ පළ වූ නිරුක්ති සම්බන්ධ ලිපිය බලන්න) **මේ උපාසක මහත්තය තමන් ළඟ නැති ගුණයක් පෙන්වල ලාභ කීර්ති ප්‍රසංසා තමයි ලෝකයෙන් බලාපොරොත්තු වුනේ. ඒවා බලාපොරොත්තුවෙන් අර විදිහට ක්‍රියා කිරීමේ ප්‍රතිඵලයක් විදිහට, අකුලගෙන කිහිල්ලෙ ගහ ගත්ත පැදුරෙ කුහරය පෙනහැල්ලට ගිහින් පෙනහැල්ලෙ සිදුරක් ඇතිවයි ඉපදුනේ.** උපාසක මහත්තය තමන්ටම කියල වෙන් කරගත්ත පැදුර විශේෂයෙන් මමත්වයෙන් ගත්තා. "කොහේවත් යන ස්ත්‍රියකට දෙන්න මගෙ පැදුර!" කියන මානසිකත්වයත් එක්ක ඇතිවෙච්ච දාහ ගතිය නිසා තමයි, හුල්ල හූල්ල ගිහින් මැරිල ඉපදිලා පෙනහැල්ලෙ සිදුරක් හටගත්තෙ. ඒ දැරිය තමයි දැන් මේ මා ඉදිරිපිට ඉන්නෙ.

කවියෙන් කියාගෙන ගිය මේ විස්තරය මෙහෙම කිව්වත් අවසාන කවියේ අර්ථය භයානකයි. නමුත් දැන් මොනව කරන්නද, කවිය කියල ඉවරයි. දරුවගෙ මවගෙ මුහුණෙ කඳුළු ගලා ගෙනගියා. වෙනත් කරන්න දෙයක් නැති නිසා, මෙහෙම කිව්වට ගණන් නොගෙන දරුවා වෛද්‍යවරයෙකු ලවා පරීක්ෂා කරල බලන්න කියලත්, පපුවේ සෙම ටිකක්හරි තියෙන්න පුළුවන් කියලත් මම ඒ අය සනසන්න කිව්වා. "අනේ මහත්තයෝ ළමය පොඩි කාලෙම පරීක්ෂා කරපු වෛද්‍යවරු, දුවගෙ පපුවෙ පෙනහැල්ලෙ සිදුරක් තියෙනව කියල කිව්වා. ඒකට ප්‍රතිකර්මයක් කරන්න බලන්නමයි අපි ආවෙ" මේ තමයි ළමයගෙ මව කියපු කතාව. ලෝක ස්වභාවයට සාක්ෂියක් ඇස් පනාපිටම දැකපු මටත්, ඇවිත් හිටපු අනෙක් පිරිසටත් සුසුම් හෙළුනෙ නිරායාසයෙන්මයි.

දැන් ප්‍රතිකර්ම විදිහට සමාධි කවියෙන් ගෙතිල ආවෙ අමුතුම ක්‍රමවේදයක්. මේ තමයි ඒ ක්‍රමවේදය. පන්සලට දානයක් ගෙනියන විදිහට බත් පෙට්ටියක් හදාගෙන, හෝටලයක තම්බල තියෙන පොතු ඇරගත්ත බිත්තර කිහිපයක් දැරියට හොරෙන් බත් පෙට්ටියේ මැද හංගල, තවත් ළමයි පිරිසක් එක්ක පන්සලට දානය ගෙනියන විදිහට ඇය ලවා කියවමින් යන්න ඕන. එහෙම යනකොට ලිං තොටක් තියෙන ස්ථානයක් ළඟදි ඇයට නොදැනෙන්න බත් පෙට්ටිය විසිවෙන විදිහට අතින් ඇනල, ඊට පස්සෙ ඔක්කොම එකතු වෙලා "අපිත් උඹට රැවටුනා, හාමුදුරුවන්ට බිත්තර තම්බගෙන යන හොර උපාසිකාව" කිය කියා ඇය අඬනකල් කොලොප්පම් කරන්න ඕන. ඊට පස්සෙ ගෙනිච්ච අනික් ව්‍යංජන, අල බතල... ආදියත් එතැනම දාල, ඇගේ ඉන්න අමනුස්සයින්ට ඒවා බාරයි කියල, ඇයව ලිඳකින් නාවගෙන වෙනත් ඇඳුම් අන්දවාගෙන යන්න ඕන. දාන පෙට්ටිය ගෙනියනකොට සුදු රෙදි පටියක් උතුරු සළුව වගේ දාගෙන ගිහින් ඒකත් එතැනම දාන්න ඕන.

ඊට පස්සෙ මැදට නෙළුම් මලක් සහ හතර කොනට නෙළුම් මල් හතරක් හිටින විදිහට හදපු ගල්ඇහැ රටා තියෙන පැදුරක් අකුලගෙන ඇවිත්, දරුවා කැමති ලස්සන සෙල්ලම් බඩුවකුත් අරගෙන එන්න කියල දැනුම් දුන්නා. ඊට පස්සෙ දරුවගෙ දකුණු කිහිල්ලට අකුලපු ගල්ඇහැ පැදුර තියල, සෙල්ලම් බඩුව මගේ අතට අරගෙන ඒක දැරියට දීල, මේක අරන් දුව පැදුර මට දෙන්න කියල දැරියගේ කැමැත්තෙන්ම පැදුර ඉවතට ගන්න ඕන. ඊට පස්සෙ ඒ පැදුර පන්සලක ධර්ම ශාලාවකට දාල යන්න කියලත් ඒ අයට දැනුම් දුන්නා. එදා පපුවට වැදුණ දාහය නිසා හටගත්ත විකෘති ශක්තිය ඉවත් කරන ක්‍රමවේදයක් තමයි සමාධි කවිවලින් ප්‍රතිකර්ම විදිහට සිද්ධ කළේ. එතැන් පටන් අවුරුදු දෙකක් විතර යනකොට පෙනහළු ආබාධය දුරු වෙලා සුව වෙන බව තමයි සමාධියට වැටහුණේ.

ආයුර්වේද විද්‍යාව වැනි විෂයන් **වගේම නක්ෂත්‍රය ආදිය පිළිබඳවත් සමහරු වරදවා අදහස් අරගෙන, බුදු පියාණන් වහන්සේත් මේවා තිරස්චීන විද්‍යා විදිහට පෙන්වල තියෙනවයි කියනවා. නමුත් උන්වහන්සේ මෙබඳු දේවල් ගැන දේශනා කළේ, යම් භික්ෂුවක්, සැදැහැ සිතින් දායකයො දුන්න බොජුන් වළඳල ජීවිකාව පිණිස එබඳු විද්‍යා කටයුතුවල නිරත වීම තිරස්චීන ක්‍රියාවක් විදිහට. තිරස් අතට යන වැඩපිළිවෙල හෙවත් තිරිසන් වැඩපිළිවෙලයි තිරස්චීන. භික්ෂූන් වහන්සේ නමක් ජීවත් වීම සඳහා එබඳු ක්‍රියාවන්වල නිරත වුනොත් ඒක නිවන් මගට බාධාවක්**



**වෙනවා. එහෙම නැතිව උන්වහන්සේ එබඳු විද්‍යාවන්ට පහර ගහල නෑ.** ජීවක වෙද මහත්තය කියන්නෙ බුදු රජාණන් වහන්සේටත් ප්‍රතිකර්ම කරපු සෝවාන් ඵලයටත් පත්වෙච්ච වෛද්‍යවරයෙක් බව දහමේ සඳහන් වෙනවා. **යම් භික්ෂුවකට රෝගාබාධයක් හැදුනම සහයෝගයෙන් ප්‍රතිකර්ම කරගන්න කියලත්, ගිලානෝපස්ථානය බුද්ධ උපස්ථානයක් වශයෙන් සලකන්න කියලත් උන්වහන්සේ අනුසාසනා කරල තියෙනවා.**

ගස්වැල් වගේම ලෝකයේ නොයෙක් ද්‍රව්‍යවල පද අර්ථ දකින නුවණක් (ද්‍රව්‍ය පදාර්ථ ඥානය) තිබුණ පෙර හිටපු මහ සෘෂිවරු, සත්වයින්ට ඇතිවෙන රෝග පිළිබඳව තතුත්, ඒවා හැදෙන්න හේතුත්, නිරෝගී වෙන ආකාරයත්, ඒවාට ප්‍රතිකර්මත් පෙන්වා දුන්නා. මේ බලාපොරොත්තු වෙන්නෙ, මම එබඳු ලෞකික ඥාන ලාභියෙක් කියල අඟවන්න නෙවෙයි, ඒවා සත්‍ය බව ඔප්පු කරල පෙන්වන්න යම් මට්ටමක හැකියාවක් මේ කාලයෙත් ලබන්න පුළුවන් බවට සාක්ෂි කිහිපයක් පෙන්වන්න. ඒ වගේම **මේවා විස්තර කරන්නෙ කිසිම ලාභ කීර්ති ප්‍රසංසාවක් ලබන්න නෙවෙයි, අධ්‍යාත්මික ඥාන බල ලබන්න උත්සාහ කරමින් බොදු මගත් ගමන් කරල නිවන් අවබෝධයට කටයුතු කරන පින්වත් පිරිසට මේවායේ සත්‍යතාවය / නිසැක බව වැටහිලා, ධෛර්යය වැඩි වෙලා, ඒ උතුම් ඵල ලබන්න උපනිශ්‍රයක් වේවා කියන අවංක හැඟීමෙන්.**

මම පදිංචි වෙලා හිටපු ගම් ප්‍රදේශයේම මට ඥාතිත්වයකුත් තියෙන, රෝහිනී කියල හඳුන්වන කාන්තාවක් හිටියා. දැනට අවුරුදු 25 කට විතර පෙර ඇය තරුණ වයසේ කෙනෙක්. එක අවස්ථාවක පපුවෙ තදබල දැවිල්ලක් ඇති වෙලා රෝහල් ගතකරපු ඇයව පරීක්ෂා කරපු වෛද්‍යවරු, එබඳු රෝගාබාධයක් ඇයට නෑ කියල නිගමනය කළත් ඇය දරුණු වේදනාවෙන් කෑගහන්න වුනා. කියන්න තරම් රෝගී තත්වයක් නෑ කියල වෛද්‍යවරු නිගමනය කරපු නිසා ඇය නැවත ගෙදර ආවත් බොහෝ වේදනාවෙන් කෙඳිරිගගා හිටියෙ. මම ඉහත කියපු ගුප්තමය හැකියාව/ශක්තිය ඒ කාලයේ අත්දැකල තිබුණ නිසා, ඒ පිළිබඳව දැනගත්ත ඇය මාව මුණගැහිල, චූටි මාමෙ මගේ පපුව දනව අනේ මට පිහිටක් වෙන්න කියල කිව්වා. ඇගේ රෝගය ගැන දැනගන්න ගුප්ත සමාධි ක්‍රමවේදයට නැඹුරු වෙච්ච මට මේ වගේ දර්ශනයක් පෙනුනා.

ඇගේ අතක ඇඟිලි දෙකක් මුගටියෙක් දෂ්ඨ කරල තියෙන බවත්, ඒ වෙලාවෙ සර්පයෙක් ගිලල මත් වෙලා හිටපු මුගටියගෙ දත්වල තිබුණ සර්ප විස ඇගේ ශරීරයට ඇතුල් වෙලා ඊට පස්සෙ සිද්ධ වුණ ප්‍රතික්‍රියාවක ප්‍රතිඵලයක් වශයෙන් පපුවෙ දැවිල්ල හටගෙන තියෙන බවත් ඒ දර්ශනයෙන් පෙන්නුම් කළා. ප්‍රතිකාර කරන්න පෙර කාරණය දැනගෙන ඉදීම වැදගත් නිසා, මම ඇයට කතා කරල මුගටියෙක් ඇඟිලි දෂ්ඨ කළාද කියල ඇහුවා. ඒ මීට මාස හයකට විතර පෙර සිද්ධ වෙච්ච දෙයක් විදිහට පෙනුන බව දැනගෙන මේ ගැන ඇහුවම, ඒක ඇත්තක් කියල ඇය කිව්වා. තමන් පෝර උරයක් (හිස් ඉටි කවරයක්) අරගෙන දර හොයන්න ගිය අවස්ථාවක, රබර් වත්තෙ මුගටියෙක් ඉන්නව දැකල ඌ අල්ල ගන්න ළඟට ගියා කියලත්, ඌ නිහඬව හිටපු නිසා කවරයේ කට උගේ ඇඟට දාල ඌ කවරයට දාගෙන පොඩි කුඩුවක් හදල ඇති කරන අදහසින් මුගටියව එළියට ගන්න කවරයට අත දැම්මම ඇඟිලි දෙකක් දෂ්ඨ කරල හුගක් ලේ ගියා කියලත් ඇය කිව්වා.

සත්‍ය හෝඩුවාවක් මේ විදිහට දැනගත්ත නිසා නැවත සමාධි ගතවෙලා ඊට ප්‍රතිකර්ම විමසුවා. මවපු ගුරුවරයා රෝගයට ප්‍රතිකර්ම පෙන්නුවා. **ලෙලි ගහපු පොල් ගෙඩියක් තරම් පුහුල් ගැටයක් අරගෙන පලාගෙන හිරමණයෙන් මදය ගාගෙන, ඒක මිරිකල ඉස්ම පත එකහමාරක් අරගෙන, රන්තැඹිලි ගෙඩියක ඇස්සෙ තියෙන අඩලය ගාගෙන, ඒක පුහුල් ඉස්මෙන් මිරිකගෙන, ඒ ද්‍රාවණයට කුඩා ගෙඩියක් සහිත ගැහැණු පුහුල් මලක (ලෙඩා පිරිමියෙක් නම් ගෙඩිය නැති පිරිමි මලක) රෝන් සුනු දියකරල ටිකක් රත්කරල, ඒ ද්‍රාවණය තුන් කොටසකට බෙදාගෙන, එක කොටසකට මැග්නීසියා පෙත්ත බැගින් දමල උදේ දවල් හවස තුන් වේලක් බොන්න දෙන්න කියල ඒ ප්‍රතිකර්මයෙන් කියවුනා.**

මේ බෙහෙත මමම හදල පළමු කොටස ඇයට බොන්න දුන්නා. ඊට පස්සෙ මම උවමනාවකට කඩපිලට ගිහින් පැයකින් විතර ගෙදර එනකොට, කෙනෙක් උදැල්ලක් අරගෙන උදලු ගගා මඤ්ඤොක්ක දඬු වගයක් හිටවනව දැක්කා. දවස් ගණනක් ඇඳේ දිගාවෙලා නැගිටින්නවත් බැරිව කෙඳිරි ගගා ඇඹරි ඇඹරි හිටපු ඇය තමයි මේ මඤ්ඤොක්ක හිටවන්නෙ. මාව දැකපු ගමන්, චූටි මාමෙ මට දැන් සනීපයි කියල කිව්වා. ඒ වුනාට කමක් නෑ අනික් දෙවේලත් බොන්න කියල මම කිව්වා. ඇයට තිබ්ච්ච ඒ ආබාධය ඒකෙන්ම සුව වුනා. නැවතත් හැදුනෙ නෑ.

එයින් අවුරුදු 10 - 12 කට විතර පස්සෙ තවත් දවසක මාව මුණ ගැහෙන්න ආපු ඇය, චූටි මාමෙ පපුවෙ අමාරුවෙන් පස්සෙ මට මුකුත් අසනීපයක් තිබුනෙ නෑ, ඒත් දැන් මගේ කකුලෙ කැක්කුමක් එනව කියල කිව්වා. මේ කාලෙ වෙනකොට මවපු ගුරුවරයගෙන් යමක් බලන්න අවශ්‍ය වුනේ නෑ. ඒ ගැන විමසල සමාධිගත වෙලා බලනකොට හිතට නැගිල ආවෙ මේක රෝගයක් නෙවෙයි කියල. එහෙනම් මොකක්ද කියල අධිෂ්ඨාන කරල පිළිතුරට යොමුකරල නැවතත් බලනකොට, ඇගේ මියගිය මාමා දරුවෙක් විදිහට බඩට ඇවිත් (ඔක්කන්ති වෙලා) තියෙන බවත්, ජීවත් වෙලා හිටපු කාලයේ ඔහුගෙ පාදයේ තිබුන ආබාධයක ගති ස්වභාවය

මවට ඒ විදිහට දැනෙන බවත් පෙන්නුම් කළා.

නමුත් මේ ගැන ඇයට එකපාරටම කියන්නත් බෑ. පළමු දරුවා ලැබිල මේ වෙන කොට අවුරුදු 10 ක් විතර ගිහින්. විවිධ පවුල් සංවිධාන ක්‍රමත් තියෙන නිසා මේ ගැන එල්ල කරල කියන්නෙ නැතිව මම කිව්වා, ඔය අය පවුල් සංවිධාන ක්‍රම කරගෙන තියෙනවද කියල මම දන්නෙ නෑ, නමුත් මට පේන්නෙ ඔබේ මාමා උප්පත්තියට බඩට ආපු බව කියල. එතකොට ඇය, හැබැයි චූටි මාමෙ ඇත්ත වෙන්නත් පුළුවන්, දැන් සුමාන තුනකට විතර ඉස්සර දවසක් මාමා හීනෙන් ඇවිත්, දුවේ මම උඹ ළඟට එනව කිව්වා කියල මෙහෙම කතාවක් කිව්වා.

මේ කතාව ඇය තමන්ගෙ නෑදෑ හිතවතුන්ටත් කියල තිබුණා. "ඕව කියන්න පුළුවන් කාටද? උඹම හදල ඕව කියනවද කියල කවුද දන්නෙ?" ඒ නෑදෑ හිතවතුන් ඒකට මෙහෙම පිළිතුරු දීල තිබුණා. ඒ ළඟම දවසක ඇය ඒ කතාවත් මට කිව්වා. එතකොට මම ඒකට දෙන්න ඕන පිළිතුර සිහි කරල බැලුවම පෙනුනෙ, උපදින දරුවගෙ කකුලෙ දණහිසින් පහළ වළලුකර දිහාවට යනකල් කළු ළප කැළලක් තියෙන බව. මේ නිසා දරුවා ඉපදුනාට පස්සෙ මේ බව බලාගන්න කියල නෑදෑයින්ට කියන්න කියලත් මම ඇයට දැනුම් දුන්නා. හැමදෙනාම ඒක හොඳ සාක්ෂියක් කියල පිළිඅරගෙන ඒ බලාපොරොත්තුවෙන් දරුවව ලැබුණ දවසෙම නෑදෑ පිරිස ඒ සිද්ධිය දැක බලාගන්න ගියා. සමාධියෙන් දැකපු ඒ කැළල දරුවගෙ කකුලෙ ඒ විදිහටම තිබුණා. **මේවා ගොතල කියන කතා නෙවෙයි. අතිශයෝක්ති පදයක්වත් මෙතැන නෑ. සිද්ධ වුණ සත්‍යම සිද්ධි තමයි මේ කියන්නෙ.**

භෞතිකව සිද්ධ වෙන බොහෝ දේවල් භූත අමනුස්ස විදිහට හිතල මනුස්සයො රැවටුනත්, සියයට සියයක්ම ඒක එහෙම නෙවෙයි. එබඳු අමනුස්ස බලවේග නිසා සිද්ධ වෙන උපද්‍රවත් ඒ අතර තියෙනවා. බුදු පියාණන් වහන්සේ බෝසත් තාපස අවධියේ අරිය පර්යේෂණය කරමින් වනාන්තර ගතව ආරණ්‍ය වාසයේ ඉන්නකොට, නොයෙක් භෞතික සද්ද ඇහෙද්දි බොහෝ අය ඒවාට අමනුස්ස ආදීන්ගේ වැඩ කියල හිතල බය වුනත්, උන්වහන්සේ ඒවා විමර්ශනය කරනකොට මුවෙක් දුවන හඬ, ගහක දිරාගිය අතු කැබැල්ලක් වැටෙන හඬ... ආදිය ඇහුන බවත්, බොහෝ අය මේවාට අමනුස්සයන්ගෙ වැඩ කියල බයවෙන බවත් පෙන්වල තියෙනවා. නමුත් භික්ෂූන් වහන්සේලා 500 ක් ආරණ්‍යයක කමටහන් වඩනකොට, ඇත්ත වශයෙන්ම අමනුස්ස උපද්‍රව ඇවිත් තියෙන බව දැනගෙන, ඒවා සංසිඳුව ගන්න කරණීය මෙත්ත සූත්‍රය දේශනා කරපු බවත්, ඒ කරදර තිබුණ ඒ ආරණ්‍යයටම ගිහින් එකතු වෙලා කමටහනක් වශයෙනුත් සජ්ඣායනා කරමින් භාවිතා කරල ඒ අමනුස්ස උපද්‍රව දුරු කරගෙන ආර්ය මාර්ගය වඩාගෙන අරිහත්වයට පත් වුණ බවත් බුදු දහමේ සඳහන් වෙනවා.

අමනුස්ස දෝසයක් නිසා හටගත්ත එක්තරා ආබාධයක් සුව කරන්න මම අධ්‍යාත්මික ක්‍රමවේදයක් උපයෝගී කරගත්ත සත්‍ය සිද්ධියක් මේ විදිහට සටහන් කරන්නෙ, අධ්‍යාත්මික පරීක්ෂණ කරමින් යමක් දැනගන්න බලාපොරොත්තුවෙන පින්වතුන්ට ගුප්ත ලෝකයේ සත්‍ය සිදුවීම් මේ විදිහට තියෙන බව පෙන්වල දෙන්න.

මේ කියන අමනුස්ස උපද්‍රවයට ගොදුරු වුනේ මගේම මාමා කෙනෙක්. ඒ කාලයේ ඔහුට වයස අවුරුදු 65 ක් විතර ඇති. පාරම්පරිකව පවත්වාගෙන ආපු දුර්ලභ මන්ත්‍රයක් (කෙමක්), ඒ ක්‍රමය කරගෙන ආපු කෙනෙක්ගෙන් ඔහුට ලැබිල තිබුණා. ඒ ඔහු තරුණ කාලයෙදි. ඒ ක්‍රමය, කෙනෙක් මියගියාට පස්සෙ භූමදාන කරන්න මිනී වළ කපනකොට, ඕනෑම ගල් සහිත ඉඩමක කරදරයක් නැතිව වළ කපන්න තැනක් දැනගන්න පුළුවන් ක්‍රමවේදයක්. ඒ තැන පෙන්වල දෙන්නෙ අමනුස්ස බලවේගයකින්. මහසොහොනා කියල හඳුන්වන මේ බලවේගයේ ක්‍රියාත්මක වීමකින් අදාල තැන පෙන්වල දුන්නට පස්සෙ, උදැල්ලෙන් වළේ හතර කොනේ පස් පිඩැලි හතරක් කපල ඉවත් කරල, ඊට පස්සෙ වළ කපන පිරිසට ඒ කටයුත්ත බාර කරනවා. ඒ වළ අඩි හයක් විතර කපනකල් ගල් කැටයක්වත් අහුවෙන්නෙ නෑ. මේ ක්‍රමවේදයෙන් ඔහු වළවල් පන්සිය ගණනක් ඒ වෙන කොටත් කපන්න ලකුණු කරල දීල තිබුණා. ඒ වගේම ඒ සියල්ලම සාර්ථක වෙලත් තිබුණා. මෙබඳු ක්‍රමයකින් තොරව බොහෝ අය වළවල් කපනකොට, භාගයක් යටට කපාගෙන යද්දි ලොකු ගල් අහු වුනොත්, සිරිතක් විදිහට කෙහෙල් කොටයක් දාල වළ වහල වෙනත් තැනක නැවතත් වළ කපන්න පුරුදු වෙලා ඉන්නවා. ඒ ක්‍රමයට වළවල් දෙක තුනක් කපන්න සිද්ධවෙන අවස්ථාත් තියෙනවා.

මේ නිසා ඒ මාමා ළඟ තිබ්බ්ච කෙම් ක්‍රමය ඉතා වැදගත් වුන නිසා, ඒ අවට ගම්මානවල අයත් භූමදානයකදි වළ ලකුණු කරගන්න ඔහුව කැඳවාගෙන යාම සිරිතක් වෙලා තිබුණා. මේ මාමා පදිංචි වෙලා හිටියෙ පූගොඩ දංගල්ල කියන ගම් ප්‍රදේශයේ. මේ කෙම් ක්‍රමයට අනුව පොළොවට දණ ගහල කට ළං කරල පුංචි මන්ත්‍රයක් කියනවා. ඒත් එක්කම ඇඟට කාන්දම් බලයක් වගේ දෙයක් දැනෙන බව ඔහු කියනවා. ඊට පස්සෙ කාත් එක්කවත් කතා නොකර මළගෙදරට ගිහින්, කැත්තක් අරගෙන අඩි හයක් විතර දිග කෝටුවක් කපාගෙන, පෙට්ටියේ දිග පළල මැනගෙන ඒක කැත්තෙන් ලකුණු කරගෙන, උදැල්ලත් අරන් කෝටුව කරතියාගෙන වළ කපන ඉඩමට යනවා. ඔහු එතැනට ගමන් කරන්නෙ නොපෙනෙන බලවේගයක මෙහෙයවීමෙන්. යම් කිසි නියමිත ස්ථානයකට මෙහෙයවෙන ඔහුගෙ කරේ තියෙන කෝටුව (මරු දණ්ඩ) නැගෙනහිරත් බටහිරත් අතරට වැටෙන විදිහට විසි වෙලා බිම වැටෙනවා. ඊට පස්සෙ ඒ වැටුණ තැන හතර කොනේ පස් පිඩැලි හතරක් කපල අනික් පිරිසට වළ කපන්න කියනවා. මෙතැනට එනකල් කාත් එක්කවත් කතා නොකළ යුතුයි.

එක දවසක් මේ විදිහට කෙම් ක්‍රමය ක්‍රියාත්මක කරල, පෙට්ටියේ දිග පළලත් ලකුණු කරගෙන එළියට බහිනකොට කවුරුහරි කෙනෙක්, අප්පුහාමි උදැල්ල ගත්තද කියල ඔහුගෙන් අහල තියෙනවා. ඒ වෙලාවෙ ඔහුට "ඔව්" කියල කියවුනාලු. මේ නිසා කෙම් ක්‍රමය වැරදුනා. ඔහු විසිවෙමින් ගිහින් ගලක් උඩට මරු දණ්ඩ (මිනුම් කෝටුව) දමල විකෘති ස්වභාවයක මානසිකත්වයකින් කුඹුරක නියර උඩින් තියෙන අඩි පාරක් දිගේ එනකොට, තුන් පාරක් විසිවෙලා වෙලටත් වැටිල, නැවතත් නැගිටල ඇවිත් ගෙදර ඉස්තෝප්පුවේ තාප්ප බිත්තියක් උඩ ඉඳගෙන "ඉවරයි තව දින දෙකයි" කියල කියන්න වුනා. කෑමක් බීමක් හෝ නොගෙන වෙනත් කිසි කෙනෙක් එක්ක කතා බහකුත් නැතිව ඔහු මෙහෙම කිය කියා හිටියා. මා ගැනත් හොඳින් දන්න ඒ ගෙදර අය මොහුව අරගෙන මා ළඟට ආවා. ඇවිත් මම ශාන්ති කර්ම කරන ගෙදර ඉස්තෝප්පුවේ පුටුවක ඉන්දෙව්වා. ඔහුට කිසිම නිච්චියක් නෑ. මම අධ්‍යාත්මික ගුප්ත ක්‍රමවේදයකින් ඔහු කරා මනස යොමුකරල මේ ආබාධය මොකක්ද කියල සිහි කළා. ඔහු ළඟ මිනිස් ඇහැට නොපෙනෙන නමුත් අධ්‍යාත්මික ක්‍රමවේදයකින් දකින්න

පුළුවන් විසාල පුද්ගලයෙක් හිටියා. මනසට පෙනෙන විදිහට ළඟ හිටපු මේ පුද්ගලයා බඹ දෙකක් විතර දුරට ගිහින් බලාගෙන හිටියා. මම ඔහුගෙන්, ඔබ කවුද, ඇයි මේ තැනැත්තා ළඟ ඉන්නෙ කියල ඇහුවා. එතකොට ඔහු ටිකක් ළං වෙලා මෙහෙම කිව්වා. "මම තමයි මහ සොහොන් කියන්නෙ. මූ මට මිනියක් දෙන්න පොරොන්දු වෙලා වළක් කපන්න උදව් ගත්තා. ඒ වුනාට දුන්නෙ නෑ. මම මූත් එක්ක හත් දෙනෙක් බිලි ගන්නවා."

මොහු සමග හත්දෙනෙක් බිලි නොගෙන නිදහස් කරන්න ඔබට මළ මිනී කීයක් ඕනද කියල මම ඇහුවම, මම ඉල්ලන තරම් දෙන්න ඔබට පුළුවන්ද කියල ඔහු මගෙන් ඇහුවා. මම කිව්වා ඉල්ලන තරමක් දෙන්නම් කියල. ඔහු මේ විදිහට මගෙන් තුන් වතාවක් අහල පොරොන්දුව ගිවිසවාගෙන අසීමිතව දෙන්න කියල ඉල්ලා හිටියා. දැන් මොහු උත්සාහ කරන්නෙ මාවත් කොටු කරගන්න. අසීමිතව දුන්නොත් ඔබට ගන්න පුළුවන්ද කියල මම ඔහුගෙන් ඇහුවා. දීල බලමු කියල ඔහු තලු මර මර කිව්වා. මොහු සාමාන්‍යයෙන් අද ඉන්න මිනිහෙක් වගේ පස් ගුණයක් තරම් උස මහතයි. මම ඔහුට ඉල්ලන තරම් දෙන්න පොරොන්දු වුනේ, එබඳු ගුප්ත ලෝකයේ උදව්යට අවශ්‍ය දේ මවල දෙන්න පුළුවන් අධ්‍යාත්මික හැකියාවක් ඒ කාලයේ මම ලබල හිටපු නිසා. මේ වගේ අයට බිලී මවන්නෙ සුලැඟිල්ලෙන්. අධිෂ්ඨාන කළාම ඒවා මැවෙන කවි පෙළක් මුවෙන් පිටවෙමින් දකුණු අත අනුකූලව ක්‍රියාත්මක වෙලා හිතු හිතු තරමට මැවිල එනවා. ඒ මැවෙන එක මටත් පේනවා. මනසට පෙනෙන මේ පෙනීම / ඒ අධ්‍යාත්මික බලය මස් ලේ ඇහැටත් සම්බන්ධ වෙලා ඇස් දෙකිනුත් දකින්න පුළුවන් වුණා. ඒවා මවල දුන්නෙ මේ කවි ක්‍රමයෙන්. මේ කවි කල් තියා කටපාඩම් කරගත්ත, එහෙම නැත්නම් ගොතල හදල මතක තියාගත්ත කවි නෙවෙයි. ඒ ඒ ක්ෂණයේ ඒ ඒ පදය මනසින් නැගිල කටින් පිට වෙන්නෙ බෙර පද වයන විදිහට අනුකූල තාලවලට. සමහර වෙලාවට වේගවත් වෙනකොට හේවිසි පද විදිහට අධිවේගවත් වෙනවා. මේ එබඳු කවියක්.

| | |
|---|---|
| යකුනි තොපට අද නරබිලි දෙවනු | ඇත |
| මෙබඳු එකට දහයක් දැන් මැවෙනු | ඇත |
| අඩුව නොමැත හිතු පැතු ලෙස මවල | දෙත |
| රැගෙන බුදිව් අඩු නැති ලෙස රසද | ඇත |

මේ කවිය කියල සුලැඟිල්ල මහපටැඟිල්ලට තද කරල ගහන කොටම මොහොතින් මිනී දහයක් මැවිල විසිවුනා. ඔහු තප්පර දහයක් යන්නත් පෙර ඒ ටික ගිලල දැම්මා.

| | |
|---|---|
| එකට සියක් යළි තොප වෙත මවල | දෙමී |
| රැගෙන බුදිව් රස අඩු නැත එලෙස | දෙමී |
| තොපට රිසිවු රස අඩු නැත සකස | දෙමී |
| රැගෙන තවත් අවැසිද දැන් කියව | මිමී |

මේ එබඳු තවත් කවියක්. කවිය කියල ඉවර වෙනකොට මිනී සියයක් එකවිට මැවිල ඔහු ළඟට වීසි වුනා. ඔහු එක පාරටම දහයක් විතර බදාගෙන කෑදර කමට ගිලින්න හැදුවත් කට ඇතුලෙ හිර වුනා. ඒත් එක්කම තවත් කවි නැගුනා.

| | |
|---|---|
| කෙනෙක් අවැසි දැයි තවමත් නොකිය | ඇතේ |
| එකට දහස් මළ මිනි දැන් මැවිල | එතේ |
| ගනුව එකින් එක අඩු නැත තවද | දෙතේ |
| එකට දහස් දහසින් තව නැගෙනු | ඇතේ |

මේ තමයි ඒ විදිහට නැගිච්ච කවි. මේ කවි කියල සුලැඟිල්ලෙන් කලින් වගේම විදිනකොට මළ මිනී මැවි මැවී ගිහින් ඔහුගෙ හිසට උඩින් ශරීරයත් වහගෙන කන්දක් වගේ ගොඩ ගැහුණා. දැන් මළ මිනී අතරින් අත් දෙක උඩට ඉස්සුවම මැණික් කටුවෙන් උඩට දෙඅත්ල විතරයි පේන්නෙ. ඇති ඇති කියල ඔහු අතින් සඤ්ඤා කරල දඟල දඟල මිනී ගොඩෙන් එළියට ඇවිත්, ඔබ මෙහෙම කෙනෙක් කියල දන්නෙ නැතිවයි අසීමිතව ඉල්ලුවේ, මට සමාවෙන්න කියල බැගෑපත් වුනා. මේ විදිහට අසීමිතව දීගෙන ගියා නම් ඒ මිනීවලින්ම වැහිල ගිහින් හිරවෙලා මරණයට පත්වෙයි කියල ඔහුට බියක් ඇති වුන බව මටත් හැඟී ගියා. මවල තියෙන මළ මිනී ගොඩවල් දිහා කෑදරකමින් බල බලා ඒවා මිටි බැඳගන්න වැල්පොටවල් වගේ දෙයක් නැතිව ඔහු වටපිට බලනකොට මේ කවිය පිටවුනා. (මේ ඒ කවියම නෙවෙයි, එබඳු කවියක්)

| | |
|---|---|
| හිතු පැතු ලෙස දඬු කඹ | මැවීයන් |
| සිතු පැතු ලෙස තෙද බල | සැදීයන් |
| මොහුට රැගන්නට මෙම මිටි | බැඳීයන් |
| අඩුව නැතිව සුව සොම්නස | ලැබීයන් |

මේ කවියත් එක්කම මහා වැල්පොටවල් මැවිල මිනී කඳන් ගොඩ එකතු වෙලා, ගැට ගහගන්න වැල් පොටවල් ඔහුගෙ අතට ලැබිල තිබුණා. ඔහු මිනී කඳ උඩට නැගල තුන් පොළකින් ගැටගහගෙන මම දිහා බලාගෙන ගෞරවයෙන් හිස නැමුවා. මම ඔහුට ආශිර්වාද කවියකින් සුව ආසිරි පැතුවා.


| | |
|---|---|
| හිතුව මොහොතෙ හිතු සුව සෙත ලැබෙනු | ඇත |
| අඩුව නොමැත පිරිසට මුත් දෙවෙනු | ඇත |
| සුවය හිතු පැතු විලසම ලැබෙනු | ඇත |
| පැතුව විලස විය සෙත දැන් යන්න | පුත |

ඔහු ගරු කරල වැඳගෙන, මීට පස්සෙ කාටවත් හිංසා නොකරන බවට පොරොන්දු වෙලා, "මොහු නිදහස් ඔබටත් සුව" කියල හිස නමල, මළ මිනී මිටිය හිස මත තියාගෙන යන්න ගියා.

මෙච්චර වෙලා අවසිහියෙන් හිටපු මාමා "අනේ අම්මේ යාන්තම් ඇති. මහා බරක් මං හිර කරගෙන ඉඳල යන්න ගියා. මං මේ කොහෙද ඉන්නෙ? මේ මගේ බැණ නේද? කොහොමද මං මෙහාට ආවෙ?" මෙහෙම කියල හිනා වෙලා හොඳ සිහියෙන් බැලුවා. නූල් පොටක්වත් වතුර පොදක්වත් සෙත් කරල ඔහුට දෙන්න අවශ්‍ය වුනේ නෑ. මාමා මොකක් කරන්න ගිහින්ද හිර වුනේ කියල මම ඇහුවම, අර වළ කපන්න ගිහින් සිද්ධ වෙච්ච සියල්ලම මට කිව්වා. දැන් ඉතින් ප්‍රශ්නයක් නෑ, මීට පස්සෙ ඒ වැඩේ කරනකොට කතා නොකර හරියට කරන්න කියල මම ඔහුට කිව්වා. "අනේ අනේ මෙයින් ගියා ඇති, මීට පස්සෙ මම නෙවෙයි වළවල් කපන්න යන්නෙ, මම මේවා කාටවත් දෙන්නෙත් නෑ, මගෙන්ම ඉවර වෙච්චාවෙ!" මෙහෙම කියපු ඔහු ඊට පස්සෙ වළවල් ලකුණු කිරීම ජීවිතේටම කළේ නෑ. මේ කිව්වෙ සුරංගනා කතාවක් නෙවෙයි. ගුප්ත වූ සත්‍යම සිදුවීමක්. මෙතැන අතිශයෝක්ති කිසිවක් නෑ.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

**සටහන**
**නීතිඥ චන්දන සිරිවර්ධන**



# වේදනාවෙන් තණ්හාව හටගන්නා හැටි

**පසුගිය කලාපයෙන්...**

වේදනා සහ සම්ඵස්සජා වේදනා අතර වෙනස

තණ්හාව කියන වචනයෙන් අදහස් කරන්නෙ මොකක්ද, ඒක කොයි තරම් දුරට ව්‍යාප්ත වෙච්ච විශේෂ වචනයක්ද කියන කාරණය විමසල බලමු.

මූලික වශයෙන් දහම් අවබෝධයට පෙර තණ්හාව කියන වචනයෙන් අපි දැනගෙන හිටියෙ "ඔහු හරි තණ්හාකාරයෙක්, ඔහු හරිම තණ්හාව වැඩි කෙනෙක්"..... ආදී වශයෙන්. මේ විදිහට තමයි අපි හඳුන්වන්න පුරුදු වෙලා හිටියෙ. ඒකෙන් අපි අදහස් කළේ, ඔහු කිසිම දෙයක් දෙන්න අකමැති ලෝභ සහගත පුද්ගලයෙක් කියල. හැබැයි තණ්හාව කියන වචනය හරියාකාරයෙන් තේරුම් ගත්තම මේ අදහසින් ටිකක් බැහැර වෙන්න සිද්ධ වෙනවා.

**තණ්හාව කියන වචනයේ දහම් නිරුක්ති අර්ථය ගත්තොත්, තන්හි තන්හි හාවීම වශයෙන් විග්‍රහ කරන්න පුළුවන්. ඒ කියන්නෙ තැන් තැන්වල හාවීම.** හාවීම කියල අදහස් කරන්නෙ මොකක්ද? මේ කාරණය තවදුරටත් විස්තර කළොත්, සම්බන්ධ වීමක්, ඇළුම් කිරීමක්, ඇතුලත් වීමක්, ඇඳීමක් ..... ආදී වශයෙන් නොයෙක් අර්ථ ගන්න පුළුවන්. අපි යමෙක් සමග හාවෙනවා කියන්නෙ, ඒ පුද්ගලයා සමග සම්බන්ධ වෙනවා, එහෙම නැත්නම් ඇලෙනවා කියන එක. මේ අදහසින් තමයි හාවීම කියන අදහස අරගෙන තියෙන්නෙ.

එහෙනම්, තන්හි තන්හි හාවීම කියල විස්තර කළොත් ඒක මොකක්ද කියල වටහා ගන්න ඕන. අපි ජීවත්වෙන පරිසරයේ හාවෙන්නෙ මොන මොන දේවල් සමගද? මේ කාරණය පටිච්ච සමුප්පාද විභංගයේදි මේ ආකාරයෙන් විස්තර වෙනවා. "තත්ථ කථමා වේදනා පච්චයා තණ්හාඃ රූප තණ්හා ශබ්ද තණ්හා ගන්ධ තණ්හා රස තණ්හා පොට්ඨබ්බ තණ්හා ධම්ම තණ්හා, අයං වුච්චති වේදනා පච්චයා තණ්හා" වේදනා ප්‍රත්‍යයෙන් තණ්හාව ඇතිවීම විග්‍රහ කරල තියෙන්නෙ මේ ආකාරයට.

එහෙනම් අපි රූප සමග හාවෙනවා, ශබ්ද සමග හාවෙනවා, ගන්ධ සමග හාවෙනවා, රස සමග හාවෙනවා, ස්පර්ශ සමග හාවෙනවා, ධම්ම හෙවත් සිතිවිලි සමග හාවෙනවා.

අපි රූප සමග හාවෙන්නෙ ඇයි? රූපයෙන් ආස්වාදයක් විඳින්න. ගන්ධ සමග හාවෙන්නෙ ගන්ධයෙන් ආස්වාදයක් විඳින්න. මොකද ආස්වාදය දිගටම පවත්වගෙන යෑමේ යම් ඉච්ඡතාවක් හෙවත් කැමැත්තක් අපි තුල තියෙනවා. ආස්වාදය දිගටම පවත්වගෙන යන්න, නැවත නැවත ලබන්න සත්වයෝ හැමෝම කැමතියි. අපේ ඉච්ඡතාවය (කැමැත්ත) ඒකයි. නමුත් යම් කිසි දවසක ආස්වාදයත් අනිච්ඡයි කියල දැනගත්තට පස්සෙ, **ආස්වාදය අපි කැමති විදිහට පවත්වන්න බෑ, අපි කැමති විදිහට නැවත නැවත ලබන්න බෑ, ආස්වාදය අපි කැමති වුනත් නැතත් ගෙවිල යනවා කියල ... මේ ආදී වශයෙන් ආස්වාදයෙන් පසුව එන විවිධ පෙළීම් සහිත ආදීනව දැක්කම, අපිට ආස්වාදය ගැන බැඳීමක්, හාවීමක් සිද්ධ කෙරෙන කැමැත්ත ක්‍රමයෙන් අඩු වෙන්න පටන් ගන්නවා.**

එහෙනම් මේ හාවීමෙන් ගැළවෙන්න අපි මොකක්ද කරන්න ඕන? ආස්වාදයේ ආදීනව නැවත නැවත බැලිය යුතුයි. **ආස්වාද ආස්වාද වශයෙන් නැවත නැවතත් දකිමින් ඒකෙම මුසපත් වෙලා වාසය කරන කෙනෙක්ගෙ තණ්හාව වැඩෙන බවත්, ආස්වාදයන්ගේ ආදීනව නැවත නැවතත් දකිනකොට ඡන්දරාගය නිරෝධ වෙන බවත් දහමේ සඳහන් වෙනවා.** (උදාහරණ - සංයුක්ත නිකාය - 2 - 145 පිටුව - නිධාන සූත්‍රය). එහෙනම් ආස්වාදය පිළිබඳව ආදීනව දකින ක්‍රමය විමසල බලමු.

ආස්වාදය සහ ආදීනවය දෙයාකාරයි. මෙලොව වශයෙන් ආස්වාද සහ ආදීනව තියෙනවා. ඒ වගේම පරලොව වශයෙන් ආස්වාද සහ ආදීනව තියෙනවා. මෙලොව වශයෙන් ආස්වාද, ආදීනව බලනකොට මේ ආකාරයෙන් දකින්න පුළුවන්. ආස්වාදය ගොඩනගන්න නම් අපි යම් වෙහෙස මහන්සියක් වෙන්න ඕන. සමහරවිට දවස් ගණන් මහන්සි වෙලා එක්තරා මොහොතකට විතරයි ආස්වාදය ලැබෙන්නෙ. මාස ගණන් දවස් ගණන් ලොකු මහන්සියක් වෙලා ආස්වාද මාත්‍රයක් විතරක් ලැබෙන්න පුළුවන්. ඊට අමතරව, ලබපු ආස්වාදයෙන් පසුවත් ආස්වාදය විඳීම පිළිබඳව අපි ගෙවිය යුතු යම් කිසි ගෙවීමක් තියෙනවා. මේකට කියනවා, ආස්වාදය සඳහා බරපැනක් ගෙවන්න තියෙනවයි කියල.

යම් කිසි කටයුත්තක් කරගත්තම, මොන ආකාරයෙන් හෝ ඒකට ගෙවීමක් කරන්න සිද්ධ වෙනව කියල අපි දන්නවා. මේ කාරණය උදාහරණයකින් තේරුම් ගනිමු. අපි හිතමු එක්තරා පුරුෂයෙක් තමන්ගෙ කාර්යාලයේ වැඩ කරන, එහෙම නැත්නම් බස් රථයෙදි මුණගැහෙන යම් කිසි කාන්තාවක් සමග සම්බන්ධයක් ගොඩනගා ගන්න උත්සාහ කරනවයි කියල. මේ සම්බන්ධතාවය ගොඩනගා ගන්න උත්සාහ කරන්නෙ මොකටද? ආස්වාදය විඳීමේ බලාපොරොත්තුවෙන්. ඒ සඳහා ඔහුට එක දවසක් මදි වේවි. දවස් කිහිපයක් රස්තියාදු වෙන්න සිද්ධ වේවි. තමන්ගෙ වෙනත් කටයුතු සියල්ලමත් අතපසු කරගෙන, ගෙදරදොරේ වැඩ කටයුතු අතපසු කරගෙන, මුදල් හදල් වියදම් කරගෙන, කාලය වැය කරගෙන ඔහු මේ සඳහා මාසයක්

ගත කළා කියල හිතමු. හැබැයි මේ මාසය තුළ ඔහු ආස්වාදයක් ලැබුවෙ නෑ. ඒ කාලය තුල ඔහු ආස්වාදය ගොඩනගන්න වෙහෙස මහන්සියක් සිද්ධ කළා. සමහර විට මාසයකට පස්සෙ තමන් බලාපොරොත්තු වෙච්ච කාරණය ඔහු ඉෂ්ට කරගෙන, ඒ කාන්තාවත් සමග දවසක් ගත කරල යම් කිසි ආස්වාදයක් ලැබුව කියල හිතමු. මේ ආස්වාදය කොච්චර වෙලාවක් විඳපු දෙයක්ද? සමහර විට විනාඩි කිහිපයක් වෙන්න පුළුවන්. මේ කාලය තුල ලබපු කෙටි ආස්වාදය සඳහා ඔහුගෙ ජීවිතයේ මොන තරම් කැප කිරීම් කරන්න ඔහුට සිද්ධ වුණාද? ආස්වාදයෙන් වැහිල ගිය නිසා ඔහුට නොපෙනුනත්, ඔහු මාස ගණනක් ගත කරල තියෙන්නෙත් නින්දිත චරියාවක්මයි. (කෙලෙස් නින්දේ නිදා ගෙන හිටපු නිසා)

මේ කාලය තුළ ඔහු මහා බයකින් පෙළුනා. රහසේ කටයුතු කරන්න සිද්ධ වුණා. කාටවත් නොපෙනෙන විදිහට බයෙන් බයෙන් එක් එක් අවස්ථාවල ක්‍රියා කරන්න සිද්ධ වුණා. මහා දුක් ගොන්නකට ඔහු මැදිවෙලා හිටියා. අවසානයේදි ඔහු ආස්වාද මාත්‍රයක් වින්ද තමයි. නමුත් ඒ ආස්වාද මාත්‍රය විඳින්න ඔහු මහා දුක් කන්දරාවක් වින්දා. මේ තමයි ආස්වාදය නිසා විඳින්න සිද්ධ වෙන මෙලොව ආදීනවය. ඊට අමතරව මේ ආස්වාදයෙන් පස්සෙ ඔහු මොන තරම් බැඳීමකටද අහුවෙන්නෙ. ඔහුට එයින් පස්සෙ ඒ කාන්තාව නඩත්තු කරන්න සිද්ධ වේවි. නැවත නැවතත් ඇයව හොයාගෙන යනකොට නොයෙකුත් කරදරවලට මුහුණ දෙන්න සිද්ධ වේවි. ඇය වෙනුවෙන් මුදල් වියදම් කරන්න සිද්ධ වේවි. බැනුම් අහන්න සිද්ධ වේවි. මේ ආදී වශයෙන් ආස්වාදය ලැබුවට පස්සෙ ඔහුට මහා බරපැනක් ගෙවන්න සිද්ධ වෙනවා. මේකත් ආස්වාදයේ මෙලොව ආදීනවයක්. සරලව ගත්තොත්, තවත් නොයෙකුත් කම්කටොලු මේ ආස්වාදය වටා ගෙතිල තියෙන්න පුළුවන්. ඒ සියල්ල විස්තර කරන්න අවශ්‍ය නෑ, කෙනෙකුට හිතා ගන්න පුළුවන්.

දැන් මේකෙ පරලොව ආදීනවය මොකක්ද කියල බලමු. මේ ආස්වාදය සඳහා දස අකුසල්වලට අයිති වුන කීයක් නම් ඔහු කරන්න ඇත්ද? බොරු කියන්න ඇති. කේළම් කියන්න ඇති. නොයෙක් හිස් වචන දොඩන්න ඇති. ආස්වාදයට බාධා ආව නම්, සමහර විට ප්‍රාණඝාත, හොරකම් කිරීම්... ආදී දේවල්වලටත් උත්සාහ කරන්න ඇති. මේ විදිහට දස අකුසලයේ යම් කිසි කොටසක් ඔහු විසින් සිද්ධ කරන්න ඇති. ඒ අනුව ඔහුට අකුසල් සිද්ධ වෙනවා. ඊටත් අමතරව ඔහු රාගය වඩනවා, ද්වේශය වඩනවා, මෝහය වඩනවා. මේවා ඔහුට සසර දුකට හේතු වෙනවා. මෙන්න මේ නිසා ඔහුට පරලොව වශයෙන් ආදීනවයකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ලෝකෝත්තර වූ නිවනටත් ඒක බාධාවක් වෙනවා.

මේ ආකාරයට ලෝක ආස්වාදයේ ආදීනව දකින්න පටන් ගත්තම, ආස්වාද සඳහා තන්හි තන්හි භාවීමෙන් වෙන්වීමේ ගුණය ඔහු තුල ජනිත වෙනවා. ක්‍රමානුකූලව ලෝක ආස්වාදයන්ගේ ආදීනව මෙනෙහි කරනකොට භාවීමේ ස්වභාවයෙන් ඉවත් වෙනවා.

එහෙනම් රූප තණ්හා, ශබ්ද තණ්හා, ගන්ධ තණ්හා, රස තණ්හා, ස්පර්ශ හෙවත් පොට්ඨබ්බ තණ්හා, ධම්ම තණ්හා ආදී වශයෙන් භාවීම නිසා සිද්ධවෙන හානිය ගැන හිතුවම, ඒ කියන්නෙ භාවීමෙන් ඇතිවන ආදීනවය ගැන හිතනකොට භාවීමෙන් ඉවත් වෙන්න පුළුවන්.

වේදනා පච්චයා තණ්හා වශයෙන් විස්තර කරනකොට, වේදනාව වශයෙන් අපි සැලකුවේ සම්ඵස්සජා වේදනාව. එහෙනම් අපිට ආස්වාද ලබා දෙන්නෙ මේ සම්ඵස්සජා වේදනා. සම්ඵස්සජා වේදනා කියන්නෙ මොකක්ද කියල දැන හඳුනගෙන, ඒකෙ අනිච්ඡතාවය, දුක්ඛතාවය, අසාරත්වය හෙවත් අනත්ථතාවය තේරුම් ගැනීම තුලින්, තන්හි තන්හි භාවීම හෙවත් තණ්හාව නිරෝධ කරන්න පුළුවන්.

විභංග ප්‍රකරණයේ (1) සච්ච විභංගය මාතෘකාව යටතේ 186 පිටුවේ, තණ්හා කොහි උපදීද කියන කාරණය පිළිබඳව ගැඹුරු විස්තරයක් අඩංගු වෙනවා. තණ්හාව උපදින තැන, තණ්හාව රැඳෙන තැන, තණ්හාව නිරුද්ධ වෙන තැන පිළිබඳව මේ විදිහට සඳහන් වෙනවා. "යං ලෝකේ පිය රූපං සාත රූපං එත්තේ සා තණ්හා උප්පජ්ජ මානා උප්පජ්ජති එත්ත නිවිස මානා නිවිසති"

මේකෙන් අදහස් කරන්නෙ, **ලෝකයේ යම් ප්‍රිය වූ මධුර වූ රූප ඇත්නම් තණ්හාව උපදින්නෙ, තණ්හාව පවතින්නෙ, තණ්හාව නිරුද්ධ වෙන්නෙ** ඒ ස්ථානවල කියල. "කිඤ්ච ලෝකේ පිය රූපං, සාත රූපං:- චක්ඛුං ලෝකේ පිය රූපං, සාත රූපං, සෝතං ලෝකේ පිය රූපං, සාත රූපං..." ආදී වශයෙන් චක්ඛු, සෝත, ඝාන, ජිව්හා, කාය, මනෝ කියන හය විස්තර වෙනවා. ඒ තමයි තණ්හාව උපදින පළවෙනි කොටස. දෙවනි කොටස තමයි රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම කියන හය. තුන්වන කොටස චක්ඛු විඤ්ඤාණ, සෝත විඤ්ඤාණ, ඝාන විඤ්ඤාණ, ජිව්හා විඤ්ඤාණ, කාය විඤ්ඤාණ සහ මනෝ විඤ්ඤාණ කියන හය පොළ.

හතරවන කොටස තමයි චක්ඛු සම්ඵස්සෝ, සෝත සම්ඵස්සෝ, ඝාන සම්ඵස්සෝ, ජිව්හා සම්ඵස්සෝ, කාය සම්ඵස්සෝ සහ මනෝ සම්ඵස්සෝ කියන හය. පස්වන කොටස තමයි චක්ඛු සම්ඵස්සජා වේදනා, සෝත සම්ඵස්සජා වේදනා, ඝාන සම්ඵස්සජා වේදනා, ජිව්හා සම්ඵස්සජා වේදනා, කාය සම්ඵස්සජා වේදනා, මනෝ සම්ඵස්සජා වේදනා.

හයවන කොටස විදිහට රූප සඤ්ඤා, ශබ්ද සඤ්ඤා, ගන්ධ සඤ්ඤා, රස සඤ්ඤා, පොට්ඨබ්බ සඤ්ඤා, ධම්ම සඤ්ඤා කියන මේ හය. හත්වන කොටස තමයි රූප සංචේතනා, ශබ්ද සංචේතනා, ගන්ධ සංචේතනා, රස සංචේතනා, පොට්ඨබ්බ සංචේතනා සහ ධම්ම සංචේතනා ගැනෙනවා.

අටවන කොටස විදිහට ගැනෙන්නෙ රූප තණ්හා, ශබ්ද තණ්හා, ගන්ධ තණ්හා, රස තණ්හා, ස්පර්ශ තණ්හා සහ ධම්ම තණ්හා කියන කොටස් හය. නවවන කොටස තමයි රූප විතක්කෝ, ශබ්ද විතක්කෝ, ගන්ධ විතක්කෝ, රස විතක්කෝ, පොට්ඨබ්බ විතක්කෝ, ධම්ම විතක්කෝ. (විතක්කෝ - රූප අරමුණෙහි පිහිටීම)

දහවන කොටස තමයි රූප විචාරෝ, ශබ්ද විචාරෝ, ගන්ධ විචාරෝ, රස විචාරෝ, පොට්ඨබ්බ විචාරෝ, ධම්ම විචාරෝ කියන මේ හය. (විචාරෝ - රූප අරමුණෙහි පිහිටා එහි හැසිරීම)

මේ ආකාරයට ප්‍රිය මධුර රූප හැට (10x6=60) ආකාරයකින් විස්තර වෙනවා. මේ විස්තර කරපු හැට ආකාර අවස්ථා ප්‍රිය රූප, සාත (සුව අත) රූප ගණයට වැටෙනවා. පිය රූපං, සාත රූපං කියනකොට රූපං කියන පදයේ තේරුම මොකක්ද? ප්‍රිය රූප, සාත රූප කියන කාරණය ප්‍රිය ස්වභාවය, මධුර ස්වභාවය වශයෙනුත් විග්‍රහ වෙනවා. ඒ අතරම **රූප කියන පදයෙන් රූප්පනය වීමක් හෙවත් රුවක් ඔප් නැංවීමක් වශයෙනුත් තේරුම් ගන්න පුළුවන්. ආස්වාදයක් ගොඩනගන්න නම් රුවක් හෙවත් රූපයක් නිර්මාණය විය යුතුයි. ඒක ඇහින් දකින රූපයක්, කනෙන් අහන ශබ්ද රූපයක්, නාසයෙන්**

# සමාධිමය අත් බෙහෙත්...

චරක අභයරතනාලංකාර තෙරුන් වහන්සේ ගිහි වතක සිටියදී, ලෝක සත්වයා කෙරෙහි දයානුකම්පාවෙන් ගිලාන ප්‍රත්‍ය කටයුත්තක් වශයෙන් සලකා, බෙහෙත් සමාධියෙන් මතුකර දුන් තවත් වටිනා අත් බෙහෙත් වර්ග කිහිපයක් පහතින් සටහන් කරනවා.

## දත් කැක්කුමට

1. ඉදුනු එළබටු, දළුක් පලු, තිත්ත අබිං සම ප්‍රමාණයන්ගෙන් අරගෙන පින්න කොළ කිහිපයක ඔතල උණු අළු පල්ලෙ තියල විනාඩි 10-15 ක් විතර තම්බගෙන, ඒවායින් එක පින්න කොළයක් සමග බෙහෙත් අමුද්‍රව්‍ය සියල්ල පිරිසිදු තල තෙලෙන් අඹරගෙන දත මුල තියන්න. දින කිහිපයක් කරන්න.

සැ.යු: ඉදුනු එළබටු කිව්වම දැනට ජාන තාක්ෂණයෙන් හදපු වර්ගයකුත් තියෙනවා. මේ බෙහෙතට ගන්නෙ ඒවා නෙවෙයි, නැට්ටෙ කටු තියෙන ගම්වල ස්වභාවිකව හැදෙන එළබටු.

ඒ වගේම දළුක් කියන්නෙ පතොක් වගේ වියළි කාලගුණයක් තියෙන තැන්වල හැදෙන ගස් වර්ගයක්. ඒ ගහේ ප්‍රධාන කඳින් දෙපැත්තට යන අතුවල ළා කොළ පාට අගිස්ස කොටස් තමයි දළුක් පලු විදිහට ගන්නෙ. ඒ කොටස කෝමාරිකා වගේ මාංසමයයි. දළුක් කිරි අමුවෙන් විස සහිත නිසා ශරීරයේ කිරි නොගෑවෙන්න, විශේෂයෙන් ඇස්වල නොගෑවෙන්න දළුක් පලු ලබාගන්න සැලකිලිමත් වෙන්න. නමුත් උණු අළු පල්ලෙ තියල තම්බ ගත්තම විස මැරෙනවා.

2. තෝර ඇට (සාමාන්‍යයෙන් මැල්ලුම් කෑමට ගන්නා තෝර), මූණමල් පොතු, කරුංකා, අරළු යන මේවා කුඩු කරගෙන සීනක්කාරං (ලුණු වර්ගයක්) ටිකක් සමග අනාගෙන පෙනේරයකින් හලාගෙන තැන්පත් කරල තියාගෙන දත් මදින්න.

**සටහන**

**නීතිඥ චන්දන සිරිවර්ධන**

---

**ගන්න ගන්ධ රූපයක්, දිවෙන් ගන්න රස රූපයක්, කයෙන් ගන්න ස්පර්ශ රූපයක් හෝ මනෙන් ගන්න ධර්ම රූපයක් හෝ වෙන්න පුළුවන්.**

ආස්වාදයක් ගොඩනගන්න නම් රූප මාත්‍ර රාශියක් එකතු වෙලා හඳුන ගන්න පුළුවන් රූපයක් ගොඩනැගිය යුතුයි. ඒ වගේ රූපයකට විතරයි භාවීමක් හෙවත් තණ්හා වීමක් සිද්ධ වෙන්නෙ. ශබ්දයත් එහෙමයි. ශබ්ද මාත්‍රවලට ආස්වාද ගොඩනගන්න බෑ. ශබ්ද මාත්‍ර රාශියක් එකතු වෙලා ශබ්ද රූපයක් ගොඩනැගීමෙන් විතරයි ආස්වාද ගොඩනගන්න පුළුවන් වෙන්නෙ. උදාහරණයක් විදිහට ගීතයක වචන ටික වෙන වෙනම ගත්තොත් ඒකෙන් ආස්වාදයක් ගොඩනැගෙන්නෙ නෑ. ඒ වචන එක්තරා ක්‍රමයකට ගළපල ශබ්ද රූපයක් හෙවත් ගීතයක් ගොඩනැගුවොත් විතරයි ඒකෙන් ආස්වාදයක් ලබා ගන්න පුළුවන් වෙන්නෙ.

මේ විදිහට හැම ආකාරයකින්ම පෙන්වපු ප්‍රිය රූප, සාත රූප වෙන වෙනම තේරුම් අරගෙන ඒවාට රූපය කියන නම යෙදුවෙ ඇයි කියලත් වටහාගත යුතුයි. මේ හැම ආකාරයකින්ම පෙන්වපු ප්‍රිය මධුර රූපවලින් විද්‍යමාන වෙන්නෙ ස්කන්ධ පංචකය (පංචස්කන්ධය). ඒ කොහොමද කියල දැන් හොයල බලමු.

චක්ඛු, සෝත, ඝාන, ජිව්හා, කාය, මන සහ රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධම්ම කියන කොටස් දොළහ රූපස්කන්ධය නිරූපණය කරනවා. චක්ඛු විඤ්ඤාණ, සෝත විඤ්ඤාණ, ඝාන විඤ්ඤාණ, ජිව්හා විඤ්ඤාණ, කාය විඤ්ඤාණ, මනෝ විඤ්ඤාණ කියන කොටස් හයෙන් විඤ්ඤාණස්කන්ධය නිරූපණය වෙනවා.

චක්ඛු සම්ඵස්සජා වේදනා, සෝත සම්ඵස්සජා වේදනා, ඝාන සම්ඵස්සජා වේදනා, ජිව්හා සම්ඵස්සජා වේදනා, කාය සම්ඵස්සජා වේදනා, මනෝ සම්ඵස්සජා වේදනා කියන මේ හය වේදනා ස්කන්ධය නිරූපණය කරනවා.

රූප සඤ්ඤා, ශබ්ද සඤ්ඤා, ගන්ධ සඤ්ඤා, රස සඤ්ඤා, ස්පර්ශ සඤ්ඤා, ධර්ම සඤ්ඤා කියන සඤ්ඤා හයෙන් සඤ්ඤා ස්කන්ධය නිරූපණය කරනවා.

රූප සංචේතනා, ශබ්ද සංචේතනා, ගන්ධ සංචේතනා, රස සංචේතනා, පොට්ඨබ්බ සංචේතනා, ධම්ම සංචේතනා කියන හයත්, රූප තණ්හා, ශබ්ද තණ්හා.... ආදී හයත්, රූප විතක්කෝ, ශබ්ද විතක්කෝ.... ආදී හයත්, රූප විචාරෝ, ශබ්ද විචාරෝ.... ආදී හයත් වශයෙන් කොටස් 24 ක් සංඛාරස්කන්ධය නිරූපණය කරනවා.

කල්පනාකාරීව සූක්ෂමව බලන කොට ප්‍රිය රූප, සාත රූප වශයෙන් විස්තර කරපු අංග 60 නිරූපණය කරන්නෙ ස්කන්ධ පංචකය හෙවත් පංචස්කන්ධය. එහෙනම් තණ්හාව උපදින්නෙ රූපස්කන්ධය, වේදනා ස්කන්ධය, සඤ්ඤා ස්කන්ධය, සංඛාර ස්කන්ධය සහ විඤ්ඤාණ ස්කන්ධය මත බව පැහැදිලියි. තණ්හා උපාදාන සමග ඒ පහ එකතු වුනාම පංච උපාදානස්කන්ධය වෙනවා.

මේ විදිහට ස්කන්ධ පංචකයේ භාවීමෙන් තමයි අපි ආස්වාද විඳින්නෙ. ආස්වාදත් අනිච්ච, දුක්ඛ, අනත්ත වශයෙන් දැකීමෙන් විතරයි ස්කන්ධ පංචකයට භාවීමෙන් හෙවත් තණ්හා වීමෙන් වළකින්න පුළුවන් වෙන්නෙ.

මේ විදිහට ආස්වාද සඳහා ස්කන්ධ පංචකයට භාවීම තුළින් ආස්වාද විඳීමෙන්, ඒ ස්කන්ධ පංචකය පිළිබඳව ඡන්දරාගයක් උපදිනවා. ඒ පංචස්කන්ධය වටිනා දෙයක් වශයෙන් දකිනවා. ඒක නැවත නැවතත් බලාපොරොත්තු වෙනවා. මේ නැවත නැවතත් බලාපොරොත්තුවීම පංචස්කන්ධය උපාදාන කිරීම හෙවත් පංච උපාදානස්කන්ධය වශයෙන් හඳුන්වනවා.

ආස්වාදයේ අනිච්ඡතාවයත්, ඒ නිසා වන දුක්ඛතාවයත් හොඳින් හඳුන ගත්ත රහතන් වහන්සේ පංචස්කන්ධය ආශ්‍රිතව ලබන ආස්වාදවල දුක් ආදීනව හොඳින් හඳුන ගන්නවා. ඒ නිසා උන්වහන්සේ පංචස්කන්ධය පිළිබඳව ඡන්දරාගය ගොඩනගා ගන්නෙ නෑ. ඒ කියන්නෙ පංච උපාදානස්කන්ධය උන්වහන්සේ ළඟ නෑ. තියෙන්නෙ පංචස්කන්ධය විතරයි. මීළඟ කලාපයෙන් තණ්හා ප්‍රත්‍යයෙන් උපාදාන ඇති වෙන හැටි සාකච්ඡා කරමු.

**නුගේගොඩ වින්ලංකා රෝහලේ සභාපති**

**වෛද්‍ය ආර්.පී. වීරසිංහ**

MBBS/DFM/MCGP/MPFAM

# හෙළ බොදු පියුම දහම් සඟරාවේ දහවන කලාපයේ දෙවන සංස්කරණය සඳහා ශ්‍රමය හා මූල්‍යමය දායකත්වය සැපයූ පිංවතුන්

**ශ්‍රම දායකත්වය**

■ පූජ්‍ය කිවුල්දෙණියේ විජිතනන්ද හිමි ■ පූජ්‍ය වළල්ලාවිට මුදිතවංශ හිමි ■ පූජ්‍ය නුවරගල බුද්ධසිරි හිමි ■ ධම්මික සේනාධීර මහතා - හසරු ප්‍රින්ටර්ස් - මාලබේ ■ චන්දන සිරිවර්ධන මහතා - අලපලාදෙනිය ■ චතුර හිඳුරංගලගේ මහතා - නුගේගොඩ ■ අමිත් සමරනායක මහතා - බෙල්ලන්තර ■ සඳරුවන් පෙරේරා මහතා - මොරටුව ■ ෆික්රි ඉස්මයිල් මහතා - ගොතටුව ■ නිශංකා ලක්මාලි මෙනවිය - වැලිගම ■ සුජීවනී ජයවර්ධන මෙනවිය - පාදුක්ක ■ සංඛ කුමාරසිංහ මහතා සහ ක්‍රිෂාණි මධුශංකා මහත්මිය - බත්තරමුල්ල ■ ඉමාෂි මුද්‍රණාලයේ අධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලය ■ නන් අයුරින් දායක වූ පින්වතුන්

**මූල්‍යමය දායකත්වය**

■ සනත් දයාප්‍රේම මහතා, රේණුකා ජයවර්ධන මහත්මිය, අනුක් දයාප්‍රේම පුතා, සෙලෝමි දයාප්‍රේම දුව, මහේන්ද්‍ර ජයවර්ධන මහතා, සමන්තා සේනානායක මහත්මිය සහ යතික ජයවර්ධන පුතා - ඇමරිකාව - රු. 35,000/- ■ තුසිත නාකන්දල මහතා, සරූපා නාකන්දල මහත්මිය, දෙවින්යා දුව - ගල්කිස්ස - රු. 30,000/- ■ චතුර හිඳුරංගලගේ මහතා, නදීරා අරම්පොල මහත්මිය, තනුරි හිඳුරංගලගේ සහ සනුරි හිඳුරංගලගේ යන දියණියන් - නුගේගොඩ - රු. 20,000/- ■ උදිත බණ්ඩාර මහතා සහ නදීකා පියදාස මහත්මිය - පාදුක්ක - රු. 20,000/- ■ සමන්ත දියෝගබඳු මහතා, ගයනී ජයවර්ධන මහත්මිය, නිම්හාන් දියෝගබඳු පුතා, ඩිලාරා දියෝගබඳු දුව - ඩුබායි, ඒ. ඩී. කේ. පියසීලි ජයවර්ධන මහත්මිය, ඉනෝකා ජයවර්ධන මහත්මිය, අකීෂා සමරවීර දුව, අශෝක ජයවර්ධන මහතා සහ චමිලා වික්‍රමආරච්චි මහත්මිය, ඒ. ඩී රූපා පෙරේරා මෙනවිය, ජී. ජයවර්ධන මහතා - නුගේගොඩ, ජී. ඩී. බෙනට් මහතා, ජී. එච්. ටී. චන්ද්‍රාවතී මහත්මිය - කළුතර, දයානන්ද වික්‍රමආරච්චි මහතා, පද්මා විජේරත්න මහත්මිය - අත්තනගල්ල, පීරිස් අප්පුහාමි මහතා - රුවන්වැල්ල, මහසෙන් විජේසුන්දර මහතා, දුෂ්‍යන්ති අර්තනායක මහත්මිය, රෙසුරි විජේසුන්දර දුව, භාවික විජේසුන්දර පුතා - කොළඹ 4, දනිතා ඩයස් මහත්මිය, කිත්සිරි ජයකොඩි මහතා, රොමාල් ජයකොඩි පුතා, සෙෂිනි ජයකොඩි දුව - රාජගිරිය - රු. 15,000/- ■ මිහිරි කරුණාතිලක මහත්මිය, රසිකා ගම්ලත් මහත්මිය, ගයනී පතිරාජ මහත්මිය, තුෂාරි ලොකුගේ මහත්මිය, ගිෂාන්ති වික්‍රමසිංහ මහත්මිය - ඕස්ට්‍රේලියාව - රු. 14,812/- ■ නිලක්ෂි වීරකෝන් මහත්මිය - මාලබේ - රු. 10,000/- ■ සිතිර නරසිංහ මහතා, අචනා ගුණරත්න මහත්මිය, තරුෂ නරසිංහ පුතා, මිහෙලි නරසිංහ සහ සෙනුලි නරසිංහ යන දියණියන් - පන්නිපිටිය - රු. 10,000/- ■ සමන් සිල්වා මහතා - කළුතර - රු. 10,000/- ■ තිළිණ විජේරත්න මහතා සහ පවිත්‍රා දැදිගම මහත්මිය - ඇමරිකාව - රු. 9,020/- ■ නම සඳහන් නොකළ පින්වතුන් පිරිසක් - ඇමරිකාව - රු. 9,020/- ■ ගයාන් දිසානායක මහතා - ඕස්ට්‍රේලියාව - රු. 6,440/- ■ එරන්ද මලිගස්පේ මහතා, වෛද්‍ය නිලූපා ගස්පේ මහත්මිය, කිවේන් මලිගස්පේ පුතා, කිවිණි සෙත්මිණි මලිගස්පේ දුව - ඇමරිකාව - රු. 5,000/- ■ ගයාන් පුෂ්පික ඉන්ද්‍රජිත් ලොකුමාන්න මහතා, හිරෝෂානි ලොකුමාන්න මහත්මිය, සෙනුත් ලොකුමාන්න පුතා, කෙනුලි ලොකුමාන්න දුව - ගල්කිස්ස - රු. 5,000/- ■ සොනාලි සමරදිවාකර මෙනවිය - මහරගම - රු. 5,000/- ■ සුරංග කස්තුරිආරච්චි මහතා, මයුරි මධුෂිකා නානායක්කාර මහත්මිය, සනුජනා කස්තුරිආරච්චි සහ මිහෙලි මෙත්රදී කස්තුරිආරච්චි යන දියණියන් - කිරිබත්ගොඩ - රු. 5,000/- ■ අරුණ ඉවන හැන්නදිගේ මහතා සහ ලලනි හේරත් මහත්මිය - ඕස්ට්‍රේලියාව - රු. 3,220/- ■ මහරගම සදහම් වැඩසටහනට සහභාගිවන පින්වතුන් - රු. 3,000/- ■ ජනක හපුආරච්චි මහතා ඇතුළු පවුලේ සැම - ගිනිගත්හේන - රු. 3,000/- ■ කේ. එම්. සමන්ත ප්‍රදීප් මහතා - කඹුරුගමුව, මාතර - රු. 3,000/- ■ නිශාන්ති ද සිල්වා මහත්මිය - මොරටුව - රු. 3,000/- ■ ගුණපාල ඉද්දගොඩ මහතා - විජේරාම - රු. 3,000/- ■ මනෝජ් ජයසූරිය මහතා ඇතුළු පවුලේ සැම - ඇමරිකාව - රු. 3,000/- ■ රංජිත් වික්‍රමසිංහ මහතා, උවිඳි වික්‍රමසිංහ මෙනෙවිය, තනුල වික්‍රමසිංහ මහතා, නදිනි වික්‍රමසිංහ මෙනෙවිය, කුමුදුනී වික්‍රමසිංහ මහත්මිය - කඩිගමුව, කුමාරි ගොඩවිට මහත්මිය - කුරුණෑගල - රු. 3,000/- ■ නිලන්ති දෙල්පවිත්‍ර මහත්මිය - හොරණ - රු.3000/- ■ කුරුණෑගල විසූ පරලෝ සැපත් නිමල් මුණසිංහ මහතාට පිං පිණිස - රු. 3,000/- ■ විමුක්ති සෙනෙවිරත්න මහතා සහ ජයමිණි ජයවර්ධන මහත්මිය - ඇමරිකාව - රු. 2,710/- ■ ටී. ටී. පී. සිල්වා මහත්මිය - නාගොඩ, කළුතර - රු. 2,500/- ■ ඩී.ඩී. විතාරණගේ මහතා ඇතුළු පවුලේ සැම - නුගේගොඩ - රු. 2,500/- ■ ඉසුරු ගාල්ලගේ මහතා සහ මේනකා ශාන්තිනී මහත්මිය - කඩවත - රු. 2,500/- ■ සුදන්ත සූරියබණ්ඩාර මහතා සහ ඉරේෂා සූරියබණ්ඩාර මහත්මිය - ඕස්ට්‍රේලියාව - රු. 2,000/- ■ ජයනාත් සුබසිංහ මහතා, දුලීකා වත්සලා ගුණවර්ධන මහත්මිය -හෝමාගම - රු. 2,000/- ■ ඉසුරු සේනාරත්න මහතා - පිටකෝට්ටේ, Miss Lei Shwe Yee – Myanmar - Rs. 2,000/- ■ යෙනිකා කුමාරි මහත්මිය - එක්සත් රාජධානිය - රු 2,000/- ■ සුනීතා බුලත්සිංහල මහත්මිය - ඕමානය - රු. 2,000/- ■ හර්ෂ අමරසේකර මහතා සහ උදුම්බරා රත්නායක මහත්මිය ඇතුළු පවුලේ සැම - ඇමරිකාව - රු. 1800/- ■ අයේෂ් ගුණවර්ධන මහතා සහ නිරාෂා පෙරේරා මහත්මිය - ඇමරිකාව - රු. 1800/- ■ කසුන් ජයකොඩි මහතා - දොඩංගොඩ - රු.1,500/- ■ අයිරාංගනී තිලකරත්න මහත්මිය - නාවල - රු. 1,500/- ■ ඩබ්. එම්. විජේසූරිය බණ්ඩාර මහතා සහ දිලීනා දීපිකා කුමාරි බණ්ඩාර මහත්මිය ඇතුළු පවුලේ සැම - හසලක - රු. 1,200/- ■ එස්. ප්‍රසන්න ප්‍රියදර්ශන සිල්වා මහතා සහ මධුෂිකා ලක්මුතු පියදිගම මහත්මිය - ගල්කිස්ස - රු. 1,200/- ■ තරුක්ෂි විජේසිංහ මෙනවිය ඇතුළු පවුලේ සැම - බත්තරමුල්ල - රු. 1,200/ ■ කෞෂල්‍යා ප්‍රේමචන්ද්‍ර මහත්මිය - මහනුවර - රු. 1,000/- ■ අමිල සල්ගාදු මහතා, ජයන්ත සල්ගාදු මහතා සහ කාන්ති ඒකනායක මහත්මිය - බෝමිරිය - රු. 1,000/- ■ උපුල් ජයරත්න මහතා සහ ගිහානී ජයරත්න මහත්මිය - ඕස්ට්‍රේලියාව - රු. 1,000/- ■ ශ්‍යාමල් බණ්ඩාර මහතා - කුරුණෑගල - රු. 1,000/- ■ සී. එම්. පී. සී. ලක්රුවන් මහතා - කළුතර - රු. 1,000/- ■ මෝක්ෂර තිලකසිරි පුතා - බැලුම්මහර - රු. 1,000/- ■ සමෘද්ධි තිලකසිරි පුතා - බැලුම්මහර- රු. 1,000 ■ පද්මිණී සේනානායක මහත්මිය - කළගෙඩිහේන - රු. 1,000/- ■ දර්ශිකා විජේරත්න මහත්මිය - තලවතුගොඩ - රු. 1,000/- ■ ඩබ්. චන්ද්‍රරත්න මහතා ඇතුළු පවුලේ සැම - පාදුක්ක - රු. 1,000/- ■ වසන්ත කුමාර ජයසේකර මහතා ඇතුළු පවුලේ සැම - නාරාහේන්පිට - රු. 1,000/- ■ නිලන්ති දාබරේ මහත්මිය - පිටකෝට්ටේ - රු. 1,000/- ■ ඒ. දිලාන් නුවන් පුතා - ස්කොට්ලන්තය - රු. 1,000/- ■ එස්.ඩී. සමීර සුමිත් කුමාර මහතා සහ කේ.ඒ. දිලීනා සඳරුවනි මහත්මිය ඇතුළු පවුලේ සැම - කඹුරුපිටිය - රු. 1,000/- ■ සක්විති ජයවර්ධන මහතා - කොච්චිකඩේ - රු. 1,000/- ■ අනුරා ජයකොඩි මහත්මිය - නිට්ටඹුව - රු. 1,000/- ■ බී. ඒ. චම්පිකා වීරසේන මහත්මිය, ඩී. ඒ. ලක්සමන් අතුකෝරාළ මහතා - ගෝනගල්දෙනිය - රු. 1,000/- ■ නම සඳහන් නොකළ පින්වතෙක් - හෝමගම - රු. 1,000/- ■ උපුල් විජේනායක මහතා ඇතුළු පවුලේ සැම - මාවනැල්ල, රමේෂ් චතුරංග මහතා - ජා ඇල, සුරංගි පූර්ණිමා මෙනවිය - නිමල මරියා බාලිකා විදුහල ජා ඇල, බී. එම්. ඒ. ජේ. ලංකාපුර මහතා - කඩවත - රු. 2,000/- ■ එකතු වූ සියලු මුදල් පරිත්‍යාග - රු.289,922/- ■ පළමු පිටපත් 7,000 සඳහා මුද්‍රණ වියදම රු. 205,800/- ■ අනෙකුත් වියදම් - රු. 6,492/- ■ සම්පූර්ණ වියදම - රු. 212,292/- ■ එක් පිටපතක නිෂ්පාදන වියදම - රු . 30.32/- ■ ඉතිරි සියලු ආධාර මුදල් නැවත මුද්‍රණ කටයුතු ඇතුළු දහම් කටයුතු සඳහාම යොදවනු ලැබේ.

**ඉහත නම් සඳහන් පිංවත් පිරිස ඇතුළු ආධාර උපකාර කළ සියලු දෙනා සිදු කරගත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද හේතු කොටගෙන, අනන්ත සසරේ පටන් මේ දක්වා තම තමන් අතින් අවැඩ, අසාධාරණ, වැරදි, ප්‍රමාද දෝසවලට ලක් වූ සියලු දෙනාට මෙන්ම උදව් උපකාර කළ සැමටත්, මියගිය සතර වරිගයක ඥාති මිත්‍රාදීන්ටත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද විහිදී පැතිරී පිහිටා සුගතිගාමීව සම්දිටු ගුණ පහළ කරගෙන තම තමන්ගේ පැතුම් පරිදි නිර්වාණාවබෝධයටද හේතු වාසනා වේවා! එම ආධාර උපකාර කළ පිංවත් පිරිස් ඇතුළු සිය පවුල්වල සැමටත්, නිදුක් නිරෝගී සුවය ලැබී, කරන කියන යහපත් රැකී රක්ෂා ව්‍යාපාර ආදියෙන් සියලු ජයග්‍රහණයන් අත් වේවා. දූ දරුවන්ගේ අධ්‍යාපන ආදී කටයුතුවලින් විශිෂ්ඨ ජයග්‍රහණ අත් වී සුචරිත පිරිසක් වී සියලු අභිවෘද්ධිය උදා වේවා!**

# පින්වත් ඔබ වෙනුවෙන් එළි දැක්වූ දහම් ගබඩාවන්...

**www.waharaka.com/magazines/** **webmaster@helabodhupiyuma.net**

**071 3046895 / 0775003411/ 036 2265077 / 076 8092008**

**සැඟවුණු බොදු මග යළි විවර කරමින් වහරක අරිය චින්තාශ්‍රම බෞද්ධ විහාරස්ථානයේ සදහම් වැඩසටහන් පැවැත්වෙන කාල හෝරාවන්:**

සෑම පුන් පොහෝ දිනකම සහ සෑම අමාවක පොහොය දිනකම පෙ.ව. 8.00 සිට ප.ව. 5.00 දක්වා - පෙහෙවස් සමාදනය, දහම් සාකච්ඡා සහ විශේෂ පුණ්‍යානුමෝදනාව. සෑම මසකම 1 වන සහ 3 වන සෙනසුරාද පෙ.ව. 8.00 සිට ප.ව. 4.00 දක්වා - ආශිර්වාද පූජාව සහ ධර්ම සාකච්ඡාව. 2 වන, 4 වන සහ 5 වන සෙනසුරාද පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා - භාවනා වැඩසටහන

**ගමන් මාර්ගය: නිට්ටඹුව - රුවන්වැල්ල ප්‍රධාන මාර්ගයේ ගෝණගල්දෙනිය හන්දියේ සිට වහරක අතුරු මාර්ගයේ මීටර 350 ක් පමණ දුරින් දකුණුපස.**

# සියවස් ගණනාවකට පෙර සැඟව ගිය නිමල බොදු මග යළි පුබුදුවමින්,

හෙළ බොදු පියුම දහම් කරුණු ඔබ වෙත රැගෙන එන්නේ, බුදු පියාණන් වහන්සේ අනුදැන වදාළ, අග්ගඤ්ඤ සූත්‍රය, නිරුක්තිපථ සූත්‍රය සහ අරණවිභංග සූත්‍රය යන සූත්‍රාන්තයන්ට අනුව, දහම් පදවල සැඟවුණු දහම් අරුත් මතු කරන පද නිරුක්ති සහ අතීතය, වර්තමානය, අනාගතය හඟවන තුන්කල් නිරුක්ති සහිත ව්‍යවහාර ශබ්ද නිරුක්ති ක්‍රමවේදය අනුව මිස, උන්වහන්සේ අනුමත නොකළ ලිඛිත භාෂා රීති සහිත බමුණන්ගේ ත්‍රිවේද නිරුක්ති මත නොවන බව සළකන්න.

# හෙළ බොදු පියුම දහම් සඟරාව දැනට ලබා ගත හැකි ස්ථාන

■ චන්දුල වෙළඳ විමන, අංක 104, හයිලෙවල් පාර, මහරගම 077 5003540 ■ ඩී. සී. ආර්. ඇක්සස් මුද්‍රණාලය - අංක 33, තලවතුගොඩ පාර, පිටකෝට්ටේ - 0777794676 ■ හසරු ප්‍රින්ටර්ස් - මාලබේ. (071 4220558) ■ දේශීය ස්ටෝර්ස්, ලංකාදීප අලෙවි නියෝජිත, හපුතලේ පාර, වැල්ලවාය - 0775532694, 0718375871 ■ පිනැකල් නෙට් - හයිලෙවල් පාර, ගොඩගම - 011 2895132 ■ තුෂාරා ෆැෂන් - හයිලෙවල් පාර, හෝමාගම - 011 2857572 ■ තුෂාරි සාරි සෙන්ටර් - කොළඹ පාර, පාදුක්ක - 076 6114237 ■ සෙනාරෝ සෙන්ටර් - අංක 35, රාජගිරිය පාර, රාජගිරිය - 077 6485577 ■ කුමාරි අයන් වර්ක්ස් - 209 ඒ, ගලහිටියාව, ගනේමුල්ල - 076 9604682, 0786949860 ■ පෝලර් රීජන්ස් 402 සී, ගාලු පාර, පානදුර - 038 2235369 ■ සුධීර කොමිනිකේෂන්, පිටිගල පාර, පැලවත්ත - 071 2103177, 075 2679202 ■ සහන ෆාමසි - මුණගම, හොරණ - 071 2608776 ■ ස්ටුඩියෝ සෙවන් සීරෝ, තවලම හන්දිය, තවලම (ඉන්ධන පිරවුම් හල අසළ) 071 5827923 ■ ගේට්වේ අධ්‍යාපන ආයතනය - කලේගාන, ගාල්ල - 091 2242610 ■ නිව් මෙට්‍රෝ කම්පියුටර්ස් - කාලිදාස මාවත, මාතර - 041 2225118 ■ හෙළ බොදු සිසිල සෙනසුන - මුරුතමුරේ, හක්මන - 041 3021878 ■ මෝලෙ කඩේ - මුදුන, වලස්මුල්ල - 071 1662643 ■ රාජපක්ෂ වෙළඳසැල - බැද්දෙගෙදර, මිද්දෙණිය පාර, වීරකැටිය - 071 2136329 ■ සංජීව සුපර් ග්‍රොසරි - ප්‍රධාන වීදිය, බඩල්කුඹුර 075 5863883, 055 2250051 ■ ශ්‍රීපති පික්චර් පැලස්, අවිස්සාවේල්ල පාර, නවගමුව - 0717360875, 0718375871 ■ ඒකනායක මන්තින්දරාමය - ඉහළගම, මහළුඩගම, ගම්පොළ, නුවර - 077 541 64 61 / 081 020 57572 ■ අරිය චින්තාශ්‍රම හෙළ බොදු සෙනසුන, බාලදක්ෂ මාවත, ගල්කඩවල, අනුරාධපුර - 076 6442125 ■ අරි සිතුම් අරණ දහම් මැදුර, දේවගිරිපුර, ගල්ගමුව - 071 1211876 ■ ප්‍රජාපතී ගෝතමී ආරාමය, පහලගම, සියඹලන්ගමුව, මාස්පොත - 037 4902817 ■ පිවිතුරු අරණ සෙනසුන - කට්ටකඩුව, ආඬියාගල, දඹුල්ල - 025 5789988 ■ සීගිරි පොත්හළ, පොළ හන්දිය, මහව - 077 6243804 ■ රුහුණු ෆුඩ් ලයින්, අංක 05, හලාවත පාර, කොච්චිකඩේ - 031 2277726 ■ චන්දන පූජා භාණ්ඩ - 100, බදුල්ල පාර, හාලිඇල - 055 2294999 ■ ළහිරු පූජා භාණ්ඩ, කොළඹ පාර, මදුරන්කුලිය, 076-7768053 / 071-8375871 ■ සඳමිණි පූජා භාණ්ඩ, කුලියාපිටිය පාර, දුම්මලසූරිය - 077 4430223

**තැපෑලෙන් ගෙන්වා ගැනීම සඳහා විමසන්න ඩී. සී. ආර්. ඇක්සස් මුද්‍රණාලය අංක 33, තලවතුගොඩ පාර, පිටකෝට්ටේ 0777794676**

***ඉහත ආයතන හිමි පින්වතුන් මෙම සද් කාර්ය ඉටු කරනු ලබන්නේ කිසිදු වෙළඳ ලාභයකින් තොරව සාසනික කටයුත්තක් වශයෙන් පමණි.***




# තණ්හාය ජායතී සෝකෝ

රත්වූ ලොවෙන් ගිනි දැල් විහිදන මැද්දේ
මත්වූ සතුන් වස්තුව රකිනට යුද්දේ
අත්වූ දොසින් පසු හිල් වූ නැව පැද්දේ
පත්වූ ලොබින් භව සයුරටමය ඇද්දේ

කල දුටු කලට වළ ඉහගෙන කන ඇත්තු
බල බල තවත් වස්තුව ගොඩ ගහ ගත්තු
එල දැන නොගෙන පව් කළ මව් පිය පුත්තු
මළ ගිය දාට උපදිනවා ලෙස සත්තු

තම වස්තුවම වැඩි කර ලබනට වාසි
ඇම දී අනුන්හට ඉන් ලැබ ගෙන කාසි
කිම නෙක පිරිවරා ගෙන හිටියද දාසි
නොම දී සෙතක් දුගතියටම වෙති වීසි

පෙර කළ කම්වලින් පව් විඳවන නුඹද
කර ගෙන වස්තු මම මගෙ කියමින නිබඳ
දිර කඩ වන කයෙන් තව හිටියද සුබද
ජර මර නැති ලොවක් හමු වේවිද සබඳ

මේ කය දමා යන විට පර ලොව දිනෙක
දාහය සිතට එන වදනින් කිව නොහැක
ලෝකය බදා ගෙන හිටියත් කොයි තැනෙක
මෝහය මුල්ව දුක් ගිනි ඇවිලෙයි සැණෙක

ඇල්ලක ඉමේ සිටිනා මෙනි ඇලීම
ගැට්ටක ඉමේ සිටිනා මෙනි ගැටීම
බිල්ලක තමා මෙදෙකින් සැරී සැරීම
දම් සක දරා සිටියොත් වෙයි නිවීම

තැන හා වුවද තණ්හාවයි කොතැන ලොවේ
මැන ගෙන අල්ලනා ගති හැම සතටම වේ
පණ නල ගියත් තණ්හාවෙන් සසර දිවේ
දැන ගෙන වසොත් මේ මුළු තුන් භවය නිවේ

කාලය ටිකයි මේ මිනිසත් භවට හිමී
බාලය නොවැඩුවොත් ගුණයක් පිනට නැමී
ආලය කළොත් ලොව වෙත ගිනි නොමැත නිමී
සීලය පිහිටියොත් කෙටි වෙයි සසර බැමී


පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන




















# අත්තානං උපමං කත්වා

එක් සතෙකුගේ දිවි තොර කරනට ගන්නා
දක්නට තියෙන කාලය නම් සුළු වෙන්නා
දුක් කඳ ඉන් නැගෙන එනමුදු බල යෙන්නා
මොක් පුර රුවන් දොර ඇරිලත් එල දෙන්නා

පර පණ නැසීමෙන් පසු එන ගිනි කන්ද
තොර කළ නොහැක ගැල සක මෙනි ගොනු බැන්ද
කරනට පෙරදි නොම වී නම් නෙතු අන්ධ
මරණේට සැවොම බිය බව නොපෙනුනෙ මන්ද

උපමා කරනු තම පණ නල පළමු කොට
නොපමා දකිනු පර පණ ගැන දෙවනියට
තොප මා සමග අන් සතුනද මරණයට
කොපමණ බියද තම දිවි තොර කරන විට

කළොත් පාප කම් ලෝ සත සුවය පතා
මළොත් දාහ දුක් කඳ එයි දැඩිව ඔතා
හළොත් කුසල දම් උස් මිටි වෙනස නැතා
බලොත් කරන්නට සෙත යහපතම වෙතා

මරණය අභියසදි පමණක් නොව නොයෙක
දරනට නොහැකි දේ තමනට ඇති විටෙක
පර හට වුවද එය බිය දුක දෙයි ළයෙක
අර ගෙන මෙදම නොම දෙනු අනුනට දුකෙක

මම මුල් කර හැදුන මිස දිටු පෙරට ගෙන
තම වාසිය තකා අනුනට කරන විණ
එම ලෙස දවසකදි තමනට නැවත එන
නොම වෙයි නිමා නොවැටුණහොත් මුනිඳු බණ

ඉපදුන හැමට දිවියේ අයිතියක් ඇත
පෙර වුන අවැඩ කම් එල ලෙස නමුත් එත
නොදකින මෙදම හිතලා කෙලවරක් නැත
පමණින නැණ තමන් තේරුම් ගතොත් සෙත

පාපය වුවත් සුළුවෙන් දුටු තැන අල්ලා
සාපය නැගෙන්නට පෙර කර ගනු මෙල්ලා
කෝපය නොගෙන බිඳ කෙලෙසුන් නම් බිල්ලා
දීපය දල්ව ගනු නිවනම කර එල්ලා

පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන



1010 RS.25.00
HELA BODHU PIYUMA 10

නීතිඥ චන්දන සිරිවර්ධන විසින් සංස්කරණය කර නුගේගොඩ ගංගොඩවිල වනාත පාරේ අංක 96/A දරණ ස්ථානයේ පිහිටි ඉමාෂි මුද්‍රණාලයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී